# මගේ දැක්ම

අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය
බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවරිය ලෙස පළාත් සභා
රැස්වීම්වලදී කරන ලද කථා එකතුවකි.

BKT 0108
25/08/2023

# මගේ දැක්ම

අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය
බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවරිය ලෙස පළාත් සභා
රැස්වීම්වලදී කරන ලද කථා එකතුව

බස්නාහිර පළාතේ පළාත් සභා ලේකම් කාර්යාලයේ ප්‍රකාශනයකි.

2 – H 19760

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# මගේ දැක්ම

*සංස්කරණය*

**තිලක් හපන්ගම**
බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම්
**ඒ. එච්. ගමගේ**
බස්නාහිර පළාත් සභාවේ ලේකම්

**2003.11.02**

*මුද්‍රණය*
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව



# ග්‍රන්ථයෙහි ඇතුළත් කථා පෙළගැස්ම

*පිටු අංකය*

01. මගෙන් වචනයක් ...
අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය පළාත් සභා ක්‍රමය, බස්නාහිර පළාත් සභාව හා මෙම ග්‍රන්ථය පිළිබඳව දක්වන අදහස 05-07

02. බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරිය ලෙස ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය තෙරී පත් වීමෙන් අනතුරුව 1993.07.13 දින කොළඹ 07 විජේරාම මාවතේ සව්සිරිපාය ශ්‍රවණාගාරයේ පැවති පළාත් සභා රැස්වීමට සිය මංගල කථාව පවත්වමින් 09-15

03. 1993.07.29 දින බස්නාහිර පළාත් සභාවට ඉදිරිපත් වූ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හා බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු වූ චන්ද්‍රා ගුණසේකර මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය ප්‍රකාශ කිරීමේ යෝජනාව වෙනුවෙන් පළාත් සභාවට සිය අදහස් දක්වමින් 17

04. 1993.09.09 වැනි දින බස්නාහිර පළාත් සභාවට ඉදිරිපත් වූ යෝජිත කොළඹ - කටුනායක සුපිරි අධිවේගී මාර්ගය ඉදිකිරීමට සම්බන්ධ යෝජනාවක් වෙනුවෙන් සිය අදහස් දක්වමින් 17-21

05. බස්නාහිර පළාතේ පළාත් සභාවේ දෙවැනි පළාත් සභාවේ මංගල අයවැය ලේඛනය වන 1994 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශය 1993 සැප්තැම්බර් 23 වැනි දින පළාත් සභාවට ඉදිරිපත් කරමින් 23-26

06. 1994 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශය පිළිබඳ සාකච්ඡාවේදී 1993.10.12 වැනි දින පළාත් සභා රැස්වීම අමතමින් 27-35

07. 1994 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශය පිළිබඳ විවාදයේදී සිය අමාත්‍යාංශය වූ ප්‍රධාන අමාත්‍ය, නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, අධ්‍යාපන, රැකී රක්ෂා සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ වැය ශීර්ෂ පිළිබඳ විවාදයේ පිළිතුරු කථාව 1993.10.13 දින පවත්වමින් 37-49

08. 1994 වර්ෂයේ මුදල් ප්‍රකාශය සභා සම්මත කිරීම සහ 1994 මුදල් වර්ෂය සඳහා වූ විසර්ජන ප්‍රඥප්තිය සභා සම්මත කිරීම අවස්ථාවේ 1993.10.15 දින සභාව අමතමින් 51-62

09. බස්නාහිර පළාතේ පළාත් සභාවේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු මහින්ද සමරසිංහ මැතිතුමා නගන ලද "93/94 සංවර්ධන සැලැස්ම" පිළිබඳ ප්‍රශ්නයකට අදාළව 1993.11.25 වැනි දින පළාත් සභා රැස්වීමේදී පිළිතුරු දෙමින් 63-66

10. පළාත් සභා මන්ත්‍රී ගරු ලක්ෂ්මන් අබේගුණරත්න මැතිතුමා පළාත් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාවක් සම්බන්ධව 1993.11.25 දින සිය අදහස් දක්වමින් 67-69

11. 1994 ජනවාරි 06 වැනි දින බස්නාහිර පළාත් සභාවට නව යෝජනාවක් ඉදිරිපත් කරමින් ගරු ප්‍රධාන අමාත්‍ය චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය 71-74

12. ඓතිහාසික අත්තනගල්ල පූජා භූමිය සංවර්ධනය කිරීමට අදාළ යෝජනාවක් 1994.01.20 දින බස්නාහිර පළාත් සභා රැස්වීමට ඉදිරිපත් කරමින් 75-76

13. 1994.06.09 දින පළාත් සභා රැස්වීම අමතමින් 77-78

## මගෙන් වචනයක් .........

ගෙවුණු සියවස ආරම්භයේ පටන්ම ශ්‍රී ලංකාවේ පරිපාලන ක්‍රියාවලිය තුළ කිසියම් වෙනසක් සිදු විය යුතු බවට අදහසක් පැන නැඟී තිබුණි. ඒ සම්බන්ධ පැහැදිලි හා ඉතා නිරවුල් අදහසක් මුල්වරට ඉදිරිපත් කරනු ලැබුවේ මගේ පියා වූ එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමා විසිනි.

1926 ජූලි 17 වැනි දින පළ වූ The Ceylon Morning Leader පුවත්පතින් මධ්‍යම ආණ්ඩුව මගින් පාලනය කරන රටක පවතින පාලනයේ දුර්වලතාවයන් ගෙන හැර දැක්වූ එතුමා, බහුවාර්ගික ප්‍රශ්ණයක් පවතින රටක උද්ගත වන්නා වූ බහුවිධ කරුණු නිරාකරණය කිරීම සඳහා යොදාගත හැකි සුදුසුම විකල්පය එබඳු පරිපාලන තන්ත්‍රයක පැවැත්ම බව දැක්විය.

මෙකී අදහස්වලට සමගාමී වූ යෝජනා 04ක් ම 1947 වන විට ඉදිරිපත් වූ යෝජනා වල නැවත නැවතත් සඳහන්ව තිබුණි. ඒ යටතේ 1926 වර්ෂයේදී පළාත් පාලනය සඳහා පත් කළ තේරීම් කමිටුවද, 1927 දී ඩොනමෝර් කමිටුවද, 1940 දී පළාත් පරිපාලනය පිළිබඳ විධායක කමිටුවද, 1947 වර්ෂයේදී එවකට පළාත් පාලන අමාත්‍යවරයා ලෙස කටයුතු කළ එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමා නැවත වරක් ඉදිරිපත් කළ අදහස් ද දැක්විය හැක.

මෙකී සියලු අවස්ථාවල ප්‍රධාන වශයෙන්ම රටේ පරිපාලන ක්‍රියාවලිය ක්‍රමානුකූල ආකාරයකින් පවත්වාගෙන යමින් බලතල විමධ්‍යගත කිරීම සඳහා යොදාගත හැකි ක්‍රියා මාර්ගයන් පිළිබඳ සළකා බැලීමක් මෙම යෝජනා මගින් සිදු කර තිබුණි.

1948 ශ්‍රී ලංකාව නිදහස ලබා ගැනීමෙන් පසු පළාත් හෝ රට සභාවන් පිහිටුවීම පිළිබඳ අදහස් හා යෝජනා කීපයක්ම ඉදිරිපත් විය. ඒ අතරින් 1957 දී ඉදිරිපත් වූ බණ්ඩාරනායක චෙල්වනායගම් ගිවිසුම ප්‍රධාන තැනක් ගනී. මේ මගින් රට සභා ක්‍රමය යෝජනා කළද මෙකී

යෝජනාවලියට බහුතර ජනතාවගේ කැමැත්ත ලබා ගැනීම දුෂ්කර විය. ඒ අනුව බණ්ඩාරනායක චෙල්වනායගම් ගිවිසුම බිඳ වැටුනද, රට සභා හෝ දිස්ත්‍රික් සභා යටතේ ප්‍රාදේශීයව ස්වාධීනත්වය ලබා ගැනීම පිළිබඳ සාකච්ඡාවන් අවසන් නොවිණි.

වාර්ගික අර්බුදයට විසඳුමක් ලෙස නැවත නැවතත් බලතල බෙදා හැරීමේ ක්‍රම පිළිබඳ අදහස් හා යෝජනා නිරන්තරයෙන් මතු විය. නිදර්ශනයක් ලෙස 1965 මාර්තු මස ඩඩ්ලි සේනානායක මහතා සහ එස්. ජේ. වී. චෙල්වනායගම් මහතා අතර ඇතිවූ ගිවිසුමක් මගින් ද්‍රවිඩ භාෂාව කථා කරන ජනතාවට බලපාන සමහර ප්‍රශ්නවලට අදාළ කරුණු ගණනාවක් යටතේ කටයුතු කිරීමට එකඟතාවකට පැමිණීම දැක්විය හැකිය.

කෙසේ වුවද 1957 සහ 1969 අතර කාල පරිච්ඡේදයේදී යෝජනා සම්මුති ආශ්‍රයෙන් රට සභා හෝ දිස්ත්‍රික් සභා පිහිටුවීමටත්, ඒ හරහා බලතල බෙදීමේ ක්‍රියාදාමයන් දියත් කිරීමටත් ගන්නා ලද සියලු ප්‍රයත්නයන් ව්‍යර්ථ විය.

1970 දශකයේ අග භාගයේදී බලය විමධ්‍යගත කිරීම පිළිබඳ පුළුල් සංවාදයක් යළි ආරම්භ වූ අතර, ඒ අනුව 1980 අංක 35 දරන පනත මගින් සංවර්ධන සභා ක්‍රමය හඳුන්වා දී ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකම එක සංවර්ධන සභාව බැගින් සංවර්ධන සභා පිහිටුවන ලදී.

එහෙත් 1987 වන විට මෙම සංවර්ධන සභා පිහිටුවීමේ මූලික අරමුණ ඉටු නොවන බව එය පිහිටුවීමට ක්‍රියා කළ පුද්ගලයන්ටම අවබෝධ විය. අනතුරුව එළඹියේ ශ්‍රී ලංකාවේ බලතල බෙදීමේ ක්‍රියාදාමයේ ඉතා තීරණාත්මක කාල පරිච්ඡේදයක් වූ 1987 වර්ෂයයි. මෙම වකවානුව වන විට සියලු ශ්‍රී ලාංකිකයන් වාර්ගික අර්බුදය හමුවේ දැඩි පීඩනයකට පත්ව සිටි හෙයින්ද, ජනතාවගේ හද ගැස්ම, සිතුම් පැතුම් ඉතා හොඳින් හඳුනාගෙන සිටි මා පෙර සඳහන් කළ බලය බෙදා හැරීමේ ක්‍රියා දාමයන් පිළිබඳවද නිසි අවබෝධයක් ලබා සිටි නිසා වාර්ගික අර්බුදය නිමා කිරීම අරඹයා ඉදිරිපත් වූ පළාත් සභා ක්‍රියාදාමයට පූර්ණ සහයෝගය ලබා දෙන ලදී.

බොහෝ අඩුපාඩු පැවතියද, පළාත් සභා ක්‍රමය ශ්‍රී ලංකාවේ ඉදිරි බලතල විමධ්‍යගත කිරීමේ වැඩ පිළිවෙලක් සඳහා කටයුතු කිරීමට ඉතා හොඳ පදනමක් වූ බව වර්තමානය වන විට සියලු දෙනාගේම අදහස වී ඇත. විශේෂයෙන්ම බලය බෙදීම සම්බන්ධව පොදු මහජනතාව තුළ පැවති අනිසි බිය මේ වන විට පහව ගොස් ඇත. එය පළාත් සභා ක්‍රමය ලද සුවිශාල වූ ජයග්‍රහණයක් මෙන්ම, ශ්‍රී ලංකාවේ බලය බෙදා හැරීමේ ක්‍රියාවලිය ඉදිරියටත් ක්‍රියාත්මක කිරීමට මහඟු පිටුබලයක් වේ.

වර්තමානය වන විට පළාත් සභා පිහිටුවා වසර 15ක් තරම් දීර්ඝ කාල පරිච්ඡේදයක් ගෙවී හමාරය. මෙම වකවානුව තුළ පළාත් සභාවක ප්‍රධාන අමාත්‍යවරිය ලෙස කටයුතු කරමින් සුවිශාල වූ අත් දැකීම් සමුදායක් ලබා ගැනීමට පෞද්ගලිකවම මට හැකියාවක් ලැබීම මා ලද භාග්‍යයක් ලෙස සලකමි. එමෙන්ම පළාත් සභා ක්‍රියාදාමයේ ප්‍රගමනය උදෙසා යමක් කිරීමට මටද අවස්ථාව ලැබුණායි අද දිනයේ මට අවංකවම සතුටු විය හැකිය. එම ගමනේ එක්තරා සිහිවටනයක් ලෙස මෙම ග්‍රන්ථය මම දකිමි.

බොහෝ දුෂ්කරතා, අපහසුතා, මැද අප පළාත් සභා ක්‍රියාදාමය තුළින් ජනතාව වෙනුවෙන් යමක් කිරීමට දැරූ උත්සාහය මෙම ග්‍රන්ථය මගින් නිරූපණය වනු ඇත. පළාත් සභා ක්‍රමය ගැන කරුණු සෙවීමට උනන්දුවන්නන්ට, වර්තමානයේ පළාත් සභා සමඟ සම්බන්ධව සිටින්නන්ට මෙන්ම අනාගතයේදී පළාත් සභා සමඟ කටයුතු කිරීමට බලාපොරොත්තුවන්නන්ටද මෙම ග්‍රන්ථයෙන් යම්කිසි ප්‍රයෝජනයක් ලබා ගැනීමට හැකියාව ලැබේවායි මගේ ප්‍රාර්ථනයයි.

**චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග,**
බස්නාහිර පළාතේ හිටපු ප්‍රධාන අමාත්‍ය හා
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිනි.

**බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරිය ලෙස ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය තේරී පත්වීමෙන් අනතුරුව 1993.07.13 දින කොළඹ 07 විජේරාම මාවතේ සව්සිරිපාය ශ්‍රවණාගාරයේ පැවති පළාත් සභා රැස්වීමට සිය මංගල කථාව පවත්වමින්. . .**

ගරු සභාපතිතුමනි, අති විශාල ජන වරමක් ලබා දෙමින් මා මෙතැනට පත් කරන ලද අපේ ගම් ප්‍රදේශය වන අත්තනගල්ලේ සහ ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවට පළමුව මගේ අවංක ස්තූතිය පුද කළ යුතුව තියෙනවා. මගේ ගෞරවාචාරය ඒ ජනතාවට පුද කරනවා. බස්නාහිර පළාතේ දෙවැනි පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය, විවාදයට ලක් කරන අවස්ථාවේදී, විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් ප්‍රධාන වශයෙන් ඉදිරිපත් කරන ලද අදහස් හා විවේචන කිහිපයක් තිබෙනවා. ඒවා ගැන කථා කරන්නට පෙර මා සඳහන් කරන්නට කැමැතියි, මේ පළාත් සභාවේ පාලනය අපි භාර ගත්ත මේ අවස්ථාවේදී පළාත් සභාව තුළින් අපි ඉටු කරන්නට බලාපොරොත්තු වෙන්නේ කුමක්ද කියා කෙටියෙන් සඳහන් කරන්න ඕනෑ. අපි පළමුවෙන්ම මෙම පළාත් සභා පාලනය භාර ගත්තේ අවුරුදු 16ක් තිස්සේ, මේ රට පාලනය කරන රජයක් බලයේ සිටින අවස්ථාවකයි. මේ රජයට, පළමුවැනි වතාවට පළාත් සභාවේ අවුරුදු පහක ජීවිත කාලය තුළ, වෙනත් දේශපාලන දර්ශන, අදහස් තිබෙන පක්ෂ කිහිපයක් එකතුව බලයට පත් වී තිබෙන අවස්ථාවකට මුහුණ දෙන්න සිදු වී තිබෙනවා. අපි හොඳින් දන්නවා මේ තුළින් ඇති වෙන්නට පුළුවන් ප්‍රශ්න මොනවාද කියලා. ඒ වාගේම අපි පැහැදිලිව වටහා ගෙන තිබෙනවා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක් හැටියට, ප්‍රජාතන්ත්‍රවාදය අවංකව ක්‍රියාත්මක කරවන ගරු කටයුතු පුද්ගලයන් හැටියට මෙවැනි විවෘත තත්ත්වයක් යටතේ බලය බෙදා හැරීමේ පාලන ක්‍රමයක් ක්‍රියාත්මක විය යුත්තේ කෙසේද කියලා. එය එසේ වෙයිද නැද්ද කියන එක අප සතුව නැහැ. අන්තිම තීන්දුව, මධ්‍යම රජය අතේ තියෙන්නේ. අපි එයත් හොඳින් දන්නවා. ගරු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් සඳහන් කළා වාගේ, මේ පළාත් සභා ක්‍රමය බිහි කරනු ලැබුවේ රටේ පාලන බලය ඉතාමත් ශක්තිමත් ලෙස එක්තැන් කරගෙන මේ රටේ පළමුවැනි

වතාවට ඒක පුද්ගල පාලනයක් ස්ථාපිත කරපු රජයක් විසින්. ඒ නිසා ගරු විපක්ෂ නායකතුමා ඉතා ඕනෑකමින් ඉදිරිපත් කෙරුවා පළාත් සභා ක්‍රමය නියමානුකූලව ක්‍රියාත්මක විය යුතු නම් ඉදිරියේදී අපි එකට කටයුතු කළ යුතුයි කියලා. ඒ ගැන මම එතුමාටත් අවංකව ස්තූතිවන්ත වෙනවා. ඒ අනුව අපි බලාපොරොත්තු වෙනවා, විපක්ෂයේත් සහයෝගය ඇතිව ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන්නට. නමුත් අපි මෙතුමන්ලාගේ පක්ෂයේ නොවන නිසා, අපි පැහැදිලිව වටහා ගෙන තියෙනවා, මේ පළාත් සභා ක්‍රමය බිහි කළේ, ඇත්ත වශයෙන්ම බලය විමධ්‍යගත කිරීම පිළිබඳ කිසිදු විශ්වාසයක් පෙන්නුම් නොකළ රජයක් විසින් බව. නමුත් මෙම ක්‍රමය හඳුන්වා දුන්නේ වෙනත් ප්‍රශ්නයකට විසඳුමක් හැටියටයි. අපි මෙතන ඉතිහාසය කියන්න බලාපොරොත්තු වෙන්නේත් නැහැ. අවශ්‍ය වෙන්නේත් නැහැ. විසඳුමක් හැටියට ලහි ලහියේ සකස් කරන ලද පළාත් සභා ක්‍රමයක් හිටි අඩියේම 1987 වර්ෂයේදී බිහි වුණා. ඒ නිසා රටේ මේ පළාත් සභා ක්‍රමය තුළ, පවත්නා නීතිරීති තුළ නොයෙකුත් අඩුපාඩුකම් තියෙනවා. නමුත් මා හිතන හැටියට මෙයට ස්ථිර පිළිතුරක් කෙටියෙන් දිය යුතුයි. මගේ පක්ෂය පළාත් සභා පනත පනවපු වෙලාවේ ඊට විරුද්ධ වුණා. විරුද්ධ වුණේ පලාත් සභා පනතට පමණක් නොවෙයි. විරුද්ධ වුණේ ඉන්දු ලංකා ගිවිසුමට. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විරුද්ධ වුණේ, වෙන කිසි ප්‍රශ්නයක් නිසා නොවෙයි. ඒ ගිවිසුම ජනතාව සමඟ සාකච්ඡා නොකර, නියෝජිතයින් සමඟ සාකච්ඡා නොකර හිටපු ගමන්ම අහසින් ගෙනැල්ලා, පැරවුට් කරපු ආකාරයට ඒ ගිවිසුමේ කොටසක් හැටියට පළාත් සභා පනතත් ඉදිරිපත් වුණා. ඒ සඳහා අනුගමනය කරන ලද ප්‍රතිපත්තිය උඩ ඒ ක්‍රියාමාර්ගයට අපට විරුද්ධ වෙන්න සිදු වුණා. නමුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නිර්මාතෘවරයා, මේ නවීන ලංකාවේ, පලාත් පාලන ක්‍රමය තුළ බලය විමධ්‍යගත කිරීමත්, බලය බෙදා හැරීමත් මූලික වශයෙන් ආරම්භ කරපු පුද්ගලයා බව අපි මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමැතියි. ගම් සභා ක්‍රමය ආරම්භ කළේ අපේ පක්ෂයේ නිර්මාතෘ බණ්ඩාරනායක ශ්‍රීමතාණන්. මොන පක්ෂය වුණත් ප්‍රශ්නයක් නැහැ ඒ ක්‍රමය එතුමාගේ නිර්මාණයක්. මෙතුමන්ලාගේ පැත්තේ ඉන්න අයත් මේ පැත්තේ අයත් වරින්වර දෙපැත්තේම ඉඳලා තිබෙනවා. කෙසේ වෙතත් වර්ෂ 1956න් පසු පිලිප් ගුණවර්ධන මැතිතුමාගේ නායකත්වයෙන් ඒ ක්‍රමය ගොවි කාරක සභා ක්‍රමය තුළින් ගොවි ජනතාව අතරට ගෙනිච්චා. පාලන තන්ත්‍රය ප්‍රජාතන්ත්‍රකරණ දර්ශණය අපේ පක්ෂය බිහි වුණදා සිටම තිබුණා. හේතුව පැත්තක

තිබියදී, ඒ කියන්නේ උතුරු නැගෙනහිර ප්‍රශ්නය සඳහා ගෙනාපු පළාත් සභා ක්‍රමයෙන් ඊට කිසිදු විසඳුමක් ලබා දී නැති වුණත්, ශ්‍රී ලංකාවේ ඉතිරි පළාත් හතක පළාත් සභා ක්‍රමය පසුගිය අවුරුදු පහ ඇතුළත, මා හිතන හැටියට සෑහෙන සාර්ථකත්වයක් ඇතුව පොදුවේ ක්‍රියාත්මක වුණා. නමුත් අඩුපාඩුකම් රාශියක් තිබෙනවා. මා මීට පෙර ඒ පිළිබඳව කෙටියෙන් සඳහන් කළා. ඒ නිසා වගකීමක් ඇතුව කටයුතු කරන පක්ෂයක් හැටියට, බුද්ධිමත් පක්ෂයක් හැටියට, අපේ පක්ෂය විසින් හැමදාම පිළිගත් ඒ බලය බෙදා හැරීමේ ක්‍රමය අනුව, ඒ දර්ශනය අනුව, පළාත් සභා ක්‍රමය යම් සංශෝධන ඇතුව මේ රටේ ජනතාවට බලය බෙදාහැරීමට විසඳුමක් හැටියට අපි පිළිඅරගෙන තිබෙනවා. (බාධා කිරීමක්) මේ රජය තුළ යුද්ධය පවත්වාගෙන යෑම සඳහා අවි ආයුධ ගෙන්නල කොමිස් ගන්න අය නැති වුණු දවසට යුද්ධයත් නැති වේවි. ඒ ගැන පස්සේ කථා කරමු. ඒ නිසා මා හිතන්නේ නැහැ ඒ ප්‍රශ්නය ගැන මෙතුමන්ලා නැවත වතාවක් අපෙන් අහන්නට අවශ්‍ය වෙයි කියලා.

ඊළඟට අපේ ප්‍රතිපත්ති ප්‍රකාශය. මේ ප්‍රතිපත්ති ප්‍රකාශය ගැන විපක්ෂයෙන් මීට පෙර අදහස් රාශියක් ඉදිරිපත් වුණා. ඒ වාගේම අපේ මන්ත්‍රීවරුන්ගෙනුත් අපේ මන්ත්‍රීවරුන්ගෙනුත් ඒ විධියට අදහස් ඉදිරිපත් වුණු විස්තර ගැන කතා කරන්නේ නැතුව ප්‍රධාන වශයෙන් ඒ සියලු දෙය ගොනු කරලා, කථා කළොත්, ඉංග්‍රීසි සහ සිංහල පරිවර්තන දෙක අතර තිබෙන පරස්පර විරෝධතාවයන් පෙන්නුම් කළා. අපි නිහතමානීව ඒ ඉංග්‍රීසි පරිවර්තනයේ තිබෙන සදොස් තැන් පිළිගන්නවා. නමුත් සිංහල රාජ්‍ය භාෂාව තුළින් කරන ලද ප්‍රකාශනයයි බලාත්මක වන්නේ. අපට ප්‍රතිපත්ති ප්‍රකාශනය කරන්නට තිබුණු වේලාව ඉතාම සුළුයි. අපට තව මාස ගණනක් ගන්නට තිබුණා. නමුත් විපක්ෂයේ මන්ත්‍රීවරුන් මගෙන් ඉල්ලා සිටියා ඇත්ත වශයෙන්ම විපක්ෂ නායකතුමාත් එක දවසක් හිටි ගමන් ටෙලිෆෝන් කරලා ඇහුවා ඇයි මේ කටයුතු ප්‍රමාද වෙන්නේ කියලා. ඒවා ඉක්මනට කරන්න තිබුණ වුවමනාව නිසා - පරිවර්තන දෝෂ තිබෙන බව මමත් පිළිගන්නවා. නමුත් පොදුවේ ඉංග්‍රීසියෙන් ප්‍රකාශ වන කරුණ සිංහල පිටපතේ අදහසට පරස්පර විරෝධී වෙන්නේ නැහැ. සමහර තැන්වල මුද්‍රණ දෝෂ තිබෙනවා. නමුත් එය කියවන කොට හිතා මතා අසත්‍යය ප්‍රකාශනයක් වාගේ ප්‍රකාශන දෙකක් ඉදිරිපත් කරන්නවත් කිසිම අදහසක් තිබුණු බවක් පෙනෙන්නේ නැහැ. සිහි බුද්ධියෙන් කියැවුවොත්

එය කාට වුණත් වැටහෙනවා. කිසිතැනක කිසිම අදහසක් වෙනස් කරන්නට කිසිම උත්සහයක් තිබිලා නැහැ. ඒ අනුව අපි ඉංග්‍රීසි පරිවර්තනයෙන් හෝ දෙමළ පරිවර්තනයෙන් මෙම සභාවවත් ගරු මන්ත්‍රීවරුන්වත් නොමග යවන්නට කිසිම උත්සාහයක් දරලා නැහැ. නොමග යැවීමේ ප්‍රයත්න අප තුළවත් අපේ පක්ෂයේවත් නැහැ. අපි මේ පළාත් සභාවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කළේ, ලස්සන වචන මාලාවක් ඉදිරිපත් කරන්න නොවෙයි. තමුන්නාන්සේලා විසින් 1993 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශනය මෙතැන තිබෙනවා. එකිනෙක සංසංදනය කරන්නට, මට වෙලාවක් නැතිවීම ගැන මම කනගාටු වෙනවා. කාටවත් දෝෂාරෝපණයක් කරන්න නොවෙයි මම මේ හදන්නේ. මෙතුමන්ලා කරුණු ඉදිරිපත් කරපු කරුණුවලට පිළිතුරු දෙන්න හදන්නේ. නමුත් පොදුවේ ඒ ගැන බැලුවොත් විශේෂයෙන් ඒ ගැන කියන්න තියෙන්නේ පොදු අදහස්. ලස්සන වචන මාලාවක්. හොඳට ඉදිරිපත් කරලා තිබෙනවා. නමුත් හුඟක් දේවල් කොහෙත්ම ඇත්ත නොවෙයි. මම එක උදාහරණයක් විතරක් ගන්නවා. අපි හරය දිහා බැලුවොත්, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ එකිනෙක විස්තරාත්මකව අපි කරන්නට බලාපොරොත්තු වන දේවල් ප්‍රතිපත්ති ප්‍රකාශයක් කරන්නට පුළුවන් සීමාව තුළ අපි ඉදිරිපත් කරලා තියෙනවා. උදාහරණයක් වශයෙන් 1993 වර්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පළමු වැනි පිටුවේ තියෙනවා, පරිපාලනය ජනතාවගේ දොරකඩට ගෙන යනවා කියලා. නමුත් මම කියන්නේ, පසුගිය පළාත් සභාවේ වර්ෂ 05 ඇතුළත පොදුවේ මධ්‍යම රජයේ ප්‍රතිපත්තියක් හැටියට පමණක් නොව, පරිපාලනය, පළාත් පාලනය ජනතාවගේ දොරකඩට ගෙන යනවා අපි තවම දැකලා නැති බවයි. දෙවැනි පිටුවේ තිබෙන නීතිය හා සාමය ගැන ඇති විස්තර කියවන කොට නම් මට හිනා යනවා. නීතිය හා සාමය දැන් ස්ථාවර තත්ත්වයකට පත් වී ඇත. අපෙන් අහන්න ඕනෑ ගරු සභාපතිතුමනි ඒක ස්ථාවර වෙලා තිබෙන්නේ කොහොමද කියලා. බස්නාහිර පළාතේ මගේ ගම් ප්‍රදේශය වන ගම්පහ දිස්ත්‍රික්කයේ පමණක් සතියෙන් සතිය කිසිම හේතුවක් නැතිව, අපේ පාක්ෂිකයන්ව පොලිසිවලට අල්ලාගෙන යන කොට කොහොමද නීතිය ස්ථාවර වුණා කියලා කියන්නේ. දිනෙන් දින උස්සාගෙන ගිහිල්ලා අතුරුදහන් කරන කොට, දේශපාලන නායකයින් නිකරුණේ මරා දමන කොට, මේ මැතිවරණයේදී අත්තනගල්ල ආසනයේ මට වැඩ කරපු අයත් තවමත් නිට්ටඹුව පොලිසියේ අත්අඩංගුවට ගන්න කොට, නීතිය සහ සාමය ස්ථාවර වුණා කියලා

කිසිම හේතුවක් නැතිව කියන්න බැහැ. ඒ නිසා ඒ වාගේ ලස්සන දේවල් කියන්නට නොවෙයි අපි උත්සාහ කළේ. ඇත්ත වශයෙන් අපි අවංකව ඉදිරි වර්ෂ කීපය ඇතුළත අපේ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන්, ඒ ජනතාවට අපට ලබා දුන්න වරම අනුව, අපි ඉටු කරන්නට බලාපොරොත්තු වන දේ කියන්නටයි අපි උත්සාහ කළේ. හරය මිසක් එළය ඉදිරිපත් කරන ආකාරය ගැන අපි එතරම් උනන්දු නොවුණු එක අපි පිළිගන්නවා. නමුත් ඒ නිසාම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කිසිම අඩුවක් තිබෙන බව අපි පිළිගන්නේ නැහැ.

අපි බස්නාහිර පළාතේ මේ බලය භාර ගන්නවිට මේ මැතිවරණ සමයේදී එතුමන්ලාගේ නායකතුමාගේ මිනී මැරුම් ගැන. ඝාතනය ගැන. ඇත්ත වශයෙන්ම අපි මේ මැතිවරණයේදී සිතුවේ අපි හුඟ දෙනෙක්ගේ ජීවිත මැයි 17 වෙනිදා ඡන්දය පෙට්ටියට දමනකම් ඉතිරි වෙයිද නැද්ද කියලයි. අපේ ඡන්දදායකයින් ඡන්ද කටයුතු කළේ තමන්ව උස්සයි ද නැද්ද දන්නේ නැතුව. අවුරුදු 16ක් තිස්සේ මේ රටේ පැවතුණු ප්‍රජාතන්ත්‍රවාදයේ මූලය හරය වන, ප්‍රජාතන්ත්‍රවාදයේ කොඳු නාරටිය වන මැතිවරණය මේ රටේ අවුරුදු 16ක් තිස්සේ හැම විටම පැවතුනේ මහා භීෂණයක් තුළ. අපේ මැතිවරණ කවදාවත් අපි භීෂණකාරී ලෙස කළේ නැහැ. කවදාවත් කළේ නැහැ. (සභාවේ ඝෝෂා) මෙතුමන්ලා හැමදාම බොරුවනේ කරන්නේ. පෞද්ගලික හේතූන් උඩ කවදාවත් මම මැතිවරණයකට ගියේ නැහැ. අත්තනගල්ලේ සත්‍යග්‍රහය වාගේ නොවෙයි, අත්තනගල්ලේ වවුල්කැලේ මිනීමැරුම්. කළුගෙඩි ලාම්පු සෙල්ලම කළේ ? මේ රටේ සියලුම ඒ මැතිවරණ කළේ, පසුගිය අවුරුදු 16 ඇතුළතයි. මේ සියලු දෙනාව මරනවා කියන ප්‍රතිපත්තිය මත, මේ රටේ ජනතාව ජීවිත පරදුවට තියලා අපට ඡන්දේ දැම්මේ නැත්නම් කොහොමට හිටීවිද ? බස්නාහිර පළාතේ ගරු විපක්ෂ නායකතුමා ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන කෙනෙක්. එතුමාගේත් තමුන්නාන්සේලා සියලු දෙනාගේත් සහයෝගය ඇතුව අඩු තරමින් මේ රටේ ජනතාවට අපට කොන්ද කෙළින් කරගෙන භයෙන් සැකෙන් තොරව මිනිසුන් හැටියට මේ තිරිසන් යුගය අභිබවා ගිහිල්ලා ජීවත් වෙන්නට පුළුවන් තත්ත්වයක් බස්නාහිර පළාතේ අපි ඇති කරන්න බලාපොරොත්තු වෙනවා. අන්න ඒ නිසා මා අවංකව ස්තූති කරනවා, විපක්ෂ නායකතුමාට. බස්නාහිර පළාතට ලැබිය යුතු පොලිස් බලතල තමුන්නාන්සේලා අපි එකට එකතුව ලබාගෙන ඒ පොලීසිය ප්‍රජාතන්ත්‍රවාදී කරමු. පොලීසිය නිසා අපේ ජනතාවගේ ජීවිත දවසින්

ද්‍රව්‍ය විනාශ වෙනවා. ඒ අනුව ජනතාවට තමන්ගේ ජීවිත පරදුවට තබා ජීවත් වෙන්නට ඉඩ තියන්නේ නැතුව නැවත වතාවක් ප්‍රජාතන්ත්‍රවාදී රටක ජීවත් වෙන්නට පුළුවන් වන පරිදි පොලිසිය පත් කරමු.

ඒ වාගේම අපේ පළාත් සභාව සතුව තිබෙන පාලන තන්ත්‍රයට සීමිත බලතල තිබුණා වුණත්, ඒ පාලන තන්ත්‍රයේ නිලධාරින්, බස්නාහිර පළාතේ පමණක් නොවෙයි මුළු රටේම නිලධාරී මහත්වරු පසුගිය කාලයේදී ජීවත් වුණේ රජය ඉදිරියේ විශාල භයකින්. රජය සහ පාලන තන්ත්‍රය භාරව ඉන්න දේශපාලඥයින් කියන දේවල්වලට එහෙමයි හාමුදුරුවනේ කියා ගෙන දණින් වැටිලා කොන්ද නමාගෙන හිටියෙ නැත්නම් කිසිම නිලධාරියෙකුට හිතට එකඟව කටයුතු කරන්න පුළුවන්කම තිබුණෙ නැහැ. ඒ තත්ත්වය බස්නාහිර පළාතේ අපි යටතේ තියෙන සියලුම අමාත්‍යාංශවලින් අපි ඉවත් කරන බව මේ සභාවට ගෞරව පූර්වකව මතක් කරනවා. ඊට වැඩිය ඒ ගැන මට කථා කරන්න වෙලාවක් නැහැ. ගරු මන්ත්‍රීවරු විටින් විට ඉදිරිපත් කරපු අදහස් ගැන එකිනෙක කථා කරන්න වෙලාවක් නැහැ. ඒ නිසා මම සමාව ඉල්ලා සිටිනවා. එක උදාහරණයක් පමණක් කියනවා. එක්තරා මන්ත්‍රීවරයෙක් කීවා මම හිතන්නේ මහින්ද සමරසිංහ ගරු මන්ත්‍රීතුමා, හරියට මතක නැහැ එතුමාද කියලා. උදාහරණයක් වශයෙන් මේ ප්‍රකාශනයේ තිබුණ අඩුපාඩුකම් නගර සැළසුම් සහ පරිසරය වැනි දේවල් ප්‍රකාශ කරලා නැහැ කියලා. ඇත්ත වශයෙන්ම එකිනෙක ප්‍රකාශ නොකෙරුවත් අනිකුත් දේවල ඒවා ගැබ් වෙලා තියෙනවා. 1993 වර්ෂයේ මෙතුමන්ලාගේ ප්‍රකාශනයෙන් නගර සැළසුම් ගැන එක වචනයක්වත් නැහැ. අපේ ප්‍රකාශයේ තියෙන කරුණු මම ලකුණු කරගත්තා. ඒ ගැන කථා කරන්න වෙලාවක් නැහැ. අපි ඒවා නිවැරදි කරගන්න ඕනෑ. අපේ ප්‍රකාශනයේ යම් තැන්වල ගැබ්වෙලා තියෙනවා. උදාහරණයක් වශයෙන් ක්‍රිස්ටි පෙරේරා මන්ත්‍රීතුමා කීවා, ජලය සහ විදුලිය ගැන මුකුත් කියවිලා නැහැයි කියලා. ජලය සහ විදුලිය ගැන පළාත් බද නිවාස කටයුතු කියන ඡේදය යටතේ, දෙවැනි ඡේදයේත් පළාත් පාලනය කියන ප්‍රධාන ඡේදය යටතේ හයවැනි ඡේදයේත් සඳහන්ව තියෙනවා. නැවත වතාවක් සෞඛ්‍ය කියන ඡේදයේත් ප්‍රධාන මාතෘකාව වී තිබෙනවා. තුන්වෙනි ඡේදයෙත් තියෙනවා. ඒ ඒ අංශවලට ජලය සහ විදුලිය සැපයීම පිළිබඳව. මේ වාගේ සියලු අදහස්වලට පිළිතුරු දෙන්න මට වෙලාවක් නැහැ.

ඒ නිසා අන්තිම වශයෙන් ගරු විපක්ෂ නායකතුමා කරපු පෞද්ගලික ඉල්ලීම ගැන මා ස්තුතිවන්ත වෙනවා. තැනින් තැන ගිහිල්ලා විවේචනය කරනවාට වැඩිය ගරු මන්ත්‍රීවරුන් සභාව තුළදී කියන එක ගැන මම සතුටු වෙනවා. මන්ත්‍රීවරුන්ට හමු වෙන්නට වෙලාවක් නැහැයි කියන කොට මට ඇහුණා එක්තරා මන්ත්‍රීවරියක් කිවා හිටවලා තියනවා කියලා. ගරු මන්ත්‍රීවරුන්ට මම ආරාධනා කරනවා, අපි එකට ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කරන්න බලාපොරොත්තු වන නිසා සතියේ දවස් තුනක් ජනතාව හමුවෙන්න මම වෙන් කරලා තියෙනවා. බදාදා, සිකුරාදා, ඉරිදා. බදාදා සහ ඉරිදා කාර්යාලයේදී නොවෙයි. සිකුරාදා සහ බදාදා ඇතුළු ඕනෑම දවසක මන්ත්‍රීවරුන්ට ඕනෑම වෙලාවක පැමිණෙන්නට කියලා අපි වාචිකව සහ ලිඛිතව දැනුම් දීලා තියෙනවා. ඒක තමුන්නාන්සේලාට දැනුම් දුන්නේ නැත්නම් මම සමාව ඉල්ලා සිටිනවා. මන්ත්‍රීවරුන් ආවාම සමහර වෙලාවට ඇතුළේ ප්‍රධාන සාකච්ඡාවක් තියෙනවා නම් විනාඩි 5ක් 10ක් ඉන්න වෙනවා. හැබැයි එළියේ ඉන්න වෙන්නේ නැහැ. ඇතුළට ඇවිල්ලා ඉඳගෙන ඉන්න. නමුත් ප්‍රජාතන්ත්‍රවාදීව අපි එකට කටයුතු කරන නිසා, ගරු මන්ත්‍රීවරුන්ගෙන් අපි ඉල්ලා සිටිනවා, මේ යෝජනාව කරන්න කියලා. විශේෂයෙන් මා පළාත් සභාවේ කටයුතු භාර ගත්තාට පස්සේ දවසකට මන්ත්‍රීවරුන්, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරුන්, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් ඇතුළුව පොදු ජනතාව 200ක් 300ක් අතර ගණනක් එනවා. අපේ පාක්ෂිකයන් විතරක් නොවෙයි. මෙතුමන්ලාගේ පාක්ෂිකයිනුත් එනවා, උදව් ඉල්ලලා. අපි ඒකට බොහොම සන්තෝෂයි. ඉස්සර එහෙම තිබුණෙ නැහැ. 200ක්, 300ක් අය දවසට ආවේ නැහැ. (සභාවේ ඝෝෂාව) උදව් කිරීම ගැන නොවෙයි මම කථා කරන්නේ. පැමිණෙන සංඛ්‍යාව ගැන කතා කරන්නේ. 200ක්, 300ක් පැමිණුනේ නැහැ. ඒ 200, 300 වාඩි කරවන්න පුටු තියන්න මගේ සල්ලිවලින් හරි ගෙදරින් හරි ගේන්නම්. දැන් පුටු තියන්න තරම් ඉඩක් අපේ පළාත් සභා කාර්යාලයේ නැහැ. ගරු මන්ත්‍රීතුමියගෙන් අපි ඉල්ලා සිටිනවා, ඇවිල්ලා සොයලා පෙන්වන්න කියලා. තියන පුටු ප්‍රමාණය ඉන්න අයට ඉඳගන්න වෙනවා, අනිත් අයට හිටගන්න වෙනවා. ඒකයි ඇතිවෙලා තියෙන තත්ත්වය. සභාපතිතුමනි, තමුන්නාන්සේ මට ලබා දුන්න වෙලාව ගැන ඔබතුමාට මගේ අවංක ස්තුතිය පුද කරමින් මගේ කථාව අවසන් කරනවා.

## 1993.07.29 වැනි දින බස්නාහිර පළාත් සභාවට ඉදිරිපත් වූ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හා බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු වූ චන්ද්‍රා ගුණසේකර මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය ප්‍රකාශ කිරීමේ යෝජනාව වෙනුවෙන් පළාත් සභාවට සිය අදහස් දක්වමින්. . . . .

ගරු සභාපතිතුමනි, චන්ද්‍රා ගුණසේකර මැතිතුමා පිළිබඳව මේ සභාවේ ආණ්ඩු පක්ෂයෙනුත්, විපක්ෂයෙනුත් ඉදිරිපත් කරන ලද අදහස් හා ප්‍රශංසාවන් මා අනුමත කරන අතර, දේශපාලන වශයෙනුත් පෞද්ගලිකවත් එතුමා සමඟ මාගේ තිබුණු දීර්ඝකාලීන සම්බන්ධය මත එවැනි මනුෂ්‍යයෙක්, දේශපාලනඥයෙක්, සමාජ සේවකයෙක් අප අතරින් වෙන් වී යාම ගැන මගේ විශේෂ කණගාටුව ප්‍රකාශ කරනවා. චන්ද්‍රා ගුණසේකර මැතිතුමා ගැන මටත් වඩා එතුමා සමඟ කිට්ටුවෙන් ආශ්‍රය කරපු සමහරු අද එතුමාගේ විවිධ දක්ෂතාවයන් විවිධ ක්ෂේත්‍රයන් පිළිබඳව මහ ඉහළින් විස්තර කළ නිසා, ඒ ගැන නැවත කථා කරන්නට අවශ්‍ය වෙන්නේ නැහැ. වැඩි දෙනෙක් දේශපාලනය බිස්නස් එකක් කරගෙන තිබෙන මෙවැනි යුගයක චන්ද්‍රා ගුණසේකර වැනි උතුම් පුද්ගලයෙක් තමාගේ පෞද්ගලිකත්වයට වැඩිය ජනතා සේවය අගය කරමින්, තනතුරු හා මුදල් හම්බ කිරීම වෙනුවට තමාගේ ජීවිතයත් තමන් සතු දේවලුත් ජනතාව වෙනුවෙන් කැප කරමින්, ඉතාමත් නිහතමානීව ඉටුකළ ජනතා සේවය පිළිබඳව මේ අවස්ථාවේදී අපගේ උපහාරය එතුමාට පුද කළ යුතුව තියෙනවා. එතුමා දේශපාලනයට ඇතුළු වුණේ, මාක්ස්වාදී න්‍යාය ධර්මය ගරු කරමින්. එතුමා දීර්ඝ දේශපාලන ජීවිතයක් ගත කර මිය ගියෙත් එම දර්ශනය අගය කරමින්. නමුත් න්‍යායයන් හා ජාතික ප්‍රායෝගික අවශ්‍යතාවයන් කියන මේ දෙක ඉතාමත් සාර්ථක ලෙස එකට එකතු කරමින් එතුමාගේ දේශපාලන ජීවිතය හා සම්බන්ධ තීරණ එතුමා දිගින් දිගටම අරගෙන තිබෙනවා. චන්ද්‍රා ගුණසේකර වැනි නිහතමානී, නියම ජනතා සේවකයෙක් අද වැනි යුගයක අපට වෙන කවදාටවත් වඩා අවශ්‍ය වන බවත්, එතුමා අභාවප්‍රාප්ත වීම ගැන අපගේ කණගාටුව ගුණසේකර මැතිණියටත්, අද මෙතනට පැමිණ සිටින එතුමාගේ දියණියටත්, එතුමාගේ පුත්‍රයාටත් අනෙකුත් ඥාතීන්ටත් අප වෙනුවෙන් දන්වා යවන ලෙස ඉල්ලා සිටිමින් එතුමාට නිවන් සුව පතමින් අපගේ ශෝක ප්‍රකාශය මින් අවසන් කරනවා.

## 1993.09.09 වැනි දින බස්නාහිර පළාත් සභාවට ඉදිරිපත් වූ "යෝජිත කොළඹ - කටුනායක සුපිරි අධිවේගී මාර්ගය" ඉදිකිරීමට සම්බන්ධ යෝජනාවන් වෙනුවෙන් සිය අදහස් දක්වමින්. . . . .

ගරු සභාපතිතුමනි, දැන් පැය දෙකක් පමණ කාලයක් තිස්සේ ගම්පහ දිස්ත්‍රික්කය හරහා කටුනායක දක්වා තනන්නට යන අධිවේග මාර්ගය ගැන අපි නොයෙක් අදහස් සාකච්ඡා කළා. සමහර ඒවා කිසිම වැඩක් නැති තර්ක ඉදිරිපත් වුණා. සමහර ඒවා මගේ අදහස අනුව ගරු වජිර පැල්පිට මන්ත්‍රීතුමා කිව්වා වාගේ යම් යම් විශේෂඥයන් ඉදිරිපත් කරපු ඉතාමත් විද්‍යානුකූලව අදහස් ඉදිරිපත් වෙලා තියෙනවා. මම ඒ අදහස්වලට දීර්ඝ වශයෙන් තවත් අදහස් එකතු කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත් යම් කිසි දෙයක් සිදු කරනකොට විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු කිහිපදෙනෙක් කිව්ව දේවල් වලින් මට තේරුණේ රටේ සංවර්ධනය වෙනුවෙන් මෙවැනි මාර්ග අත්‍යවශ්‍යයි කියලා. හිට්ලර් ජර්මනියේ සිට යුරෝපයේ සමහර රටවල් දක්වා හදපු අධිවේග මාර්ග ගැන කථා කරලා, කිව්වා. හිට්ලර් බටහිර යුරෝපය අල්ලා ගත්තේ ඒ නිසයි කියලා. සමාවෙන්න ඒක නම් මොළේ ඇති කෙනෙක් කියන දෙයක් නොවෙයි. මම සම්පූර්ණයෙන් විරුද්ධයි ඒ අදහසට. හිට්ලර් අධිවේග මාර්ග හැදුවා. ඒ නිසා නොවෙයි හිට්ලර් ලෝකය අල්ලා ගත්තේ.

**ගරු ටයිටස් විමලසිරි මන්ත්‍රීතුමා**

සභාපතිතුමනි, පොඩි පැහැදිලි කිරීමක් කරන්න අවසර, මම කියපු දෙයක් පිළිගන්න සූදානම්. නොකියපු දෙයක් පිළිගන්න සූදානම් නැහැ.

**ගරු ප්‍රධාන අමාත්‍යතුමිය**

මම තමුන්නාන්සේගේ නම කිව්වේ නැහැ. කවුද කිව්වේ කියලා මම කිව්වේත් නැහැ.

**ගරු ටයිටස් විමලසිරි මන්ත්‍රීතුමා**

ඒ සම්බන්ධයෙන් කිව්වේ මම විතරයි.

**ගරු ප්‍රධාන අමාත්‍යතුමිය**

සභාපතිතුමනි, හිට්ලර් අධිවේග මාර්ග හදපු නිසාම හිට්ලර්ගේ වැඩ පිළිවෙළ කිසිසේත් සාර්ථක වුණේ නැහැ. හිට්ලර්ගේ වැඩ පිළිවෙළ සාර්ථක වුණේ, වෙනත් ඓතිහාසික, දේශපාලන, සමාජයීය හේතූන් නිසා, ඒ ගැන මීට වැඩිය හිතන්නවත් මෙතැන කථා කරන්නවත් අවශ්‍ය වෙන්නේ නෑ. රටක සංවර්ධනයට පාරවල් මාර්ග තැනීම, දියුණු කිරීම අත්‍යවශ්‍ය බව අපි පිළිගන්නවා. නමුත් සංවර්ධනය කරන කොට අවුරුදු 16ක් තිබ්බයේ ලොකු ලොකු කීප දෙනෙකුට විතරක් හැදෙන්නත් අනිකුත් සියලු දෙනාටම හෙණ ගැහෙන්නත් කරපු සංවර්ධනයට අපි සම්පූර්ණයෙන් විරුද්ධයි. පාරවල් අවශ්‍ය නම් ඒවා හදන්නට වෙනත් විකල්ප තිබෙනවා. ගෙවල් දෙදහස් පන්සීයක් තුන්දාහක් අතර ගණනක් ඉවත් කරලා ඒ ගෙවල්වල ජීවත් වන ජනතාවගේ ජීවිතවලට අනන්ත කරදර ඇති කරන්නේ නැතිව, වෙනත් විකල්පයක් තිබෙනවා නම්, ඒ විකල්පය ගැන හිතා බලන්නේ නැත්තේ මොකද කියලා අපට ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. වජිර පැල්පිට මන්ත්‍රීතුමත්, ෆීලික්ස් පෙරේරා මන්ත්‍රීතුමාත් යෝජනා කෙරුවා, ෆ්ලයිඕවර් එකක් ගැන. ඇල්මන් පීරිස් මන්ත්‍රීතුමත් කිව්වා. ඒ වාගේම ඒ ප්‍රදේශයේ ගෙවල්වලට හානි පැමිණෙන සංවිධාන වලින් කියනවා භූගෝලීය වශයෙන් ටිකක් වෙනස් කරලා, වෙනත් ක්‍රමයකට ඒ පාර හදන්න පුළුවන් කියලා මේ තරම් විශාල ගෙවල් ප්‍රමාණයකට හානියක් නොවෙන පරිදි. මම ඒ ගැන ඇත්ත වශයෙන්ම හරියාකාරව දන්නේ නෑ. ඒ මොනවා හරි විකල්ප යෝජනා දෙක තුනක් ඉදිරිපත් කරලා තිබෙනවා නම්, මම හිතන හැටියට මධ්‍යම ආණ්ඩුවේ වගකීමක් ඒ ගැන සොයා බැලීම. අපි යෝජනා කරනවා මේ සභාවේදී සංවිධානවලින් ඒ විකල්ප මාර්ග පිළිබඳ පැහැදිළි යෝජනා අරගෙන ඒ විකල්ප ගැන හරියාකාරව සොයලා බලලා, ඒ විකල්ප ක්‍රියාත්මක කරන්න කියලා. එසේ කරන්න පුළුවන් නම් ඉතාමත් අවම ප්‍රමාණයක් ජනතාවගේ ජීවිතවලට හානි සිදුවන පරිදි මෙවැනි මාර්ගයක් සෑදීම ඊට වැඩිය යෝග්‍යයි කියලා මම හිතනවා. ඒ සම්බන්ධයෙන් සමහර විට අවශ්‍ය නම් ප්‍රවාහන ඇමතිතුමාටත්, අපටත් මධ්‍යම ආණ්ඩුවේ අදාල බලධාරීන් සමඟ ඒ

විකල්ප ගැන සාකච්ඡා කරන්නටත් ඒ ජනතාවගේ ඉල්ලීමක් තිබෙන නිසා එය හැකි වේවි කියලා මම යෝජනා කරනවා. ඊට වැඩිය ඒ ගැන කථා කරන්නේ නැහැ. සංවර්ධනය අවශ්‍යයි. නමුත් සංවර්ධනය කීප දෙනෙකුට පමණක් නොවෙයි මුළු මහත් ජනතාවටම ප්‍රයෝජනයක් වන විධියට කරන්න අවශ්‍ය බව පසුගිය කාලේ ටිකක් අමතක වෙලා තිබුණා. ඒක නැවත වතාවක් මතක් කරමින් ජනතාවගෙන් වැඩි දෙනෙකුට සංවර්ධනයේ වාසියක් ලැබෙන පරිදි ඉටු කරනවා නම්, වැඩිය හොඳයි කියලා යෝජනා කරනවා. ස්තූතියි.

## බස්නාහිර පළාතේ පළාත් සභාවේ දෙවැනි පළාත් සභාවේ මංගල අයවැය ලේඛනය වන 1994 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශය 1993 සැප්තැම්බර් 23 වැනි දින පළාත් සභාවට ඉදිරිපත් කරමින්. . . . . .

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ දෙවැනි පළාත් සභාවේ මංගල අයවැය ලේඛනය වන 1994 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශය අද දින මා ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටකින් යුතුව බව ප්‍රථමයෙන් ප්‍රකාශ කරන්නට කැමැතියි.

වාර්ෂික මුල්‍ය ප්‍රකාශය සකස් කරන විට, එක පැත්තකින් පුනරාවර්ථන වියදම් සහ අනිත් පැත්තෙන් සංවර්ධන වියදම් පිළිබඳ තිරණය කළ යුතුයි. ඒ වාගේම මේවා ප්‍රතිපත්තිමය තීන්දු විය යුතුයි.

පුනරාවර්ථන වියදම්වලින් වැඩි ප්‍රමාණයක් යොදවන්නේ සේවක වැටුප් සහ දීමනා සඳහා යි. මේ පිළිබඳ තීන්දු මේ දක්වා මධ්‍යම ආණ්ඩුවෙන් ඒක පාක්ෂික ලෙස අරගෙන තිබෙනවා. මෙම පළාත් සභාවේ විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් පාලනය වන 50,000 කට ආසන්න සේවකයන්ගේ පඩි, දීමනා හා සේවා පහසුකම් පිළිබඳ මේ දක්වා, මීට පෙර තිබුණු පළාත් සභාවෙන් යෝජනා ඉදිරිපත් නොකළත්, ඉදිරියේදී අප විසින් මේ සම්බන්ධයෙන් යෝජනා සකස් කර ඒ පිළිබඳව මධ්‍යම ආණ්ඩුව සමඟ සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙමු.

පසුගිය වර්ෂයේ සංවර්ධන වියදම්වලින් වැඩි ප්‍රමාණයක් යොදවා ඇත්තේ, ගොඩනැගිලි, මාර්ග පාලම්, බෝක්කු තැනීමට සහ ජලනල පහසුකම්, ළිං සැපයීම වැනි අංශයන් සඳහායි. මේවා සංවර්ධන සඳහා අත්‍යාවශ්‍ය වන බව අපි පිළිගන්නවා. මෙවැනි සංවර්ධන වැඩ සඳහා ඉදිරි වර්ෂයේදීත් මුදල් වැය කරන අතර, අප පළාතේ ජීවත් වන ලක්ෂ 5 කට අධික, උගත් රැකියා විරහිත තරුණ තරුණියන්ට, රැකියා හෝ අදායම් මාර්ග සැපයීමේ කටයුතුවලටත් අපි ප්‍රමුඛත්වය දී තිබෙනවා. මේ සඳහා නව වැඩපිළිවෙළක් අප සකස් කර තිබෙනවා.

ස්වයං රැකියා ක්‍රමයට එළඹෙයි සුළු කර්මාන්ත සහ ව්‍යාපාර සඳහා තාක්ෂණ පුහුණුව හා ණය මුදල් ලබා දීමට සැලසුම් කර තිබෙනවා.

මේ සඳහා අප පළාතේ දිස්ත්‍රික් තුනේ විධිමත් සමීක්ෂණයක් පැවැත්වීමට ද සැලසුම් සකස් කර ඇති බවත් සභාවට දැනුම් දීමට කැමැතියි.

32,000 ක් පමණ වන අප පළාතේ ගුරුවරුන් උගන්වන විෂයයන් සම්බන්ධයෙන් අද පවතින යල් පැනපු ක්‍රමෝපායන් හා පුහුණු පාඨමාලාවන් අද යුගයට සරිලන පරිදි විද්‍යාත්මක ක්‍රමෝපායන් අනුගමනය කරමින්, නව පුහුණු පාඨමාලා සකස් කර, ක්‍රියාත්මක කිරීමට කටයුතු පිළියෙළ කර තිබෙනවා. මෙතැනදී විශේෂයෙන් විද්‍යාව, පරිගණක අධ්‍යාපනය, භාෂා යනාදී විෂයයන්ට ප්‍රමුඛත්වය දෙන අතර භාෂා ඉගැන්වීම සඳහා ලෝකයේ විවිධ රටවල අළුතින් සම්පාදනය කර තිබෙන නවීන ක්‍රම, යෙදවීමටත් සැලසුම් කරන බව කීමට කැමැත්තෙමි. සිංහල භාෂාව මෙන්ම ඉංග්‍රීයි භාෂාව ප්‍රමුඛව ප්‍රංශ සහ ජර්මන් භාෂා ඉගැන්වීමටත් ප්‍රමුඛතාවය දෙන අතර, පාසල් අතහැර යන්නන් උදෙසා ද වෘත්තීය පුහුණු පාඨමාලාවක් සකස් කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබෙනවා.

අප සංවර්ධන සැලැස්මේ කොළඹ ඇතුළු ප්‍රධාන නගරවල ජලගැලීම්, මදුරු උවදුරුවලට විසඳුම් සෙවීමද, කැළි කසළ ඉවත් කිරීම සහ කාණු බෝක්කු ශුද්ධ පවිත්‍රව තබා ගැනීමේ කටයුතු ද විධිමත්ව හා නියමානුකූලව පවත්වාගෙන යාමට ප්‍රමුඛත්වයක් දීමට කටයුතු යොදා ඇත.

ආණ්ඩුකාරතුමා පසුගිය ජූලි මස 06 වෙනිදා ප්‍රකාශයට පත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් කරුණු කෙරෙහි අවධානය ලක් කර, මෙම අයවැය ලේඛන සකස් කළ බව පැවසීමට කැමැත්තෙමි. අප පළාත් අමාත්‍ය මණ්ඩලයේ විෂයයන් අතර, අළුතෙන් හඳුන්වා දෙන විෂයයන් කිහිපයක් ද පවත්නා බව මෙහිදී පෙන්වා දිය යුතුය. ඒවා නම්, පරිසර සංරක්ෂණ කටයුතු, නගර නිර්මාණ, කලා හා රැඟුම්හල් කටයුතු හා ග්‍රාමීය ආයතන කටයුතු ආදිය සඳහා මෙම ප්‍රකාශයේ අදාළ අමාත්‍යාංශ වැය ශීර්ෂ යටතේ සංකේත ප්‍රතිපාදන සලසා ඇති බව දැනුම් දෙනවා.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

පළමුවෙන්ම වියදම් ගැන මෙම සභාවට කරුණු ගෙනහැර දක්වන්න කැමැතියි. 1994 වර්ෂයේ පළාත් සභාවේ සියලුම අංශවල පුනරාවර්ථන වියදම් දශ ලක්ෂ 3778.4 ක් බවට ඇස්තමේන්තු කර තිබෙනවා. මුදල් කොමිසම සමඟ අපි පැවැත්වූ සාකච්ඡාවලින් පසුව එය දශ ලක්ෂ 3467.6 ක් දක්වා අඩු කරන ලදී. මෙය අපගේ අවශ්‍යතාවලින් 8.2% ක අඩු කිරීමක්. රජයේ තීරණ අනුව පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ හා නිලධාරින්ගේ වැටුප් 30% කින් වැඩි කිරීමේ හේතුවෙන් පසුගිය වර්ෂයට වඩා අපට 1994 වසර සඳහා සියයට 14.5 ක් අවශ්‍ය වෙනවා. මෙයින් මා පෙන්වීමට අදහස් කළේ, අපගේ ක්‍රියාකාරකම් කෙතරම් දුරට සීමා වී තිබෙනවාද කියලා ඒත්තු ගන්වන්නයි. රජය මඟින් වැඩි කළ වැටුප් ගෙවීමට අවශ්‍ය මුළු මුදල් ප්‍රමාණයවත් මුදල් කොමිසම මඟින් අපට ලබාදී නොමැති බව මෙයින් පෙනී යනවා. කරුණු මෙසේ වූ නමුත් අපගේ වියදම් ඉතා ප්‍රවේශමෙන් හා අරපරිස්සමෙන් ද, නාස්තිය හා දූෂණය පිටු දකිමින් ද ක්‍රියාත්මක කිරීම අපේ අරමුණ බව ප්‍රකාශ කරන්නේ සතුටිනි. 1994 වසරේ අපේ පළාත් සභාවේ දළ ආදායම රුපියල් දශ ලක්ෂ 2117.2 කි. 1993 වර්ෂයේ අපගේ පළාත් සභාවේ ආදායම් ඉලක්කය රුපියල් දශ ලක්ෂ 1717.65 කි. මේ අනුව බලන විට 1994 වසරේ අපේ ආදායම් ඉලක්කය 23.02% කින් වැඩි වී ඇති බව පෙන්වා දිය යුතුව තිබෙනවා. මුදල් කොමිසම විසින් අපේ ආදායම මීට වැඩි මුදලක් ලෙස සලකා ඇති අතර, එම මුදල රුපියල් දශ ලක්ෂ 2231 ක් ලෙස සලකා තිබෙනවා. මෙහිදී පෙනී යන වැදගත් කරුණක් ගැන ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවන්නට කැමැතියි. මුදල් කොමිසම අපගේ වියදම අඩුවෙන් ගණන් බලා, ආදායම වැඩියෙන් ගණන් බලා ඇති බව. ඒ අනුව අපට ලැබෙන ප්‍රදාන පිළිබඳව තීරණ ගෙන ඇති බව පවසන්න කැමැත්තෙමි. අපගේ ආදායම් ප්‍රමාණය අතහැර, අඩුවෙන් ගණන් බලන ලද වියදම් ප්‍රමාණයට ගැලපෙන පරිදි, අඩු මුදල් ප්‍රතිපාදන ප්‍රමාණයක් ලබා දීමට, ඒකපාක්ෂික තීරණයක් ගෙන ඇති බවත් මෙයින් පෙනී යනවා.

1994 වසරේ අපගේ මූල්‍යමය ප්‍රයත්නයන් (Monetary expectations) ගැනත් යමක් කිවයුතු යැයි මට සිතෙනවා. අපේ පුනරාවර්ථන වියදමින් 68% ක් අපි අපගේ ආදායම්වලින් පිරිමසා ගන්නවා. ඉතිරි අඩු ප්‍රමාණය හෙවත් හිඟය පියවා ගැනීමටත් හිඟය පියවා ගැනීමෙන් පසු කිසියම් අතිරික්තයක් ද අපි විසින් රැස් කර ගත යුතු බව, අප විසින් අවබෝධ කොටගෙන සිටින බවත් කිව යුතුයි. මෙම අරමුණ ජනතාවට අධික



5 – H 19760

බදු බර පැටවීමකින් තොරව ඉටු කර ගැනීමෙන්, මුදල් වශයෙන් අපේ ස්ථාවරභාවයත්, ස්වාධීනතාවයත් රැක ගැනීමට අදහස් කර සිටින බව මා සතුටෙන් ප්‍රකාශ කරනවා.

මෙබඳු තත්ත්වයක් ඇති කර ගතහොත් අපට ඵලදායි සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීමට හැකි වන බව මා නොකීවාට ඔබතුමන්ලාට අවබෝධ වනු ඇති. වාහනවලින් අය කරනු ලබන ස්ථානීය දඩ හා උසාවි දඩ පළාත් සභාවට බැර කර ගැනීමට හැකිවන පරිදි ක්‍රියා කිරීම අප දැනටමත් ආරම්භ කර තිබෙනවා.

ආචාර්ය සල්ගාදු වාර්තාවේ නිර්දේශය අනුව, පළාත් සභා ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය මත දිරි දීමනා වශයෙන් අනුරූපිත ප්‍රදාන (Metching Grants) පළාත් සභාවට ලබා දෙන බවට රජය ප්‍රකාශ කළත්, මේ දක්වාම එය ඉටු වී නැති බවත්, එය බොරු පොරොන්දුවක් බවත් පෙන්වා දෙන්නේ කනගාටුවෙනි. 1994 වර්ෂය තුළදී අදාළ නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීමෙන් පොරොන්දු වූ පරිදිම මෙම අනුරූපිත ප්‍රදාන ලබා ගැනීමට අපි තරයේ අධිෂ්ඨාන කර ගෙන සිටින බවද මෙහිලා මා අවධාරණය කරනවා.

1993 වර්ෂයේ හැර ඊට පෙර කාල සීමාව සඳහා පමණක් අපට අතිරික්ත එකතුව අනුරූපිත ප්‍රදාන ලෙස රුපියල් දශ ලක්ෂ 630 ක් ලැබිය යුතුව තිබේ. ගරු සභාපතිතුමනි, සංවර්ධන කටයුතු සඳහා ඉහළම ප්‍රමුඛත්වය දීම අපගේ අරමුණයි. කිසිදු භේදයකින් තොරව පොදු අභිවෘද්ධිය සඳහා කැපවීම අපගේ සටන් පාඨය වන බව මා ගෞරවයෙන් ප්‍රකාශ කරන්නට කැමැතියි. එම පොදු අභිවෘද්ධිය සලසා ගැනීමටත්, එමඟින් අප බස්නාහිර පළාත් සභාවේ ගෞරවය රැක ගැනීමටත්, තමුන්නාන්සේලාගේ පූර්ණ සහය ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. අප අතර සුහද හිතෛෂී බවක් වර්ධනය කර ගැනීම ජයග්‍රහනයේ පදනම බව මා අවසාන වශයෙන් ඔබ හැමගේ කාරුණික අවධානය ඊට යොමුකර වීමට කැමැතියි.

මෙම මුදල් ප්‍රකාශය සකස් කිරීමේදී නන් අයුරින් වෙහෙස වූ ප්‍රධාන ලේකම් හා කාර්ය මණ්ඩලයටත්, සම්බන්ධිත අනෙකුත් නිලධාරීන්ටත්, මගේ ස්තුතිය පළ කරන බව මෙහිලා ප්‍රකාශ කරන්නට කැමැතියි.

මෙම මුදල් ප්‍රකාශයේ ඇතුළත් යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ සැමගේ සහය ලබා දෙන මෙන් ඉල්ලා සිටිමින් මගේ කථාව මෙයින් අවසන් කරනවා. ඔබ සැමට ස්තුතියි.

## 1994 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශනය පිළිබඳ සාකච්ඡාවේදී 1993.10.12 වැනි දින පළාත් සභා රැස්වීම අමතමින්

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1994 වර්ෂය සඳහා අප පළාත් සභාව විසින් ඉදිරිපත් කරන ලද අයවැය ප්‍රකාශය සම්බන්ධයෙන් අද දින ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද යම් අදහස් වලට පමණක් පිළිතුරු දීමට මා අදහස් කර තිබෙනවා. අපේ කාලය විශාල වශයෙන් ගෙවී ගොස් තිබෙන නිසා, පළමුවෙන්ම මා කිවයුතු කරුණක් තියෙනවා. එදා මුදල් ප්‍රකාශය ඉදිරිපත් කරන ලද අවස්ථාවේදී මා කෙටියෙන් සඳහන් කළ පරිදි, ඇත්ත වශයෙන්ම වර්ෂයෙන් වර්ෂයට අපේ පාලනයේ මීට පෙර තිබුණ පාලනයේදීත්, අයවැය ලේඛනය සකස් කරන වෙලාවේදී පළාත් සභාවට විශාල හරඹයක් කරන්නට සිදු වුණා, මහ ආණ්ඩුව සමග. මා මෙතන දීර්ඝ වශයෙන් විස්තර කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මා හිතන හැටියට මේ සභාවේ සියලුම ගරු මන්ත්‍රීවරු ඒ කාරණාව දන්නවා. ඇත්ත වශයෙන්ම විපක්ෂ නායකතුමාත් එතුමාගේ කථාවේදී මීට පෙර කථා කරන ලද අවස්ථාවකදීත් ඒ අදහස් සඳහන් කළා. මධ්‍යම ආණ්ඩුව විසින් පළාත් සභා පනත සකස් කළත් පළාත් සභා පනත හරහා අපට ලබා දිය යුතු බලතල ලබාදීමට කිසිම උනන්දුවක් දක්වන්නේ නැති බව. පළාත් සභා පනතේ ආත්මය යයි කියන්නට පුළුවන් විමධ්‍යගත කිරීමේ බලය, මධ්‍යම ආණ්ඩුවේ සිට පළාත් සභාව දක්වා සහ අද පවතින ක්‍රමය තුළ පළාත් සභාවේ සිට ප්‍රාදේශීය සභා දක්වා විමධ්‍යගත බලය කිරීම සිදු වුණේ නැහැ. ඇත්ත වශයෙන්ම මට අවබෝධ වන විධියට අවංකව කරන්නට බලාපොරොත්තුවෙන් නෙවෙයි මධ්‍යම ආණ්ඩුව මේ පළාත් සභා පනත සකස් කරලා තියෙන්නේ. 13 වැනි සංශෝධනයෙනුත්, පළාත් සභා පනතෙනුත් පළාත් සභාවලට ලබා දීලා තිබෙන මූලික බලතල දිහා බැලුවාමත් ඒ වාගේම මෙතෙක් කල් පළාත් සභා ක්‍රමය ක්‍රියාත්මක කරවල තියෙන හැටි බැලුවහමත්, බස්නාහිර පළාතේ පමණක් නෙවෙයි පළාත් හතක සහ ඉතුරු පළාත් දෙකෙත් පළාත් සභාව තිබුණු කාලයේදී ක්‍රියාත්මක කරපු හැටි බලන කොටත්, පළාත් සභාවලට අවංකව බලය විමධ්‍යගත කරන්නට මධ්‍යම ආණ්ඩුවට වුවමනාවක් විශ්වාසයක් තිබුණ බවක්වත් මට පෙනෙන්නේ නෑ. ඒ නිසාම වෙන්න පුලුවන්, මහා විශාල වැඩ කොටසක් භාරදීලා තියෙන

වෙලාවෙදී බලතල අඩුවෙන් හෝ, මූල්‍යමය පැත්තෙන් මහ විශාල වැඩ කොටසක් පමණක් කරන්න භාර දී තිබියදී, ඒ සඳහා අවශ්‍ය මුදල් පසුගිය අවුරුදු පහ ඇතුළතදීවත් දැන් හයවන වර්ෂයත් එළඹෙන වෙලාවෙදීවත් පඩි ගෙවන්නට ලබාදීලා නැහැ. පළාත් සභාවට යම් යම් ප්‍රධාන ආයතනවල අධ්‍යාපනය, සෞඛ්‍ය, පළාත්, සමූපකාර, කෘෂිකර්ම කර්මාන්ත වැනි කටයුතු පවරලා තිබුණත්, ඒ විෂයයන් පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීම ඒකමතිකව මධ්‍යම ආණ්ඩුවෙන් කරනවා මිස, පළාත් සභාව ප්‍රතිපත්තිමය තීන්දු ගන්න කමිටුවකට සහභාගි වෙලා නෑ. මා දන්න තරමින් තීන්දු අරගෙන අපට ඒ තීන්දු එවනවා, ඒ ආයතනවල කටයුතු කරන අයට පඩි ගෙවන්න කියලා. ඒ අයගේ සියලු දීමනා ගෙවන්න පරිපාලනමය කටයුතු කරන්න කියලා. ලිපිකරු කටයුතු අපට භාර කරලා තිබෙනවා. ඒ සඳහා පළාත් සභාව කියලා සුපිරි ආයතනයක් හදලා තියෙනවා, ඒ කටයුතු කරන්න. ප්‍රතිපත්තිමය තීන්දු ගන්නේ මහ ආණ්ඩුවෙන්. මේ ආයතනවල කටයුතු කරන සියලුම නිලධාරීන් පාහේ බඳවා ගන්නෙත් පළාත් සභාවේ අදහස් අහන්නේවත් නැතුවයි. අඩු තරමින් ඒ ප්‍රධාන කටයුතු දෙකට පළාත් සභාවේ සහභාගිත්වයක්වත් නැහැ. බඳවා ගත් අයම අපට එවනවා පඩි ගෙවන්න. ඉතුරු හරිය කරන්න. සාමාන්‍යයෙන් ඒ සඳහා අපට අවශ්‍ය මුදල් මෙතෙක් කල් සභාවට දීලා තියෙනවා. නමුත් පළාත් සභාවෙනුත් ඒ වාගේම විශාල සංවර්ධන වැඩ කොටසක් කෙරෙන්නට නියමිතව තිබෙනවා. බස්නාහිර පළාතේ අපි සියලු දෙනාම දන්න පරිදි මේ රටේ මුළු ජනගහනයෙන් හතරෙන් එකකට වැඩි ප්‍රමාණයක්, අපේ පළාතේ ජීවත් වෙනවා. බස්නාහිර පළාතේ සියලු සංවර්ධන කටයුතු අතුරින් පාසල් ගොඩනැගිලි හදන්න ඕනෑ. අධ්‍යාපන ප්‍රතිපත්ති අපට තීන්දු කරන්න බෑ. නමුත් ගොඩනැගිලි හදන්න ඕනෑ. ගොඩනැගිලි නඩත්තු කරන්න ඕනෑ. ඩෙක්ස්, පුටු, බංකු සියල්ල අපි සපයන්න ඕනෑ.

ගරු මන්ත්‍රීවරු

විවෘත කරන්න ඕනෑ.

ගරු ප්‍රධාන අමාත්‍යතුමිය

විවෘත කරන්න නම් එක එක්කෙනාට ලොකු ලොකු අසනීප තියෙනවා. අපට නම් එහෙම අසනීපයක් නැහැ. විවෘත කිරීම් පිළිබඳ ලොකු

අසනීපයක් ආණ්ඩුවේ සමහර අයට තියෙනවා. ඒ වාගේම මෙතන ඉන්න සමහර අපේ ගරු මන්ත්‍රීවරුන්ටත් ඒ අසනීපය තියෙනවා. කෙසේ වෙතත් ඒ සියල්ල අප විසින් ඉටු කළ යුතුව පවතිනවා. සෞඛ්‍ය අංශයේ රෝහල් පිළිබඳ හා ඒ හා සමාන වැඩ කටයුතු කරන්නත්, සී.ඩී.ඊ. පාරවල් හදන්නත්, නඩත්තු කරන්නත්, එවැනි සියලුම ප්‍රධාන කටයුතුවලට අපට ලැබෙන්නේ, කැපිටල් එක්ස්පෙන්ඩිචර් වශයෙන් ලැබෙන්නේ ලක්ෂ 211 යි. ඊට අමතරව තව අපම ආණ්ඩුවෙන් ලැබෙන සමහර ප්‍රදාන ලෝක බැංකුවෙන් සහ එවැනි ආයතනවලින් ලැබෙන ප්‍රදාන ඔක්කොම එකතු කළොත් ලක්ෂ 400 කට කිට්ටු ගාණක් ලැබෙනවා. එම්.ටී.අයි.පී., අයි.ආර්.ඩී.පී. වැනි දේවල් ඔක්කොම බැලුවොත්. මේසා අති විශාල වැඩ කොටසක් කරන්න, මේ ලැබෙන සොච්චම අපට මදියි. මේ සුළු මුදල් ප්‍රමාණය මත පිහිටා තමයි, පසුගිය කාලයේම මේ පළාත් සභාව, අයවැය හදන අවස්ථාවලදී හරඹ කරලා තියෙන්නේ. මේ වර්ෂයේදී ඊටත් වඩා කණගාටුදායක තත්ත්වයක් අපට උදාවෙලා තියෙන්නේ. මෙතුමන්ලා ප්‍රශ්න කළාට, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒක තමයි ඇත්ත තත්ත්වය.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම මහ ආණ්ඩුවේ තීන්දුවක් මත සේවක පඩි 30% කින් වැඩි කරපු මුදලුත් අපි ගෙවිය යුතුයි. ඒ ගෙවීම සඳහා ගිය වර්ෂයට වඩා පුනරාවර්තන වියදම් 14% කින් වැඩි වෙලා තියෙනවා. ඒ ගෙවීම් සඳහා පමණක්. ඒ 14% ක වැඩි වූ ප්‍රමාණය, ඒ වැඩිවීම මහ ආණ්ඩුවෙන් අපට ලබා දීලා නැහැ. එදා මගේ කථාවේදී ඒ කරුණු පිළිබඳව මා සඳහනක් කළා. ඒ නිසා ඒ විස්තර මේ අවස්ථාවේදී නැවත කියන්න වුවමනා නෑ. ඒ කරුණු පැහැදිලිව ඒ අවස්ථාවේදී ඉදිරිපත් කළා. අඩු තරමින් ගිය වර්ෂයේදී පුනරාවර්තන වියදම් සඳහා මුදල් කොමිසමෙන් අවශ්‍ය ප්‍රමාණය අඩු කරලා තිබුණේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මුදල් කොමිසමට චෝදනා එල්ල කළා කියලා, මහින්ද සමරසිංහ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා චෝදනාවක් හැටියට නොවෙයි, විවේචනය කළා කියලා තමයි, එතුමා පාවිච්චි කළ වචනය වුණේ, විවේචනයක් නොවෙයි සත්‍ය තත්ත්වය ඉදිරිපත් කළා. අපි ඉල්ලපු මුදල් ප්‍රමාණය අඩු කරලා අපට ඉහළ ඉලක්කයක් ලබා දෙනවා. අපට ලැබිය යුතු ආදායම්, අපි මේ තරම් ආදායම් ප්‍රමාණයක් ලබා ගන්නට බලාපොරොත්තු වනවා කියලා, ඉදිරිපත් කරපු ප්‍රමාණය වැඩි කරලා ඊට වැඩි ගාණක් හම්බ කර ගන්න ඕනෑ කියලා, අනික් පැත්තෙන්

වියදමට වැඩිය අපි ඉදිරිපත් කරපු ප්‍රමාණය අඩු කළා. මේ දෙක අතර තිබෙන පරතරය පියවීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණයෙන් වැඩි හරියක් අපට ලබා දීලා නැහැ. මම මෙතන ගණන් හිලව් කියන්නේ නැහැ, මීට පෙර ඒ ගැන ප්‍රකාශ කළ නිසා ඇත්ත වශයෙන්ම පළාත් සභාවේ මා ප්‍රතිපත්තිමය වශයෙන් මීට පෙර කරන ලද අදහස ගරු ටයිටස් විමලසිරි මන්ත්‍රීතුමා විසින් ද ඉදිරිපත් කරනු ලැබුවා. සමහර විට සමගාමී ලැයිස්තුව නොතිබුණා නම්, එල්.ටී.ටී.ඊ. එකත් අපට නැඹුරු කර ගන්න තිබුණාය කියලා. පළාත් සභා ක්‍රමයට එකඟ වෙන්න තිබුණා. මට එතන කියන්න තියෙන්නේ එක දෙයයි. ඇත්ත වශයෙන්ම මම එකඟ වෙනවා. විපක්ෂ නායකතුමත් මෙය විටින් විට කියලා තියෙනවා. සමගාමී ලැයිස්තුව ඉවත් කර ගත යුතුයි. නමුත් එතුමා එතනදී කරපු විග්‍රහයට නම් අපට එකඟ වෙන්න බැහැ. සමගාමී ලැයිස්තුව තිබුණත් නැතත් එල්.ටී.ටී.ඊ. තියා ඊ.පී.ආර්.එල්.එෆ්. එකට වත් පළාත් සභාව ක්‍රියාත්මක කරන්න මේ රජයෙන් ඉඩ දුන්නේ නැහැ. බොහොම අමාරුවෙන් පත් කර ගත්ත උතුරු නැගෙනහිර පළාත් සභාවට මූලික වශයෙන් එහි පරිපාලන කටයුතු හා සංවර්ධන කටයුතු කර ගන්න ඉඩ දුන්නේ නැහැ. මේ මුළු පළාත් සභා ක්‍රමයම ගෙනාවේ උතුරු නැගෙනහිර ප්‍රශ්නයට විසඳුමක් හැටියටයි. අද එය වෙන දිශාවකට පරිවර්තනය වෙලා තිබෙනවා. මේ රජය බොහොම අමාරුවෙන් පත් කර ගත්ත උතුරු නැගෙනහිර පළාත් සභාවට සතයක්වත් දෙන්නේ නැතුව, ඒ පළාත් සභාව ඉබේට මැරිලා යන්න ඉඩ හැරියා. මුදල්මය මන්ද පෝෂණයෙන් මැරිලා ගියා. ඊළඟට ඊ.පී.ආර්.එල්.එෆ්. එක ශාරීරිකවත් මරා දමන්නත් එල්.ටී.ටී.ඊ. එකට ආයුධ දුන්නා. හෙලිකොප්ටර් වලින් ගිහිල්ලයි ආයුධ දුන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් මා ඒ ගරු විමලසිරි මන්ත්‍රීතුමාට මතක් කරන්න කැමතියි සමගාමී ලැයිස්තුව ඉවත් කළත් තමුන්නාන්සේලාගේ රජය අවංකව පළාත් සභා ක්‍රමය ගැන විශ්වාසයක් තබා ගෙන මධ්‍යම ආණ්ඩුව විසින් ඩැහැගෙන සිටින බලතල විමධ්‍යගත කරලා දුන්නේ නැත්නම්, සමගාමී ලැයිස්තුව තිබුණත් නැතත් ප්‍රශ්න විසඳෙන්නේ නැති බව. එසේම මහින්ද සමරසිංහ ගරු මන්ත්‍රීතුමා ඊට සම්බන්ධ ප්‍රශ්නය ගෙන ආ නිසා මා කෙටියෙන් සඳහන් කරන්න කැමතියි. එතුමා අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නව ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් කරුණු වගයක් උපුටා අරගෙන අදහසක් ප්‍රකාශ කළා, අපි පළාත් සභා වෙනුවට යම් යම් ආයතන යෝජනා කරනවා කියලා.

මට එහිදී කිසිම පරස්පර විරෝධිභාවයක් පෙනෙන්නේ නෑ. අපි බලය විමධ්‍යගත කිරීම පිළි අරගෙන තියෙන්නේ. මා මීට පෙරත් මා මේ ගරු සභාවට අදහස් ඉදිරිපත් කළා මෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට බලය විමධ්‍යගත කිරීම පළමුවෙන්ම පිළිගත්ත දේශපාලන පක්ෂයක් මේ රටේ. 1956 බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම ගෙනාවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවේ වුවමනාව මතයි. ඒ කාලයේ ත්‍රස්ත්‍රවාදීන් බල කළේ නෑ, අරවා කරන්න. මේවා කරන්න කියලා. ඉන්දියාවෙන් පරිප්පු දාලා රජයට බල කළේ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අවශ්‍යතාවය මත මිසක් කවුරුත් බෙල්ල අල්ලලා මිරිකපු නිසා නොවෙයි අපි බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම ගෙනාවේ. අද පවතින පළාත් සභා වලටත් වඩා බලතල භාර දෙන ක්‍රමයක් තමයි අපි එදා යෝජනා කළේ. ඒකට මෙතුමන්ලාගේ හිටපු නායකතුමා පා ගමන් ගිහිල්ලා පාර මැද්දේ ඉඳගෙන එය නැවැත්වුවා. අපට ඒකට කරන්න දෙයක් නෑ. බොහොම කණගාටු වෙනවා. කෙසේ වෙතත් අපේ පක්ෂය හැමදාම බලය විමධ්‍යගත කිරීම පිළිගත්තා. මේ රටේ තියෙන සියලුම වාමාංශික පක්ෂ බලය විමධ්‍යගත කිරීම ගැන හැමදාම කථා කළා. අපි කියන්නේ, බලය විමධ්‍යගත කිරීමට විරුද්ධයි කියලා නොවෙයි. අපේ ප්‍රකාශනයේ අපි කියන්නේ, පළාත් සභා ක්‍රමයේ තියෙන අඩුපාඩුකම් වෙනස් කරලා ඒ අඩුපාඩුකම්වලට අවශ්‍ය විසඳුම් සොයා දීලා ඊට වඩා සාර්ථක ක්‍රමයක් ඉදිරිපත් කරනවා කියන එකයි. මොකක්ද ඒකේ තියෙන වැරැද්ද. මෙතුමාලාගේ හිටපු ජනාධිපති ප්‍රේමදාස මහත්මයා මේ රටේ ක්‍රියාත්මක වුණ ගම් සභා ක්‍රමය අහෝසි කරලා ගම් සභා ක්‍රමය වෙනුවට ප්‍රාදේශීය සභා ගෙනාවා. අවුරුදු 13 ක් මොකුත් තිබුණේ නෑ. මේ රටේ ඒ වෙනුවට හිස් තැනක් තිබුණේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගම් සභා පනත අහෝසි කළේ, රණසිංහ ප්‍රේමදාස මහත්මයා. එතුමාගේ රජය පළාත් පාලන ඇමති හැටියට පත්වුණා පස්සේ. 1977 රජය බලයට ආපු ගමන්ම පළාත් පාලන ආයතන විසුරුවා හැරියේ පාර්ලිමේන්තුවේ පනතක් ගෙනල්ලයි. ඊට පස්සේ අවුරුදු 13 ක් තිස්සේ මේ රටේ කිසි දෙයක් තිබුණේ නැහැ, 1977 සිට 1991 දක්වා මේ රටේ පළාත් පාලන ක්‍රමයක් ගම් මට්ටමේ තිබුණේ නැහැ, අවුරුදු 13 ක් තිස්සේ. 1991 ඒ වෙනුවට ප්‍රාදේශීය සභා ගෙනාවා. ඒ වාගේම මේ රජය විසින් ග්‍රාම සේවක කියන තනතුර අත් හැරලා වගා නිලධාරි කියලා කොටසක් පත් කළා. නැවත වතාවක් වගා

නිලධාරීන් ග්‍රාම නිලධාරීන් බවට පත් කළා. නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ අය රට කාපු හැටි කියන කොට බොහොම අමාරුයි. (සභාවේ ඝෝෂා)

ඊළඟට මේ රජය විසින් උප දිසාපතිවරු ප්‍රාදේශීය ලේකම්වරු බවට පත් කළා. දිසාපතිවරු දිස්ත්‍රික් ලේකම්වරු බවට පත් කළා. එතකොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් මම කියන්න කැමතියි, ඒ මන්ත්‍රීතුමාට අපි බලය විමධ්‍යගත කිරීම, බලය බෙදා හැරීම පිළිගන්නා අතර, පළාත් සභා වෙනුවට ඊට වඩා සාර්ථක ක්‍රමයක් ගෙන එනවා කියන එකේ වැරැද්ද මොකක්ද කියලත් අහන්න කැමතියි.

ගරු මන්ත්‍රීවරු

ක්‍රමය කියන්න

ගරු ප්‍රධාන අමාත්‍යතුමිය

ක්‍රමය අපි ජනතාවට කියන්නම්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවශ්‍ය වෙලාවට අපි ක්‍රමය දෙන්නම්. ජනතාව අපට අවස්ථාව ලබාදීලා තියෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවෙනුත් වයඹ සහ දකුණ පළාත් සභාවෙනුත් පළාත් සභා ක්‍රමය පාලනය කරලා මෙහි තියෙන අඩුපාඩුකම් හොයාගෙන ජනතාවට මීට වඩා සරිලන, මීට වඩා සාර්ථක ක්‍රමයක් සකස් කිරීමට අපට බලය ලබා දී තිබෙනවා. තමුන්නාන්සේලාට ඒකටත් බොහොම අමාරුයි. තවමත් ආණ්ඩුකාරවරු දඟලනවා ඒ අයිතිවාසිකම් දෙන්නේ නැතුව ඉන්න. ඒ කෙසේ වෙතත් අපේ විපක්ෂ නායකතුමා වටිනා අදහස් වගයක් ඉදිරිපත් කරමින් ප්‍රශ්න කළා. සැප්තැම්බර් මාසේ 23 වැනි දා මා කරපු ප්‍රකාශයක් සම්බන්ධව. අපි කියලා තියෙනවා, පළාත් සභාවේ සේවකයන්ගේ පඩි සහ දීමනා පිළිබඳ නව යෝජනා මාලාවක් සකස් කරලා මහ ආණ්ඩුව සමඟ සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙනවා කියලා. එතුමා ප්‍රකාශ කළ පරිදි අපට තිබෙන නිතී රීති අනුව ඒවා පිළිබඳ තීන්දු ගැනීමට හැකියාවත් නැතිවුණා. මා හිතන හැටියට ඒ පිළිබඳ ගැඹුරට හිතලා සාකච්ඡා කරලා, අදාළ කොටස් සමඟ සාකච්ඡා කරලා මධ්‍යම ආණ්ඩුවට පැහැදිලි යෝජනා මාලාවක් ඉදිරිපත් කිරීමට අපට අයිතිය

තියෙනවා. ඒ සඳහා ලබා ගැනීමට සටන් කරන්නත්, අපට අයිතිය තියෙනවා. අන්න ඒකයි කරන්න බලාපොරොත්තු වෙනවයි කියලා කිව්වේ.

ඒ වගේම, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතුමා තවත් ප්‍රශ්නයක් ඇහුවා. දැනට පවතින ගුරුවරුන්ගේ පුහුණු පාඨමාලාවල් වඩා සාර්ථකව කරනවා කිව්ව අදහස - මා මගේ ප්‍රකාශය නැවත වතාවක් කියවන්නේ නෑ. ඇත්ත වශයෙන්ම අපට ගුරු පුහුණුවීම් කිරීමේ අයිතියක් නැහැ. නමුත් මේ පළාත් සභාවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඉන්සර්විස් ට්‍රේනිං කරනවා. ඉතුරු ඒවා මහ ආණ්ඩුව යටතේ ගුරු පුහුණු මධ්‍යස්ථානවල කරන්නේ. අපි බලාපොරොත්තු වෙන්නේ ඒ ඉන්සර්විස් ට්‍රේනිං ක්‍රමය ඊට වැඩිය පුළුල් කරලා ගුරුවරුන්ට ලබා දෙන ඒ යල් පැනපු දැනුම සහ යල් පැනපු ඉගැන්වීමේ ක්‍රම වෙනුවට අද යුගයට සරිලන පරිදි ඒ ගුරුවරුන්ට අවශ්‍ය දැනුම සහ අවශ්‍ය නව ඉගැන්වීමේ ක්‍රම සපයන්නට. අපි අදහස් කළේ ඒකයි. ඒ වාගේම අපේ ප්‍රකාශයේ දී කිව්ව දෙයක් පිළිබඳව විටින් විට ගරු මන්ත්‍රීවරුන්ගෙන් අදහස් කීපයක් ඉදිරිපත් වුණා, ජනතාවට වැඩි බදු බර පටවන්නේ නැතුව, පළාත් සභාවේ ආදායම් වැඩි කර ගන්නේ නැතුව, පළාත් සභාවේ ආදායම වැඩි කර ගන්නට බලාපොරොත්තු වෙනවා කියලා. එතනින් අපි අදහස් කළේ, ඇත්ත වශයෙන්ම ප්‍රධාන වශයෙන් දැනට පළාත් සභාවට නීතිය අනුව ලැබිය යුතු නමුත් තවමත් මහ ආණ්ඩුව එකතු කර ගන්නා ලද යම් යම් බදු - සමහර ඒවට බදු කියලා කියන්න බෑ. ස්ථානීය දඩ, උසාවි දඩ, බදු නෙවෙයි. යම් යම් ආදායම් මාර්ග හැකි ඉක්මනින් ලබා ගැනීමට දැනටමත් අවශ්‍ය කටයුතු කරලා තියෙනවා. ඒ වාගේම තව බී.ටී.ටී. වශයෙන් පළාත් සභාවට නීතිය අනුව ලබා ගන්න පුළුවන් යම් දේවල් ලබා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රඥප්ති සකස් වෙලා නැහැ. සුළු සුළු අංශ තියෙනවා. ඒ සඳහා දැනටමත් ප්‍රඥප්ති සකස් කරලා ඇමති මණ්ඩලයෙන් අනුමත කරලා තියෙනවා. ඒ ආකාරයෙන් ලබා ගන්න, ආදායම වැඩි කර ගන්නට බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම මහින්ද සමරසිංහ ගරු මන්ත්‍රීතුමා අනුරූපිත ප්‍රදාන, සඳහන් කළා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අනුරූපිත ප්‍රදාන එකක්වත් මේ මුළු පළාත් සභාවේ ජීවිත කාලය ඇතුළතම ලැබිලා නැහැ. අපි



6 – H 19760

ඩොක්ටර් සල්ගාදු වාර්තාව සකස් කරපු සල්ගාදු මහත්මයට නිග්‍රහ කරන්න නොවෙයි අදහස් කළේ. නමුත් ඒ වාර්තාවෙන් යෝජනා කරන ලද පරිදි ඒ මැචින් ග්‍රාන්ට් - මේ මුළු මහත් සභාවටම එදා සිට අද දක්වාම ලැබිල නැහැ. 1993 වර්ෂය භාර මේ දක්වා 1992 අන්තිම දක්වා ලැබෙන්නට තියෙනවා, දස ලක්ෂ 630ක්. සතයක්වත් ලැබිලා නැහැ. හැම අවුරුද්දේම පොරොන්දු වෙනවා දෙනවා කියලා. මේ වර්ෂයේ දීත් පොරොන්දු වුණා. ඒ වාගේම මහින්ද සමරසිංහ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, මේ වර්ෂයේ අපි ආදායම් අඩු කර ගන්නට නාස්තිය වැනි දේවල් අඩු කරන්න බලාපොරොත්තු වෙනවයි කිව්ව දේ පිළිබඳව. එතුමා ප්‍රකාශ කළා දස ලක්ෂ 5000ක් ඒ කියන්නේ, මිලියන 500ක් මේ වියදම් වලින් වැඩි වෙලා තියෙනවා කියලා. ඇත්ත. ඒ මිලියන 500න් 459ක්ම වැඩි වෙලා තියෙන්නේ අර 30% පඩි වැඩිවීම් නිසයි. ඒක අපේ වැරැද්ද නෙවෙයි. අපි ඒ 30% ට විරුද්ධ නැහැ. අපේ හිතුමතේට පඩි එහෙම වැඩි කර ගෙන නෙවෙයි. ඇත්ත වශයෙන්ම මා ඉතාමත් සතුටු වෙනවා ටයිටස් විමලසිරි මන්ත්‍රීතුමාත්, විපක්ෂ නායකතුමාත් සඳහන් කළා, පළාත් සභාවට ලබා ගත යුතු බලතල සාධාරණීයව ලබා ගැනීමේ දී අපට එතුමන්ලාගේ සම්පූර්ණ සහයෝගය ලබා දෙනවයි කියලා.

මේ අවස්ථාවේ දී මතක් කරන්න කැමතියි, පළාත් සභා ක්‍රමය තමුන්නාන්සේලා පුන පුනා ඇහුවට තමුන්නාන්සේලාට වඩා බලය විමධ්‍යගත කිරීම ගැන විශ්වාස කරන අපි පළාත් සභාව හෝ - එයට මොන නම කිව්වත් අපිට කමක් නෑ, මේ ක්‍රමය හරියාකාරව ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය බලතල ලබා ගැනීමට නීතිය තුළ අපි ක්‍රියාත්මක වීමට කිසිසේත් පැකිලෙන්නේ නැහැයි කියලා ඔබතුමා මගින් ගරු මන්ත්‍රීවරුන්ට මතක් කරනවා. අපේ පළාත් පාලන ඇමතිතුමා නීතියේ පිහිට පතලා තිබෙනවා. සාධාරණීයව යුක්තිගරුකව ප්‍රජාතන්ත්‍රවාදීව මේ බලය විමධ්‍යගත කිරීමේ බලය බෙදාහැරීමේ ක්‍රමය හරියාකාරව ක්‍රියාත්මක කිරීමට අපි කළයුතු සියල්ල දේශපාලන වශයෙනුත්, නීතිමය වශයෙනුත් කරන බව මේ ගරු සභාවට මේ අවස්ථාවේදී මතක් කරන්න කැමතියි. අන්තිම වශයෙන් අපේ ටයිටස් විමලසිරි මන්ත්‍රීතුමා බොහොම කණගාටු වුණා එතුමාගේ කාලය මා ගත කිරීම පිළිබඳව. මා පළමුවෙන්ම සතුටු වෙනවා දිවයින පත්‍රයේ බොහෝම ලොකුවට විනාඩි 20ක ප්‍රමාදයක් දැමීම ගැන. ඒක බොහොම ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් අපේ කිසිම තරහක් නැහැ. අපි එතුමාව ටයර් එකක් උඩින් යවන්නේ

නැහැ. එහෙම නැත්නම් ගරු පිලික්ස් පෙරේරා මන්ත්‍රීතුමාගේ ගම් ප්‍රදේශයේ කවුදෝ ප්‍රවෘත්ති පත්‍ර කලාවේදියෙක් මෝටර් සයිකලයක මරා දමා තිබුණා වාගේ, එහෙම දේවල් අපි කරන්නෙත් නැහැ. මොකක්ද පිංතූරයක් ගත්ත කියලා අපරාධයක් වෙන්නේ නැහැනේ. නමුත් අපි මතක් කරන්න කැමතියි, එදා මේ පළාත් සභාවේ ඒ සුළු ප්‍රමාදය ඇති වූ වෙලාවේම, ඒ ගැන මගේ කණගාටුව ප්‍රකාශ කරන අතර, එදාම හවස් වරුවේ ගරු ජනාධිපතිතුමා පැය තුනක ප්‍රමාදයක් ඇතිව කොළඹ දිස්ත්‍රික්කයේ තිබුණු උත්සවයකට ගියා. ඊට සතියකට පෙර මේ රටේ අගමැතිතුමා එතුමාගේ බියගම ආසනයේ පිරිත් දේශණායකට පැය දෙකහමාරක් පරක්කු වෙලා ගිහිල්ලා තියෙන්නේ. එතුමා යනකොට හාමුදුරුවරු අකුලගෙන ගිහිල්ලා. ඒ නිසා අපි ඒ ගැන තමුන්නාන්සේලාට අවශ්‍ය නම් විස්තර ලබා දෙන්නම්. හෙට මගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ සාකච්ඡාවේදී අපේ වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් මීට වැඩිය විස්තර සාකච්ඡා කරන්න ලැබෙන නිසා ඔබතුමාට මගේ ස්තුතිය ප්‍රකාශ කරනවා, මට මේ වේලාව ලබාදීම සම්බන්ධව. එසේම මා කණගාටු වෙනවා, මේ වාගේ උතුම් කටයුත්තක් අපි සියලු දෙනාම එකතු වෙලා මේ සභාවේ කරන අවස්ථාවක දී දෙපැත්තේම මන්ත්‍රීවරු මේ ආකාරයට හැසිරීමෙන් අපි සියලු දෙනාගේම කාලයෙන් විශාල ප්‍රමාණයක් විනාශ කිරීම පිළිබඳව. අන්තිම වශයෙන් අපට මේ මුදල් ප්‍රකාශය ඉතා සාර්ථක ලෙස සකස් කරලා ඉදිරිපත් කරන්නට සහාය වුණ පළාත් සභාවේ ප්‍රධාන ලේකම්තුමාටත්, මුදල් අංශයේ කටයුතු කරන සියලු දෙනාටත් පළාත් සභාවේ සියලුම සේවකයින්ටත් මගේ අවංක ස්තුතිය පුද කරමින් මා මින් නවතිනවා.

කල් තැබීමේ යෝජනාව

**ගරු නියෝජ්‍ය සභාපති රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමා**

දැන් එම සභාව කල් තැබිය යුතුයැයි යෝජනා කරනවා.

පළාත් සභාව ඊට අනුකූලව .........

## 1994 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විවාදයේ දී සිය අමාත්‍යාංශය වූ ප්‍රධාන අමාත්‍ය, නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, අධ්‍යාපන, රැකීරක්ෂා සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ වැය ශීර්ෂ පිළිබඳ විවාදයේ පිළිතුරු කථාව 1993.10.13 දින පවත්වමින් .........

ගරු සභාපතිතුමනි, ප්‍රධාන අමාත්‍ය, නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, අධ්‍යාපන, රැකීරක්ෂා සහ සංස්කෘතික කටයුතු, යනුවෙන් මගේ අමාත්‍යාංශය යටතේ වැය ශීර්ෂයන් රාශියක් තිබුණත්, ඉන් ප්‍රධාන වැය ශීර්ෂය වන අධ්‍යාපන විෂය පිළිබඳවයි මා වැඩිමනත් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ. ඊට පෙර මා පළමුවෙන්ම සිහිපත් කළ යුතු කාරණාවක් තියෙනවා. ගරු සභාපතිතුමනි, 1988දී පළාත් සභා ක්‍රමය ස්ථාපිත කොට බස්නාහිර පළාත් සභාව ඇතුළුව අනිකුත් පළාත් සභා ආරම්භ කරන අවස්ථාවේ දී, බස්නාහිර පළාත් සභාවේ හිටපු ප්‍රධාන අමාත්‍යතුමා අපේ වත්මන් විපක්ෂ නායකතුමා ඇතුළු පළාත් සභාවේ හිටපු ඇමති මණ්ඩලයත්, නිලධාරී මණ්ඩලයත්, ඒ අවුරුදු 05 තිස්සේ පළාත් සභා ක්‍රමය ගොඩ නඟමින්, එහි යම් යම් දුර්වලකම් තිබුණත් මේ දක්වා ඒ ක්‍රමය රැක ගනිමින් කටයුතු කර තිබෙනවා. පළාත් සභාවට සම්බන්ධ සියලුම ආයතන රාශියක් මැද්දේ, විශේෂයෙන් භීෂණ කාලයේ දී ගරු පළාත් සභා මන්ත්‍රීවරුන් හා ඊට සම්බන්ධ සෙසු අයව පවා මරා දමමින් යන යුගයේ දීත්, මේ පළාත් සභා ක්‍රමය සාර්ථකව ඉදිරියට ගෙන යන්නට පුළුවන් ක්‍රමයක් ගොඩ නගලා අපට බාරදීම ගැන මා පළමුවෙන්ම හිටපු ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත් ඒ කටයුතු කරපු නිලධාරී මහත්වරුන්ටත් මාගේ අප කණ්ඩායමේ ස්තුතිය ප්‍රකාශ කරනවා. ගරු සභාපතිතුමනි, මා මේ කරන ප්‍රකාශය මෙතැනට සම්බන්ධ නොවුනත් මා යමක් පැහැදිලි කරන්න කැමතියි. මීට පෙර කථා කළ සුරනිමල රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා සිය කථාවේ දී සඳහන් කළා, ඉන් පසුත් විජය කුමාරතුංග

මැතිතුමාගේ අභාවයෙන් පසු මා පිටරට ගිය වෙලාවේ දී පළාත් සභාවට මහජන පක්ෂයෙන් පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වුණා කියලා. පොඩි නිවැරදි කිරීමක් පමණයි මා කරන්නේ. මොකද, මම හැම අවස්ථාවක දී ම ගරු මන්ත්‍රීවරුන්ගේ කථාවලට බාධා කරන්න යන්නේ නැහැ. මගේ අවස්ථාව එනතුරු තමයි මා බලා සිටියේ. ගරු සභාපතිතුමනි, පළාත් සභා මැතිවරණයේදී ජනතා විමුක්ති පෙරමුණ විසින් එක් ප්‍රධාන ඉලක්කයක් හැටියට මගේ නමත් සඳහන් කරද්දී තමයි මා ගමෙන් ගමට, දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට ගිහිල්ලා ශ්‍රී ලංකා මහජන පක්ෂයත් එවකට සන්ධානගතව තිබුණු එක්සත් සමාජවාදී පෙරමුණත් දිනවන්නට ඡන්දය කරලයි මම ලංකාවෙන් පිට වූයේ. මන්ත්‍රීවරුන් එකසිය ගණනක්ම ජයග්‍රහණය ලබා දීලයි මා විදේශ ගත වූයේ. මම අස්වුණේ නැහැ. ප්‍රේමදාස මහත්තයාගේ සල්ලි අරගෙන අපව එලෙව්වේ හිටපු අයයි. ගරු සභාපතිතුමනි, මා මේ නිවැරදි කිරීම කළේ, එතුමාගේ දැන ගැනීම පිණිසයි.

ගරු සභාපතිතුමනි, එවැනි මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදයේ දී මා අවධාරණය කරන්න කැමතියි, නීතිය හා සාමය කියලා විෂය ශීර්ෂයක් මාගේ අමාත්‍යාංශය යටතේ තිබුණත්, ඒ ගැන මම වැඩි වෙලාවක් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැති බව. ඒ පිළිබඳව කථා කරන්න දෙයක් නැහැ. මොකද, අපට බාර දීලා ඇති දෙයකුත් නැති නිසා.

විශේෂයෙන් නීතිය හා සාමය පිළිබඳ අපට ලබා ගත යුතු බලතල මොනවා ද කියලා මේ සභාවට මම සඳහන් කළ යුතු නැහැ. අපි සියළු දෙනාම දන්නවා විපක්ෂ නායකතුමා එතුමාගේ කථා කීපයක දීම සඳහන් කළා, මෑත අනාගතයේ දී අපට ලැබිය යුතු, ලබාගත යුතු ඒ බලතල සියල්ල තමුන්නාන්සේලා අපි සියළු දෙනාම එකට එකතුව ලබා ගැනීමට අවශ්‍ය කටයුතු ආරම්භ කරමුයි කියලා. ඒ අනුව, අපි බලාපොරොත්තු වෙනවා, ඒ බලතල ලබා ගන්න කටයුතු කරන්න. එතැන දී අපි විශ්වාස කරනවා, ගරු සභාපතිතුමනි, මෙතුමන්ලාගේ සහයෝගය අපට සම්පූර්ණයෙන් ලැබේවි කියලා. මෙය අපි පුද්ගලිකව ලබා ගන්න ජයග්‍රහණයක් නොවෙයි. මෙතුමන්ලා අපි සියළු දෙනාටම පළාත් සභා ක්‍රමය වෙනුවෙන් ලබා ගත හැකි දෙයක්. මා අවංකව හිතනවා එය දේශපාලන වාසියක් ගන්න කියන දෙයක් නොවෙයි කියලා.

ඇත්ත වශයෙන් ම පළාත් සභා පනත යටතේ යම් පොලිස් බලතල පමණයි පළාත් සභාවට බාර දීලා තියෙන්නේ. එක්තරා මට්ටමක සිට පහළට. ඒ තරම්වත් පළාත් සභාවලට පොලිස් බලතල විමධ්‍යගත කොට ලබා දෙනවා නම් සමහර විට හුඟාක් දුරට පොලිසිය වැනි ආයතනවලින් ජනතාවට කෙරෙන අසාධාරණකම් අඩු කරන්නට එය හේතුවක් වෙන්න පුළුවන්.

ගරු සභාපතිතුමනි, මධ්‍යම ආණ්ඩුව පමණක් මේ බලතල සියල්ල ඒකරාශී කර ගෙන තියාගෙන ඉන්නවා වෙනුවට පළාත් සභා 09කට එක්තරා මට්ටමක සිට ඒ බලතල බෙදා දෙනවා නම් ඇත්ත වශයෙන් ම බලය විමධ්‍යගත වීමෙන්, බලය එකතැනක කේන්ද්‍රගත වෙන්නේ නැතුව පැතිර යෑමෙන් එවැනි අසාධාරණකම් බලපුළුවන්කාරකම් සිදුවීම අඩු වන්නට ස්ථිරව හේතුවක් ඇති වෙනවා. ඒ අතරතුරේදී දැනට අපට බලතල නොතිබුණත්, මේ රටේ සිදුවුණ යම් අසාධාරණකම් පිළිබඳ සඳහන් කරන්න මේ පළාත් සභාවේ දී අපි බලාපොරොත්තු වෙනවා. එහෙම පටන් ගත්තොත් මාගල දිග ඇරියා වාගේ ලැයිස්තුවක් ගැන ප්‍රකාශ කරන්න වෙනවා. නමුත් අඩු තරමින් ප්‍රධාන වශයෙන් ජනතාවගේ අවධානයට ලක්වුණු කරුණු කීපයක් ගැන ප්‍රකාශ කරන්න අපේක්ෂා කරනවා. විජය කුමාරතුංග මැතිතුමාගේ ඝාතනය පිළිබඳ අද වනතෙක් කිසිම පරීක්ෂණයක් පවත්වලා නැහැ. ලලිත් ඇතුලත්මුදලි මැතිතුමාගේ ඝාතනය පිළිබඳවත් ඒ වගේම මේ රජය විසින් කිසිම පරීක්ෂණයක් හරියාකාරව පවත්වලා නැහැ. ඒ සම්බන්ධව සුළු වශයෙන් පරීක්ෂණයක් පැවැත්වූවා. ඒ වාගේම අධිකරණයේ තීන්දුවක් තියෙද්දීත් නීත්‍යානුකූලව දිවිරුම් දියයුතු දකුණු පළාත් මහ ඇමතිවරයාට දිවුරුම් දීමට ඉඩ සලසන්නේ නැතුව ඒ පළාත් ආණ්ඩුකාරතුමා දවස් ගණනක් හැංගිලා ඉඳලා අන්තිමේදී එතුමා ඉදිරියේ දිවුරුම් දුන්නාට පසුව ඇති වූ සිද්ධියක දී පොලිසියෙන් දෙන්නෙකුට වෙඩි තියල මැරීමේ සිද්ධිය පිළිබඳව අපක්ෂපාත පරීක්ෂණයක් ඉල්ලා සිටීමට අපි බලාපොරොත්තු වෙනවා. අපේ රටේ පසුගිය කාලයේ සිදු වුණු මහා අසාධාරණකම් දසදහස් ගණන, එක එක ගත්තේ නැති වුණත් ඒවා සංකේතවත් කරන දේවල් හැටියට අපි දකින බවට දැනුම් දීමට කැමැත්තෙමි. ඉන් පසුව මා අධ්‍යාපනය පිළිබඳ කරුණු කීපයක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා.

මම හිතන හැටියට සුපිත් කුරේ ගරු මන්ත්‍රීතුමා සිය කථාවේ දී ප්‍රකාශ කළා 1994 මුදල් වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කළ අපේ වැඩ පිළිවෙළ් අයවැය ලේඛණයේ තිබෙන අදහස් එකක්වත් අළුත් ඒවා නොවෙයි කියලා. ගරු සභාපතිතුමනි, අපට කවුරුත් නොකරපු දේවල් කරන්න විශේෂ අවශ්‍යතාවයක් නැහැ. අපට අවශ්‍යකම තියෙන්නේ බස්නාහිර පළාතේ ජනතාව අපෙන් බලාපොරොත්තු වන සංවර්ධනය, සාධාරණය, යුක්තිය ඉටු කිරීමට පමණයි. අළුත් පරණ වුණාට අපට කමක් නැහැ. නමුත් අපි අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් යම් දියුණු වැඩ පිළිවෙලක් ජාතික වැඩ පිළිවෙළක් කරන්න (බාධා කිරීමක්) බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, මම මේ කියන දේ එසේ නොවෙයි කියලා ගරු මන්ත්‍රීවරුන්ගේ කවුරු හරි කියනවා නම්-පසුගිය දශක කීපය ඇතුළත මේ රටේ ඇතිවුණු විනාශයන් අතරින් එක් ප්‍රධාන බේදවාචකයක් තමයි මේ රටේ ජනතාවගේ සංවර්ධන කටයුතු සහ අභිකූත් පරිපාලනමය කටයුතු කර ගෙන යාමට, - පරිපාලන සේවයේ නිදහස් නිවහල් භාවය නැති වීමයි. මා ඒ අංශය ගැන විතරයි මේ අවස්ථාවේදී කථා කරන්නේ.

නියමාකාරව ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රටක නම්, ජනතාව නියෝජනය කරන පාර්ලිමේන්තුව, පළාත් සභා යන ආයතනවල ප්‍රාදේශීය සභා නියෝජිතයින් සිටින ආයතනත් පරිපාලන සේවයත්, අධිකරණයත් කියන මේ අංශ තුන ප්‍රධාන ආයතන තුනකි. මා හිතන හැටියට ස්වාධීනව වෙන් වෙන්ව කටයුතු කළ යුතුයි. ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වුණු රටවල එය එහෙම සිදු වුණා. මේ රටේත් සෑහෙන කායලයක් එහෙම සිදු වුණා. 1977 දක්වා එහ හරියට ක්‍රියාත්මක වුණා. (බාධා කිරීමක්) ඒ පිළිබඳව අපි කරුණු සහිතව ලබා දෙන්නම්. කෙසේ වෙතත් 1977න් පස්සේ යම් වැරදි, ක්‍රම ක්‍රමයෙන් සිදු වුණා. නමුත් අද ඒවා සිරිතක් වශයෙන් නිතර නිතර කරන පුරුද්දක් වශයෙන්, ක්‍රමයක් වශයෙන් පසුගිය අවුරුදු 16 ඇතුළත පරිපාලන සේවයේ සහ අධිකරණයේ ස්වාධීනත්වය මරා දැමීමට කුමන්ත්‍රණ මේ රටේ ක්‍රියාත්මක වී තිබෙනවා. අනික් අංශ ගැන මේ අවස්ථාවේදී කථා කරන්න වෙලා නැති නිසා මා ඒවා ගැන කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත් පරිපාලන සේවය 1977 න් පස්සේ දේශපාලන බලවතුන්ට එසේය හාමුදුරුවනේ, කියන නොකියන පරිපාලන සේවයේ නිලධාරීන් කවුද කියලා අවශ්‍ය නම් පෞද්ගලිකව මම මේ සභාවට ඒ නම් ඉදිරිපත්

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

කරන්න කැමැතියි. එක අවුරුද්දක් ඇතුළත මාරුවීම් 12ක්, 15ක් ලබා ගත්ත අය අනන්තයි, අප්‍රමාණයි. මේ තත්ත්වය බස්නාහිර පළාතේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ හා අනික් තැන්වල නැහැ. මම බස්නාහිර පළාත තුළ මෙය තදබල ලෙස, භයානක ලෙස පැවතුණා. විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් මේ දේශපාලන බලපෑමට ඉතාමත් භයානක විධියට යටවුණා. ඇත්ත වශයෙන්ම මීට පෙර කථා කරන ලද හිටපු අධ්‍යාපන ඇමතිතුමා මා හැමතැනම කරන ප්‍රකාශයක නියම අරුත වටහා ගෙන නැති නිසාද එහෙම නැත්නම් වටහා ගන්න කැමති නැති නිසා ද, එහෙම නැත්නම් එය තේරුම් ගන්න අපහසුවද අකමැත්ත ද කියලා කියන්න මම දන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, මා දැනුම් දෙන්නට කැමැතියි මේ සභාවට, දේශපාලන බලපෑම් කියන එකත්, දේශපාලනය කියන එකත් දෙකක් කියලා. අපි පරිපාලනය කරන සෑම අවස්ථාවකම දේශයයි පාලනය කරන්නේ, අපි කරන්නේ දේශපාලනයයි. නමුත් ලෝකයේ ඕනෑම පිළිගත් දේශපාලන විද්‍යාව දන්න කෙනෙක් දන්න දෙයක්, මම පොත් ගෙනල්ලා පෙන්වන්නම් එතුමාට. දේශපානය කියන්නේ, අපි අධ්‍යාපනය ගැන පොදුවේ කථා කළොත් පාරේ යන කෙනෙක් හරි අධ්‍යාපන ප්‍රතිපත්තිය ගැන කථා කළොත් ඒක දේශපාලනයට සම්බන්ධ දෙයක්. නමුත් දේශපාලන බලපෑම් සහ දේශපාලන පලිගැනීම් කියන්නේ වෙනත් දෙයක්. දේශපාලන පලිගැනීම දේශපාලනමය හේතු මත දේශපාලන පක්ෂවලට තිබෙන සම්බන්ධකම් උඩ එක් කොටසක් විසින් තවත් කොටසකට අවාසි වන ආකාරයට බලපෑම් කිරීමයි. දේශපාලන බලපෑම් හෝ පළිගැනීම් කියලා කියන්නේ එයටයි. දේශපාලන නිදහස, මානව අයිතිවාසිකම් ගරු කරන අය හැටියට අපි විශේෂයෙන් මා පැහැදිලිව හැමතැනම එය මෙය ප්‍රකාශ කරලා තියෙනවා. ඒ සම්බන්ධයෙන් අපි කරපු දේවල් කියන්නම්.

අපේ යටතේ සිටින අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ සේවය කරන 34,000ක් පමණ වන ගුරුවරුන්ටත් තව දෙතුන්දාහක් පමණ වන නිලධාරීන්ටත් කිසිම දේශපාලන බලපෑමක් නැතුව කටයුතු කිරීමට අවස්ථාව, පසුබිම අවශ්‍ය විධිවිධාන පරිපාලනමය නිදහස අප ලබා දීලා තියෙන්නේ. සියලුම නිලධාරීන්ට මා නියෝග කර තිබෙනවා. කිසි කෙනෙකුගේ දේශපාලනය කුමක් ද කියලා බලන්න එපා කියලා. සේවය කරන පැය අට ඇතුළත පක්ෂය, පාට, ලකුණ කුමක් ද කියා බලන්නේ නැතුව සේවය කරන්න කියල තමයි මම කියා තිබෙන්නේ. ඒ අය ගෙදර ගියාට පස්සේ මොන

දේශපානය කළත් මට ප්‍රශ්නයක් නැහැ. දේශපාලන බලපෑම් මත මේ මාස 4 1/2 ඇතුළත කිසිම ගුරුවරයෙකුටවත් විදුහල්පතිරයෙකුටවත් කිසිම මාරුවීමක් දීලා නැහැ. මම එක උදාහරණයක් පමණක් කියනවා. සුරනිමල රාජපක්ෂ මන්ත්‍රීතුමා පිටිපන මහා විද්‍යාලය ගැන කථා කළා. අද වනතෙක් මම දන්නේ නැහැ මහා විද්‍යාලයේ හිටපු විදුහල්පතිගේ දේශපාලනය මෙකක්ද කියලා. ඔහු කවුද කියලා දන්නේත් නැහැ. පිටිපන මහා විද්‍යාලය පර්ශද මධ්‍යස්ථානයක්, දෙමව්පියන් සහ පාසල් සංවර්ධන සමිතිය ඉතාමත් සාධාරණ අදහස් අපට ඉදිරිපත් කළා. තුන්වෙනි ශ්‍රේණියේ විදුහල්පති කෙනෙක් කටයුතු කළා. පර්ෂද මූලස්ථානයකට තුන්වෙනි ශ්‍රේණියේ විදුහල්පති කෙනෙක් පත් කරන්නේ නැහැ. සාමාන්‍යයෙන් තුන්වෙනි ශ්‍රේණියේ විදුහල්පතිවරු ප්‍රාථමික කණිෂ්ඨ විද්‍යාලවලට පත් කරන්නේ. අපෙන් ඉල්ලීම කළ කව්රු වුණත් කමක් නැහැ සියළුම මන්ත්‍රීවරුන්ට මම පැහැදිලිව කියලා තියෙනවා කිසිම දේශපාලන හේතුවක් මත, අර පක්ෂය මේ පක්ෂය නිසා මාරු කරන්නවත් පත්වීම් දෙන්නවත් කියන්න එපා කියලා. සමහර මන්ත්‍රීවරු මා එක්ක තරහා වෙලත් තියෙනවා. නමුත් දැන් සාධාරණ බව පිළිගන්නවා. මේ දක්වා එහෙම කරලත් නැහැ. ගරු සභාපතිතුමනි, අපෙන් ඉල්ලීම කළේ, පළමුවැනි ශ්‍රේණියේ විදුහල්පති කෙනෙක් දෙන්න කියලා. අපි පළමුවැනි ශ්‍රේණියේ විදුහල්පති කෙනෙක් පත් කළා. නමුත් ඒ ගමේ ජනතාවගෙන් ප්‍රශ්ණයක් ආවා. ඒ පත් කරපු විදුහල්පති පිළිබඳව නොවෙයි. හිටපු කෙනා යැවීම පිළිබඳ ප්‍රශ්ණයක් ආවා. අපි නැවත වතාවක් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් යවලා ගමේ ජනතාව සමඟ දෙමව්පියන් සමග සාකච්ඡා කරලා, අධ්‍යාපන පරිපාලන සේවයේ තුන්වැනි ශ්‍රේණියේ ඒ කියන්නේ, අර දෙන්නාටම වැඩිය ඉහළ ශ්‍රේණියේ කෙනෙක්ව විදුහල්පති හැටියට පිටිපන මහා විද්‍යාලයට පත් කළා. අද වනතෙක් ඒ මනුස්සයාගේ පාට, හැටි, පක්ෂයවත් මම දන්නේ නැහැ. ඒ වාගේම හිටපු අධ්‍යාපන ඇමතිතුමාගේ කථාවේදී ප්‍රකාශ වුණා. අත්තනගල්ල ආසනයට මධ්‍ය මහා විද්‍යාල එකක්වත් තිබුණේ නැහැ. මේ ආණ්ඩුවෙන් දෙකක් ලබා දුන්න කියලා. සම්පූර්ණයෙන් සත්‍යයෙන් තොර ප්‍රකාශයක්, මා කනගාටුයි කියන්න. වේයන්ගොඩ මධ්‍ය මහා විද්‍යාලය තිබුනේ, අත්තනගල්ල ආසනයට, පසුගිය රජයේ 1977ට පෙර තිබුණු රජයේ, ප්‍රතිපත්තියක් අනුව හැම ආසනයකටම හැම උපදිසාපති කොට්ඨාශයකටම අඩු තරමින් එක උසස් පාසලක් ලබාදීමේ ප්‍රතිපත්තිය මත වේයන්ගොඩ මධ්‍ය මහා විද්‍යාලය උසස් විද්‍යාලයක් බවට පත් කළා. පසුගිය රජය මෙම විදුහල

ඉතා දියුණු තත්ත්වයකට ගෙනාවා. 1970, 1977 කාලයේ දී වසර 04ක් නොකඩවා, රාජකීය, ආනන්ද, නාලන්ද, විශාඛා වැනි විද්‍යාල පරද්දවමින් වැඩිම ශිෂ්‍යයන් ප්‍රමාණයක් විශ්ව විද්‍යාලයේ කලා අංශයට විශ්ව විද්‍යාලවලට යැව්වා. මේ රජය බලයට ආපු ගමන් වේයන්ගොඩ මධ්‍ය මහා විද්‍යාලය දුර්වල කෙරෙව්වා. ඇයි ? බණ්ඩාරනායක මැතිනියගේ පාසල කියලා. අන්තිමට ඒක ආමි කෑම්ප් එකක් හැටියට බාර දෙන්න යනකොට අපි බොහොම අමාරුවෙන් සටන් කරලා බේරා ගත්තා. අද වේයන්ගොඩ මධ්‍ය මහා විද්‍යාලය පල්ලෙහා තත්වයක තියෙන්නේ. අවුරුදු 14ක් තිස්සේ අත්තනගල්ල ආසනයට මධ්‍ය මහා විද්‍යාලයක් තිබුණේ නැහැ. ඒක කඩල දුන්න මීරිගම ආසනයට අවුරුදු 14ක් තිස්සේ, අත්තනගල්ල ආසනයට මධ්‍ය මහා විද්‍යාලයක් තිබුණේ. අපි සියළු දෙනා ඉල්ලලා ඉල්ලලා අන්තිමට පසුගිය වර්ෂයේ හෝ ඊට පෙර වර්ෂයේ දී. ඌරපොල මහා විද්‍යාලය මධ්‍ය මහා විද්‍යාලයක් බවට නම් කළා. ඌරපොල මධ්‍ය මහා විද්‍යාලය විතරයි තවමත් තියෙන්නේ. දෙකක් නැහැ ගරු සභාපතිතුමෙනි, සංඝබෝධිය තවමත් මධ්‍ය මහා විද්‍යාලයක් බවට පත් කරලා නැහැ. කරන්න අදහස් කරලා විතරයි තියෙන්නේ. සංඝබෝධිය ජාතික පාසලක් කරල මධ්‍ය මහා විද්‍යාලයක් කරන්න යෝජනාවක් තියෙනවා තවම සිදු වෙලා නැහැ.

**ගරු සුරනිමල රාජපක්ෂ මන්ත්‍රීතුමා**

ඔබ තුමියට කවුරුහරි වැරදි ප්‍රකාශයක් කරලා තියෙන්නේ. එය මධ්‍ය මහා විද්‍යාලයක් බවට පත් කරලා තියෙන්නේ. හිටපු අගමැතිතුමා එය විවෘත කරලා.

**ගරු ප්‍රධාන අමාත්‍ය චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය**

ගරු සභාපතිතුමනි, මධ්‍ය මහා විද්‍යාලයක් බවට පත් කරන්න, යෝජනාවක් විතරයි තියෙන්නේ. කෙසේ වෙතත් ගරු සභාපතිතුමනි, එතුමාගෙන් ඊට වැඩිය ප්‍රධාන දෙයක් ප්‍රකාශ වුණා. ඌරපොල හිටපු විදුහල්පතිතුමාව දේශපාලන හේතූන් මත අසාධාරණ ලෙස මාරු කළාය කියලා. එහෙම කිසි දෙයක් සිදු වුණේ නැහැ. අත්තනගල්ල ආසනය මගේ ගම නිසා මම විශේෂ උනන්දුවක් දක්වනවා. දේශපාලන පළිගැනීම් කිසිවක් සිදු වන්නේ නැහැ. එය, අසාධාරණයි. දේශපාලන හේතූන් මත මම මාරු කරනවා නම්, ඇත්ත වශයෙන්ම අත්තනගල්ල

ආසනයේ විදුහල්තිවරු 90%ක් පමණ මාරු කරන්න ඕනෑ. එහෙම කිසිම දෙයක් මම කරලාත් නැහැ. කරන්න බලාපොරොත්තුවකුත් නැහැ. මම ප්‍රකාශ කරන පරිදි, විහුහල්පතිවරු හරියාකාරව සිය රාජකාරි කටයුතු කරනවා නම්, අපෙන් කිසිම බාධාවක් නැහැ. හිටපු විදුහල්පතිතුමාව, මාරු කළේ ඇයි ?. මට ශිෂ්‍යයන්ගෙන්, ශිෂ්‍ය නායකයන්ගෙන් ලිඛිත ඉල්ලීම් තිබුණා. පාසල් සංවර්ධන සමිතියෙන් දෙමව්පියන්ගෙන් ලිඛිත ඉල්ලීම් තිබුණා මේ විදුහල්පතිවරයාව මාරු කරන්න කියලා. එසේ මාරු කරන්න ඉල්ලුවේ මොන හේතුවකටද කියන්න මම දන්නේ නැහැ. එතකොට එයාගේ හැටිවත් නමවත්, ගමවත් මම දන්නේ නැහැ. මෙතුමා ශිෂ්‍යයන්ට කුලය මතක් කරලා බනිනවා. කක්කුස්සිවල දාගෙන වේවැල් වලින් ගහලා එක ශිෂ්‍යයෙක්ට සුමාන දෙකක් තිස්සේ බෙහෙත් ගන්න සිදු වුණා, අන්තිමට ශිෂ්‍යයන් බැරිතැන විදුහල්පතිතුමා පාසලට එනකොට රතිඤ්ඤා පත්තු කළා. පාසලෙන් යනකොට රතිඤ්ඤා පත්තු කළා. ඔවුන්ගේ විරුද්ධතාවය වෙන ක්‍රමයකට ප්‍රකාශ කරන්න ගත්තා. අන්තිමට මම තීන්දුවක් ගත්තා මෙතුමාට හානියන් නොවන පරිදි, එතුමාගේ ශ්‍රේණියේ පල්ලෙහාට දාන්නේ නැතුව වේයන්ගොඩ විදුහලේ තිබෙන විදුහල්පති හැටියට පත් කළා. එතුමා උඟුරපොල මහා විද්‍යාලයේ විදුහල්පති වෙලා හිටියට, එතුමාගේ ශ්‍රේණිය අනුව වේයන්ගොඩ මධ්‍ය මහා විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති හැටියට ඒ ශ්‍රේණියේම තනතුරකට පත් කළේ, හැතැප්ම 5ක් විතර වෙනසක් තිබෙන නිසයි. එහෙම පත්කළේ එතුමාට යන්න පහසුව මතයි. මේ කතන්දරය සිදුවෙන කොට, පසුව මම සොයා බැලුවා එතුමාගේ ගම ඒ කිට්ටුවමයි. ඇත්ත වශයෙන්ම, මම මෙතන මෙය ප්‍රකාර කරන එක හොඳද මම දන්නේ නැහැ. මෙතුමාම අපේ නිලධාරී මහත්තයෙකුට ටෙලිපෝන් කරලා කීවා අපෙන් ඉල්ලුවා කිරිදිවැල මහා විද්‍යාලයට දාන්න පුලුවන් ද කියලා. අපි එසේ පත්කර යවන්න සූදානම් වනකොට මෙතුමා කිව්වා කරුණාකරලා මගේ ආසනයට නම් එවන්න එපා. මෙය හොඳ නැහැයි කියලා. දැන් එතුමා ගැන තමුන්නාන්සේ කෑ ගහනවා ද ?. කිරිඳිවැල මහා විද්‍යාලයට අපි දාන්න ලෑස්ති වනකොට එපා කිව්වා. ඔබතුමාගේ ඒ ඉල්ලීමට ගරු කරමින් මම තීන්දුවක් ගත්තා. එහෙනම් කිරිදිවැල මහ විද්‍යාලයට යවන්න එපා, වේයන්ගොඩ මධ්‍යම මහා විද්‍යාලයට යවන්න කියලා. පුරප්පාඩුව තිබුණා එතැනයි. අපි කටයුතු කළේ ඒ ආකාරයටයි. අදත් එතුමා ඉන්නාවා. එතැන නොවෙයි. එතුමා වේයන්ගොඩටත් යෑමට විරුද්ධ වුණු නිසා එතුමාගේ ඉල්ලීම මත, හැම විදුහල්පතිවරයෙකුම ඉල්ලන තනතුරක් දීලා හොඳට

ඉන්න සැපට ඉන්න පුළුවන් විධියට අධ්‍යාපන කොට්ඨාශ කාර්යාලයට අපි එතුමාට යන්න ඉඩ ඇරියා. එතුමාට ගම්පහ කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලයට පත් කළා. අන්න ඒ ආකාරයටයි අපි කටයුතු කළේ. එකම එක අවස්ථාවකවත් අප විසින් දේශපාලන හේතූන් මත අධ්‍යාපන අමාත්‍යාංශයේ ආසාධාරණ මාරුවීමක් හෝ උසස්වීමක් ලබා දීලා කියල කීවොත් මම මෙතුමා සමග ඒ පිළිබඳ විවාද කරන්න සූදානම්. අවශ්‍ය ඕනෑම දෙයක් කරන්නට සූදානම්, ගරු සභාපතිතුමනි. අපි අනුගමනය කරන ඒ ප්‍රතිපත්තිය මත ගුරුවරුන්ට යම් තත්ත්වයක් උදා වුණා කියලා, අපි විශ්වාස කරනවා. අපේ පළාතේ පමණක් නොවෙයි. මේ රටේ වටිනාතම ජන කොටස වන ශිෂ්‍ය පරපුර, ලෝකයේ කිසිම රටක නැති විධියට පසුගිය දශකය ඇතුළත මහා ඛේදජනක තත්වයකට භාජනය වෙලා තියෙනවා. ලෝකයේ වැඩිම මිනී මරපු රටක් හැටියට ලංකාව ප්‍රචලිත වෙලා තිබෙනවා. (බාධා කිරීමක්) එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ පවත්නා ආකාරයට පසුගිය අවුරුදු 10 ඇතුළත සංවිධානය වියැප්රාව හැර විසිවෙනි ශත වර්ෂයේම දේශපාලන හේතූන් මත වැඩියෙන්ම මිනිමරපු රට, ලංකාව හැටියට සඳහන් වෙනවා. එහෙම වාර්තාගත වෙලා තියෙනවා. මම නොවෙයි මේ කියන්නේ, එක්සත් ජාතීන්ගේ සංවිධානයයි. වියැප්රාවට පසු දෙවැනි තැන ගන්නේ ලංකාව. කෙසේ වෙතත් වියැප්රාවට පසුව වැඩිම ජන කොටසක් මරා දැමුවේ ලංකාවේ කියලා කියනවා. එක්සත් ජාතීන්ගේ වාර්තාවල එහෙම තිබෙනවා. මේ භීෂණයට ගොදුර වුණේ, අපේ තරුණ පරපුරය. අපේ පාසල්වලින් සමාජයට භාර කළා, තරුණ පරපුර විසින් භිෂණය ඇති කළා. තරුණ පරපුරට විරුද්ධව මේ රජයෙන් භීෂණය ඇති කළා, ගරු සභාපතිතුමනි, ඒ තරම් භයානක තත්ත්වයකට විසඳුම් සොයන්න නම්, අපේ අධ්‍යාපන ක්ෂෙත්‍රය පිළිබඳ වැඩිම අගනාම වගකීම කරගත යුතුයි. ඒ සඳහා ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන, භීෂණයට යොමු වෙන්නේ නැතුව, තමාගේ විරුද්ධතාවය පැහැදිලිව ප්‍රකාශ කරන්නට පුළුවන් වන තරුණ පරපුරක් සකස් කරන්න නම්, ඔවුන්ට නියම නායකත්වයක් දෙන්න නම්, අපට කොන්ද පණ තියෙන දේශපාලන නායකයින් අවශ්‍යයි. කොන්ද පණ තියෙන ගුරු පරපුරක් අවශ්‍යයි. තුවක්කුව බෝම්බය අරගෙන විරුද්ධතාවය ප්‍රකාශ කරන තත්ත්වයට තරුණ පුරපුර ගේන්න නැතුව ප්‍රජතන්ත්‍රවාදීව වහලය උඩට නැගල හෝ තමන්ගේ විරුද්ධතාවය ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා දෙන්නට කොන්ද කෙලින් තියෙන බලු කුක්කෝ වාගේ නකුට වනන්නේ නැති රජයේ සේවකයින්, විශේෂයෙන් ගුරු පරපුරක්, විදුහල්පති පරපුරක්

අපට අවශ්‍යයි. අන්න එවැනි දෙයක් අඩු තරමින් බස්නාහිර පළාතේ ඇති කරන්නට අපි ඇප කැප වන බව මේ අවස්ථාවේදී මේ ගරු සභාවට ඔබතුමාගේ මාර්ගයෙන් මම සඳහන් කරන්නට කැමතියි. ඒ සඳහා බස්නාහිර පළාතේ අධ්‍යාපන අමාත්‍යාංශයේ නොතිබුණ, දේවල් අපි ඇති කරලා තිබෙනවා. මාරුවීම්, උසස්වීම් අධ්‍යාපන අමාත්‍යාංශයේ මේ සම්බන්ධව සිදු කිරීමට කිසිම ක්‍රමයක් තිබුණේ නැහැ. ගරු සභාපතිතුමනි, ඒ සඳහා අපි ස්වාධීන නිවහල්, කොඳු ඇටය කෙලින් කර ගෙන කටයුතු කරන්නට හැකිවන ගුරු පරපුරක් ඇති කිරීම සඳහා පළමුවෙන්ම බස්නාහිර පළාතේ අවුරුදු 5කට පස්සේ ගුරු මාරු මණ්ඩලයක් අපි පත් කරලා තිබෙනවා. එක එක්කෙනාට ඕනෑ විධියට නොවෙයි දැන් ගුරු මාරු සිදුවන්නේ. මෙතෙක් කල් සිදු වුණා වාගේ ඒ ගුරු මාරු මණ්ඩල සාධාරණව ගුරුවරුන්ගේ ඉල්ලීම් සලකා බලා තමයි ඒවා සිදුවන්නේ. කිසිම බලපෑමක් අපෙන් නැහැ. සභාපතිතුමනි, ඒ වාගේම උසස්වීම් පිළිබඳ මෙතෙක් කල් හරියාකාර ක්‍රමයක් අපේ තිබුනේ නැහැ. සමහර පාසල්වල විදුහල්පතිවරු පත් කරලා තිබෙනවා උදාහරණයක් වශයෙන් කටුකුරුන්ද මහා විද්‍යාලයේ විදුහල්පති ශ්‍රේනියේ ගුරුවරු 07 දෙනෙක් සිටිද්දී උප ගුරුවරයෙක් විදුහල්පති වශයෙන් පත් කරලා තියෙනවා දේශපාලන බලපෑම් මත. මේ වාගේ අනන්ත අප්‍රමාණ උදාහරණ තියෙනවා. තමුන්නාන්සේගේ වෙලාව ගත කරන්න මෙතැන ඒවා කියන්නේ නැහැ. මෙවැනි දේවල් මින් ඉදිරියට සිදු වන්නේ නැති බව ඔබතුමාට ප්‍රකාශ කරනවා.

ඒ වාගේම මේ සභාවේ ප්‍රශ්න කිපයක් මතුවුණා. ගරු මන්ත්‍රීවරු කිප දෙනෙක්ම සඳහන් කළා පාසල් උත්සව සම්බන්ධ චක්‍රලේඛයක් පිළිබඳව. මා කනගාටු වෙනවා, සුරනිමල රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා ඒ චක්‍රලේඛයට විරුද්ධ වන කාරණාව මොකක්ද? මේ චක්‍රලේඛය නිසා මේ පළාතේ ගුරුවරු බෙදිලලු. දෙමව්පියෝ බෙදිලලු. ගම් බෙදිලලු. එවැනි සිද්ධියක් සිදුවීමට මේ චක්‍රලේඛය මොන කරුණුද හේතු පාදක වෙලා තියෙන්නේ මොනවාද කියලා මේ වනතෙක් කියලා නැහැ. ඒ චක්‍රලේඛයේ තියෙන්නේ මෙපමණයි. මින් ඉදිරියේදී පාසල්වල ශිෂ්‍යයන්ගේ සංගිත කණ්ඩායම් වැනි දේවල් පාසල්වල උත්සව වැනි දේවල්වලට හැර වෙන කිසිම දෙයකට පාවිච්චි කරන්න එපා කියලා. එ' චක්‍රලේඛයේ තියෙනවා. ඒකේ ගැටළුවක් නැහැ. ගරු සභාපතිතුමනි, මම දන්නවා ඒ කාලේ තිබුණට ක්‍රියාත්මක වුණේ නැහැ. ගරු සභාපතිතුමනි, අනන්ත අප්‍රමාණ අපේ පළාතේ විශේෂයෙන් මගේ ගමේ

උත්සව පැවැත්වුවා. දේශපාලනඥයෝ අළුතින් ඇමතිකම් ගත්ත කියල පාසල්වල ශිෂ්‍යයන් ලවා බෙර ගස්වමින් මේ ඇමතිවරයා පස්සේ පාර දිගේ ඒ ළමුන්ව ඇදගෙන ගියා. (බාධා කිරීමක්) මමවත් ඉල්ලන්නේ නැහැ. මම ආවමත් පාසල ඇතුලේ. තමුන්නාන්සේලාට අවශ්‍ය නම් කරනවා මිසක් පිට කොහේවත් ගෙනියන්න එපාය කියලා නියෝග කරලා තියෙනවා. දෙවැනි කරුණ අපි චක්‍රලේඛයෙන් ඉල්ලා සිටියා. මින් ඉදිරියට පාසල් උත්සව තියෙනවා නම් (බාධා කිරීමක්) තමුන්නාන්සේට පුළුවන් නම් කරුණාකරලා චක්‍රලේඛය මට දෙන්න. ඒ චක්‍රලේඛය මෙතැන නොකියපු එකයි මේ ප්‍රශ්නය. එතුමා දෙන්න කැමති නැත්නම් මේ සභාවට අපි චක්‍රලේඛය ඉදිරිපත් කරනවා. මම හිතන්නේ මෙහි තිබෙන තවත් කරුණක් අනුව එතුමාට හුගාක් අමාරු වුණේ, "පාසල් උත්සව සඳහා පාසල් කාර්ය මණ්ඩලය හා සිසු සිසුවියන්ට අමතරව පිටස්තර පුද්ගලයින්ට ආරාධනා කරන්නේ නම් ඒ සඳහා නියමිත දිනට මසකට කලින් එකී ඉල්ලීම අදාළ විදුහල්පති විසින් ඔබ වෙත නිර්දේශ කර ඒ කියන්නේ, කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂක වෙත නිරීක්ෂණ සමඟ ඉදිරිපත් කළ යුතුව තිබේ." මොකක්ද මෙහි තිබෙන වැරැද්ද? මේකෙන් කොහොමද ගම බෙදන්නේ? මේ චක්‍රලේඛයෙන් ගම බෙදෙන්නේ කොහොමද කියලා, මට නම් තේරෙන්නේ නැහැ. අපි ඇත්ත වශයෙන්ම අධ්‍යාපනය දේශපාලනයට යටවීමට විරුද්ධව, නැත්නම් දේශපාලන බලවතුන්ට යටවීමෙන් තොරව කටයුතු කිරීම ගැන පමණයි අපි කථා කරන්නේ. ඊළඟට ගරු සභාපතිතුමනි, මගේ අදහස් ඉදිරිපත් කිරීම අවසන් කරන්නට පෙර ටයිටස් විමලසිරි ගරු මන්ත්‍රීතුමා භාෂා ප්‍රශ්නය ගැන එකඟ වෙමින් අදහස් කීපයක් ඉදිරිපත් කළා. අපි එතුමාගේ ඒ අදහස්වලට ස්තුතිවන්ත වන අතර, ඒ භාෂා ඉගැන්වීමේ කටයුතු ජනවාරි මාසයේ සිට විධිමත් ලෙස ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බව මතක් කරනවා. ඒ වාගේම වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන, එක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට අඩු තරමින් දෙකක් වශයෙන්වත් පාසල් තෝරාගෙන පාසල් වේලාවෙන් පසුව හවස් වරුවේ මාස හයේ සහ අවුරුද්දේ පුහුණු වීම් පාඨමාලාවල් ලෙස පාසල් අතහැර යන්නන්ට ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බව නැවත වතාවක් මතක් කරනවා (බාධා කිරීමක්)

**ගරු මහින්ද සමරසිංහ මන්ත්‍රීතුමා**

ගරු සභාපතිතුමනි, මෙපමණ වේලා අපි බොහොම ඉවසිල්ලෙන් එතුමියගේ කථාව අහගෙන හිටියා. මම හිතන විධියට දැන් අපි විනාඩි 13ක් එතුමියට වැඩිපුර දීලා තියෙනවා. ඔබතුමාගේ නියෝගය එතුමිය පිළිපදින්නේ නැත්නම් මම හිතන්නේ නැහැ. මේ සභාවේ විනයක් කියල දෙයක් ඇති කරන්න පුළුවන් වෙයි කියලා. ගරු සභාපතිතුමා විනාඩි 02ක් වැඩිපුර ලබා දුන්නා. එය විනාඩි 02න් අවසන් කරන්න ඕනෑ. මෙහි මොකක් හරි විනයක් තියෙන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, අපි එතුමියට ගරු කරලා විනාඩි 13ක් දීලා තිබෙනවා. ඔබතුමාගේ නියෝගය එතුමිය පිළිපදින්න ඕනෑ.

**ගරු ප්‍රධාන අමාත්‍ය චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය.**

ගරු සභාපතිතුමනි, තව කථා කරන්න දේවල් රාශියක් තියෙනවා. ඔබතුමා මට මුලින් දීලා තිබුණේ පැය 1/2ක් නමුත් මන්ත්‍රීවරු සෑහෙන වේලාවක් මගේ කථාවට දිගින් දිගටම බාධා කළ නිසා මගේ වෙලාව දිග් ගැස්සුණා. ඒ අනුව මගේ පැය 1/2 ඉවර නැති නිසයි වෙලාව ඉල්ලුවේ. නමුත් කෙසේ වෙතත් ඔබතුමාගේ නියෝගයට ගරු කරමින් මගේ කථාව අවසන් කරන්නට පෙර කරුණු කිපයක් පිළිබඳව ප්‍රකාශ කරන්නට බලාපොරොත්තු වෙනවා. මුදල් ප්‍රකාශය ඉදිරිපත් කරමින් මා ප්‍රකාශ කළා, අපි නාස්තියෙන් තොරව අපේ මුදල් පාවිච්චි කරන්න බලාපොරොත්තු වන බව. ඒ පිළිබඳ එක උදාහරණයක් පමණක් සඳහන් කරමින් වැඩි විස්තර පසුව ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙමින් මගේ කථාව අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා.

පසුගිය පළාත් සභාවේදී හිටපු විපක්ෂ නායක තමුන්නාන්සේලාට මෙතැනදී මතක් කරන්න කැමතියි විපක්ෂ නායක තනතුර නීතියෙන් පිළිගත්ත තනතුරක් නොවෙයි. ඒක කන්වෙන්ෂනරි විශේෂයෙන්ම බස්නාහිර පළාත් සභාවේ මුලින්ම ඇති කරන ලද සම්ප්‍රදායක්. අනික පළාත් සභාවලත් දැන් එය පිළිඅරගෙන තියෙනවා. හිටපු විපක්ෂ නායක ඔසී අබේගුණසේකර මහතාගේ ටෙලිපෝනය පිළිබඳ පමණක් යමක් ප්‍රකාශ කරනවා. 1988, 1989 වර්ෂ මම නොකියා ඒ විස්තරත් මම පසුව ඉදිරිපත් කරනවා 1990, 1991, 1992 වර්ෂ තුනට. රුපියල් 3,67,349. 91 ක් ඔසී අබේගුණසේකර මහතාගේ වියදම් දුරකථන වියදම් විධියට වැය කරලා තියෙනවා. ටෙලිපෝන් තුනක් ලබාදීලා තිබෙනවා.

88,89 වර්ෂ ඇතුළුව නම් ඒක දෙකෙන් වැඩි කළ යුතුයි. මේක අති විශාල නාස්තියක්. එතුමාගේ ටෙන්ඩර් කැඳවීමටත්, බිස්නස්වලටත් මේ ටෙලිපෝන් ලබා දීලා තියෙන්නේ. ටෙලිපෝන් තුනක් දීලා තියෙනවා. සම්පූර්ණයෙන් ගෙවල ඉවරයි. මේ පළාත් සභාවේ අපි වැඩ භාර ගන්න පෙර ගෙවල ඉවරයි. වර්ෂ තුනකට පමණක්. මෙවැනි නාස්ති රාශියක් ගැන අපි කථා කරන්න බලාපොරොත්තු වෙනවා. පසුව අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඩෙස්, පුටු, බංකුවලටත් ටෙන්ඩර් කැඳවපු හැටිත් දුන්න හැටි මා ළඟ විස්තර තියෙනවා. මම ඒවා පසුව ඉදිරිපත් කරනවා. මගේ කරුණු ඉදිරිපත් කිරීමට වැඩිපුර කාලය ලබාදීම සම්බන්ධයෙන් ස්තුතිය පුද කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

# 1994 වර්ෂයේ මුදල් ප්‍රකාශය සභා සම්මත කිරීම සහ 1994 මුදල් වර්ෂය සඳහා වූ විසර්ජන ප්‍රඥප්තිය සභා සම්මත කිරීම අවස්ථාවේ 1993.10.15 දින සභාව අමතමින්

ගරු සභාපතිතුමනි, සෑම වර්ෂයකදීම අප පළාත් සභාවේ සිදුවන ප්‍රධානතම කර්තව්‍යය වන්නේ අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමයි. අයවැය විවාදයේ කටයුතු අවසන් වෙමින් පවතින මේ අවස්ථාවේදී ඒ ඒ වැය විෂයයන් පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් දැක්වූ අදහස් සම්බන්ධයෙන් යම් අදහසක් ප්‍රකාශ කරන්නට මට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා. අපි, පළාත් සභාවේ කටයුතු භාරගෙන මාස පහකට ආසන්න කාලයක් තිස්සේ, පළාත් සංවර්ධන කටයුතු කිසිදු ප්‍රශ්නයකින් තොරව සිදු කිරීමට සම්පූර්ණ සහයෝගය ලබා දෙමින් ඉතා දක්ෂ ලෙස හා සාර්ථක ලෙස ඒ කටයුතු ඉදිරියට ගෙන යාම සඳහා, මට සහාය ලබා දුන්න අපගේ ඇමති මණ්ඩලයටත් සියලුම අමාත්‍යාංශවල නිලධාරීන්ටත්, මේ ගරු සභාවේ ආණ්ඩු පක්ෂයේත් විපක්ෂයේත් මන්ත්‍රීවරුන්ටත්, මගේ අවංක ස්තුතිය පළමුව පුද කළ යුතුව තිබෙනවා. සභාපතිතුමනි, අපි දවස් හතරක් තිස්සේ අයවැය පිළිබඳ වාද විවාද කරල අදහස් හුවමාරු කර ගත්තා. නමුත් මීට පෙර කථා කරපු විපක්ෂ නායකතුමා දීර්ඝ වශයෙන් ඒ පිළිබඳ කිව්ව නිසා, ඒ පිළිබඳව මා නැවත වතාවක් අදහස් දක්වන්නට බලාපොරොත්තු වෙන්නේ නෑ. නමුත් මේ සභාවේ මේ අයවැය විවාදය කාලයේදීත් ඊට පෙර සභා කටයුතු පැවැත්වුණ අවස්ථාවලදීත් දෙපැත්තේම මන්ත්‍රීවරුන්ගේ හැසිරීම කියන වචනය මා ඊට කියන්න කැමති නෑ. සාමාන්‍යයෙන් පාසල්වල කුඩා ළමුන් සම්බන්ධයෙන් පාවිච්චි කරන වචනයක් එය. චර්යාව පිළිබඳව ගරු සුසිල් මුණසිංහ විපක්ෂ නායකතුමා ඉදිරිපත් කළ අදහස්, මා සම්පූර්ණයෙන් අනුමත කරනවා. ඇත්ත වශයෙන්ම එතුමා සමඟ අපි කථා කර ගත්තා ඉදිරියේදී මේ මුළු සභාවේම මන්ත්‍රීවරුන් සමඟ මේ ගැන සාකච්ඡා කිරීමට. මා හිතන හැටියට, මෙතන සිටින සියලුම දෙනාම විශාල වගකීමක් ඇතිව කටයුතු කරන්නට හැකියාවක් තිබෙන අය. නමුත් එසේ කටයුතු නොකිරීමට තිබෙන හේතු මොනවාද කියා සාකච්ඡා කරලා, මින්

ඉදිරියේදී සභාවේ ගරුත්වය රැකීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට අපි බැඳී සිටින බව අපි ඔබතුමාට මේ අවස්ථාවේදී මතක් කළ යුතුව තිබෙනවා. මා හිතනවා ඒ සම්බන්ධයෙන් අපේ මන්ත්‍රීවරු සම්පූර්ණ සහයෝගය අපට ලබා දෙයි කියලා. 1994 වර්ෂයේ අයවැය ලේඛනය සම්පාදනය කරද්දී ප්‍රධාන කරුණු කිහිපයක් පිළිබඳව අපගේ අදහස් යොමු වුණා. මා අයවැය ඉදිරිපත් කරමින් සඳහන් කළ පරිදි වෙනදා සිරිත් පරිදි කෙරෙන පාරවල්, පාලම්, බෝක්කු වැනි දේවල් තැනීම වැරදියි කියලා මම කිව්වේ නෑ. අපේ සමහර මන්ත්‍රීවරු ඔවුන්ගේ කෙටි වෙලාව සෑහෙන වෙලාවක් ඒ සඳහා ගත කළා. ඒවායේ අවශ්‍යතාවය ඇත්ත වශයෙන් මා පැහැදිලිව කිව්වා. ඒවා ලිඛිතවත් තියෙනවා. එවැනි අවශ්‍යතාවය සංවර්ධනය සම්පූර්ණයෙන් පිළිගන්න බව මා සඳහන් කළා. නමුත් ඒ එක්කම අපේ පළාත් සභාවට පැවරී තිබෙන බලතල අපේ පළාත් පාලන හා කෘෂිකර්ම ඇමතිතුමා සඳහන් කළ පරිදිත්, විපක්ෂ නායකතුමා සඳහන් කළ පරිදිත්, ඊට පෙර කථා කරන ලද යම් මන්ත්‍රීවරු කිව්වා වාගේත්, අපේ පළාත් සභාවට විශාල වගකීම් සම්භාරයක් භාර වෙලා තිබෙනවා. එහෙමනම් පාරවල් බෝක්කු තැනීම පමණක් නෙවෙයි, අප පළාතේ ජීවත් වෙන ජනතාවගේ ජීවිතවලට සම්බන්ධ කටයුතු රාශියක් ඉටු කරන්නට අපට තිබෙනවා. ඒ නිසා බස්නාහිර පළාතේ ජීවත් වන අපේ මුළු ජනගහනයෙන් 26% ක් 27%ක් පමණ වන තරුණ ජනතාවගේ විරැකියාව දිහා බැලුවොත්, ලක්ෂ පහකට අධික ප්‍රමාණයක් අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් වෙලා, රැකියාවන් බලාපොරොත්තුවෙන් සිටින නිසා අපි පළමුවෙන්ම ඒ අයට ඉදිරි වර්ෂයේදී, අපට පුළුවන් තරම් උපරිම මට්ටමට රැකියා නැත්නම්, ස්වයංරැකියා තුළින් ආදායම් මාර්ගවත් සොයා දෙන්නට අපේ අවධානය විශේෂයෙන් යොමු වුණා. ඒ ගැන විස්තර අපි මීට පෙර කෙටියෙන් සඳහන් කළා. ස්වයං රැකියා ලබාදීම සඳහා. අපේ කෘෂිකර්ම ඇමතිතුමා සමුපකාරවල තියෙන නොයෙකුත් පහසුකම් භාවිතා කරගෙන, පෞද්ගලිකවත් කැමති අයට, පොදුවේ සමුපකාර සමිති හදාගෙනවත්, කෘෂිකර්මයේ නොයෙකුත් අංශවලට සැලසුම් ඇති කර තිබෙන විස්තර සඳහන් වුණා.

ගරු කර්මාන්ත ඇමතිතුමා එතුමාගේ වැය ශීර්ෂය යටතේ ඒ වෙනුවෙන් ඉදිරිපත් කර තිබෙන වැඩ පිළිවෙල ඉදිරිපත් කළා. ඒ සමඟම ඉදිරි වර්ෂයේදී විශාල පිරිසකට ස්වයං රැකියා සුළු කර්මාන්ත සහ සුළු ව්‍යාපාර ගොඩනගා ගනිමින් ස්වයං රැකියා ඇති කර ගැනීමට

ණය පහසුකම්, තාක්ෂණ දැනුම සහ කළමනාකරණ දැනුම ලබා දෙමින් සාර්ථකව දිගින් දිගටම මාස දෙකක් තුනක් යන කොට කඩා ගෙන වැටෙන්නේ නැති ආකාරයට, ඒ ස්වයං රැකියා ඉදිරියට ගෙන යාමේ වැඩ පිළිවෙලක් දැනටම සකස් කරලා සාකච්ඡා කරලා ඉදිරි මාසය දෙක ඇතුළත ඒ සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවීමට කටයුතු කරලා තියෙනවා. මේ සියල්ල සඳහා අපි සමීක්ෂණයක් පවත්වනවා බස්නාහිර පළාතේ පමණක් නොවෙයි, විරැකියාව පිළිබඳ ලංකාවේම හරියාකාර සමීක්ෂණයක් දශකයකට වැඩි කාලයක් තිස්සේ පවත්වලා නැහැ. ජන ලේඛන දෙපාර්තමේන්තුවෙන්වත් පවත්වලා නැහැ. ඒ නිසා අපේ පළාතේ විරැකියාව පිළිබඳ, ආදායම් මට්ටම් පිළිබඳ සම්පූර්ණ සමීක්ෂණයක් පැවැත්වීම සඳහා දැනටමත් කටයුතු යොදවලා ඒ සඳහා අපි ඉල්ලුම් පත්‍ර කැඳවලා තියෙනවා. අ.පො.ස. උසස් පෙළ සමත් අයගෙන් සෑහෙන පිරිසක් එයට යොදවා ගෙන මාස කිහිපයක් ඇතුළත ඒ කටයුත්ත සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම අධ්‍යාපනයට හා රැකී රක්ෂා ප්‍රශ්නයට සම්බන්ධ දෙයක් කරන්න බලාපොරොත්තු වෙනවා. පාසල් අතහැර යන විශේෂයෙන්ම අ.පො.ස. සාමාන්‍ය පෙළ දක්වා හෝ උසස් පෙළ දක්වා ඉගෙන ගන්නා ලද ශිෂ්‍යයන්ට වෘත්තිය පුහුණුව සාර්ථකව ලබාදීම දැනටමත් කෙරිගෙන යනවා. නමුත් ඒවා පවතින්නේ ටෙක්නිකල් කොලේජ් කියන අංශවලයි. පසුගිය කාලයේදී පාසල්වලත් වොකේෂනල් ට්‍රේනිං සෙන්ටර්ස් කියලා කටයුත්තක් සුළු වශයෙන් ආරම්භ කරලා තියෙනවා. එය ඒ තරම් සාර්ථක නැහැ. ඒ ක්‍රමය හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකටම අඩු තරමින් පාසල් කිහිපයක් තෝරා ගෙන පරිපූර්ණ වොකේෂනල් ට්‍රේනිං සෙන්ටර්ස් හවස් වරුවේ පාසල් ගොඩනැගිලි භාවිතා කරමින් මාස හයේ, හා එක වසරක සාර්ථක පුහුණු පාඨමාලාවක් අවසන් කළ හැකි පිරිස, සාර්ථකව රැකියාවක් උපයා ගැනීමේ දැනුම ලබා දෙන්නට අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම අපි මේ අයවැය ලේඛනය පමණක් නොවෙයි. අයවැය ලේඛනය මීට මාස කිහිපයකට පෙර ගරු ආණ්ඩුකාරතුමා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශයටත් සම්බන්ධ වෙලා තිබෙන්නේ. මේ ප්‍රකාශ දෙක හරහාම අපි, කියන්නට හදන ක්‍රියාවට, යොදවන්නට හදන ක්‍රමය පිළිබඳ ප්‍රධාන අදහසක් පමණක් නොවෙයි ප්‍රතිපත්තියක් ද තියෙනවා. එය මේ ඡන්ද ගැනීමේ ව්‍යාපාරයක් නෙවෙයි. අපි අවංකව විශ්වාස කරන නිසා මම නැවත නැවත මෙය කියලා තියෙනවා. නමුත් මේ අවස්ථාවේදී නැවත වතාවක් ඉතා කෙටියෙන් හෝ කිව යුතුයි. අපි ප්‍රජාතන්ත්‍රවාදය ගැන, මිනිස්

නිදහස ගැන අවංකව විශ්වාස කරනවා. ඒ නිසා බස්නාහිර පළාත් සභාවේ පාලන තන්ත්‍රය තුළ ස්වාධීනව කොන්ද කෙලින් තියා ගෙන ඍජුව දේශපාලන බලපෑම් වලින් තොරව කටයුතු කරන්නට පුලුවන්. මේ සඳහා රජයේ නිලධාරීන් පිරිසක් මොනවා හරි කරලා, නිර්මාණය කරන්නට අපි බැඳී සිටින බව මේ ගරු සභාවට නැවත වතාවක් මතක් කරනවා. ඒ සඳහා අපි පසුගිය කාලයේ අන්තිම මට්ටමට පිරිහිලා තිබුණු පිරිහෙන්නට අවශ්‍ය දේවල් යොදවලා තිබුණු ඒ ක්‍රම ප්‍රජාතන්ත්‍රවාදය නංවාලීම සඳහා අවශ්‍ය ක්‍රම පරිපාලන තන්ත්‍රය තුළ, පසුබිම සකස් කිරීමට, මා මීට දින හතරකට පෙර කිව්වා වාගේම අපේ අමාත්‍යාංශවල එය ආරම්භ කරලා තියෙනවා. විශේෂයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ආරම්භ කරලා තියෙනවා. ඒ සඳහා තව කරන්නට වැඩ රාශියක් තියෙනවා. උදාහරණ වශයෙන් අපි සඳහන් කළා, ගුරුමාරු මණ්ඩල, උසස් වීම් පිළිබඳ ක්‍රම පමණක් නෙවෙයි තවත් නොයෙක් දේවල් තියෙන බව. ගුරුවරුන්ට අදාළ වන ණය පහසුකම් වැනි දේවල් ලබා ගන්නට ගියාම නියෝජ්‍ය අධ්‍යක්ෂවරු ළඟ කොට්ඨාශ කාර්යාලවල නිලධාරීන් දණින් වැටිලා, ඒත් බැරි නම් මන්ත්‍රීවරුන්ගෙන් ඇමතිවරුන්ගෙන් ලියුම් අරගෙන යන්න වෙනවා. එවැනි සුළු දෙයක් ගත්තත්, පෙන්ෂන් එකක් හදා ගන්නත් අවුරුද්දක් දෙකක් යන මේ ක්‍රම නැති කරන්නට අපි අවශ්‍ය විධිවිධාන යොදාගෙන යනවා.

ඒ වාගේම ශිෂ්‍ය පරපුර - මා නැවත නැවත ප්‍රකාශ කළා වාගේ අපේ රටේ පසුගිය කාලයේදී ඇති වුණු මහ භයංකාර විපර්යාසය සමාජ දේශපාලන විපර්යාසයට එක පැත්තකින් ගොදුරු වුණොත්, අනික් පැත්තෙන් මුල් වුණොත් තරුණ පරපුරයි. මේ ශතවර්ෂයේදී අපි නොදුටු තරම් භයානක තත්ත්වයක් මේ රටට ඇති වුණේ, ඇති කෙරුවේ, අපේ තරුණ පරපුර පදනම් කර ගෙනයි. මෙම කිසිසේත් කියන්නේ නෑ. තරුණයින්ගේ වැරැද්ද කියලා පවතින ක්‍රමය විසින් ප්‍රජාතන්ත්‍රවාදය මරා දැමීමට නැඹුරුවීම නිසා ඔවුන්ට ආරම්භ කරන ලද ඒ භීෂණයට මුහුණ දෙන්න තරුණ පරපුර ආපස්සට හැරිලා, භීෂණයම පාවිච්චි කරන තත්ත්වයට පෙළඹුණා . ගරු සභාපතිතුමනි, ඒ වාගේම අපට කවදාක්වත් අමතක කරන්නට බැහැ. මේ සියලු තරුණයින් අවුරුදු පහේ සිට අවුරුදු දහ අට දක්වා බස්නාහිර පළාතේ අප විසින් පාලනය කරන ලද අධ්‍යාපන ක්‍රමයෙන් නිකුත් වන තරුණ

තරුණියන්. ඒ අධ්‍යාපන ක්‍රමය තුළින් මේ තත්ත්වය වෙනස් කිරීමට අති විශාල උතුම් සේවාවක් කරන්නට පුලුවන් කියලා අපි විශ්වාස කරනවා. නමුත් ඒ අධ්‍යාපන ක්‍රමයේ ගුණාත්මක භාවය ගැන, අධ්‍යාපනය ලබා දෙන ක්‍රමය ගැන අපට නැවත හිතන්නට සිදු වෙනවා. එපමණක් නෙවෙයි, ඒ තරුණ ශිෂ්‍ය පරපුරට ගුරුවරුන් විසින් දක්වනු ලබන ආදරය ඔවුන් බලන ආකාරය ඔවුන්ට ලබා දෙන නිදහසේ ප්‍රමාණවත්භාවය පිළිබඳ ගම්බද මට්ටමේ පාසලේ පරිපාලනයට, පාසලේ කටයුතු වලට සහභාගි වෙලා තමන්ගේ අදහස් නිදහසේ ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා දෙන්නේ කොයි ආකාරයටද කියලත් අපට නැවත හිතන්නට වෙනවා. මේවා ලෙහෙසි පහසු වැඩ නොවෙයි. නමුත් ඒ සම්බන්ධයෙන් විශේෂ කමිටුවක් පත් කරලා වහ වහාම ඒ කටයුතු ක්‍රියාත්මක කරවන්නටත් අවශ්‍ය විධිවිධාන අපි ප්‍රායෝගිකව යොදවන්නට බලාපොරොත්තු වන බව මේ ගරු සභාවට ඔබතුමාගේ මාර්ගයෙන් මතක් කරනවා.

ඒ වාගේම අධ්‍යාපනයෙන් අපි කරන්න බලාපොරොත්තු වන දේවල් පිළිබඳව, මීට පෙර අපි කථා කළා. මෙතනදී විශේෂ භාෂා ඉගැන්වීම පිළිබඳ හැම පාසලකටම ජනවාරි මාසයේ වන කොට අඩු තරමින් අපේ ප්‍රදේශයේ කීපයක් හෝ අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් වුණු දුගී දුප්පත් ශිෂ්‍යයන් තෝරලා අ.පො.ස. උසස් පෙළ දක්වා නිම කරන්නට හැකි වන පරිදි ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම වැනි දේවල් අපි යෝජනා කරලා තිබෙනවා. ඒ වාගේම මෙතනදී සඳහන් කළ යුතුයි. අධ්‍යාපන ක්ෂේත්‍රයට බලපාන භයානකම ප්‍රශ්නයක් පිළිබඳව සුසිල් මුණසිංහ විපක්ෂ නායකතුමා මීට පෙර කථා කළ දවසේ එය සඳහන් කළා. ජාතික පාසල් ප්‍රශ්නය. මට ලැබී තිබෙන මේ සීමිත වෙලාවේදී ඒ සම්බන්ධයෙන් වැඩි වෙලාවක් වැය කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මෙය සම්පූර්ණයෙන් අපි හෙළා දකින දෙයක්. ඇත්ත වශයෙන්ම අධ්‍යාපනය පමණක් නොවෙයි අපි නැවත නැවත කිව්වා වාගේ, පළාත් සභා ක්‍රමයක් ඇති කරලා, මෙතන සිද්ධ වෙන්නේ මොකක්ද ? මට පේන විධියට විවෘතව, දකුණු අතින් ලස්සන දේවල් නමට දීලා, මේසේ යටින් හිමින් සැරේ වම් අතින් ඔක්කොම ඇදලා ගන්නවා වාගේ. අධ්‍යාපනය අපට දීලා තියෙනවා. ගුරු පත්වීම් අපට කරන්නට බෑ. මොන මොන විධියේ අය එවනවාද දන්නේ නෑ. ඊටත් වැඩිය අන්තයි කිසිම අධ්‍යාපනික ප්‍රතිපත්තියක් අපට තීන්දු කරන්න බෑ. මහ

ආණ්ඩුවෙන් තීන්දු කරලා අපට එවන්නේ. අපි පාලනය කරන පාසල්වල උගන්වන විෂය පාඨමාලාවල් පවා තීන්දු කරන කමිටුවල පළාත් සභාවේ එක නියෝජිතයෙක්වත් නැහැ. ආරාධනා කරන්නෙත් නැහැ. මේක පුදුමාකාර තත්ත්වයක්. ඇත්ත වශයෙන්ම විහිළුවට පත් කරන තත්ත්වයක්. සෞඛ්‍ය අමාත්‍යාංශයේත් එවැනි දේවල් සිදු වෙන්නේ. පළාත් පාලනය ඊට වඩා ටිකක් වෙනස් ඊට වඩා බලතල තිබෙනවා. මේ වාගේ නොයෙක් දේවල් සිදු වෙනවා. ජාතික පාසල් කියලා එක එක්කෙනාට හිතෙන හිතෙන විධියට කවුරු කවදා කෙරුවද කියන එක නෙවෙයි ප්‍රශ්නය. සමහරු කියනවා රනිල් වික්‍රමසිංහ ඇමතිතුමාගේ කාලෙයි කෙරුවේ කියලා. හොයලා බලනකොට ඇත්ත වශයෙන් ඒ කාලේ යෝජනා වෙලා ආරම්භ වෙලා තියෙන්නේ.

ඊළඟට ආපු ඇමති වි. ජ. මු. ලොකු බණ්ඩාර ඇමතිතුමාගේ කාලේ තව ටිකක් ජාතික පාසල් කතන්දරය ව්‍යාප්ත කරලා, ඊළඟට ලලිත් ඇතුලත්මුදලි ඇමතිතුමාගේ කාලෙදිත් ටිකක් ව්‍යාප්ත කරලා තියෙනවා. දැන් තව තවත් ව්‍යාප්ත කරලා. තවත් පුදුමයක්. අධ්‍යාපන අමාත්‍යාංශය මා භාර ගත් විගසම, හිටි අඩියේම පාසල් 16 ක් ජාතික පාසල් කරලා. පාසල් 16 න් 13 ක්ම ගම්පහ දිස්ත්‍රික්කයට අයත් ඒවා. මේක කොහොම වුණාද ? ඒ මැජික් එක මොකක්ද කියලා මා හිතන හැටියට ඔබතුමාට විශේෂයෙන් එය විස්තර කළ යුතු නැහැ. අපේ පළාතේ ජාතික පාසල් කරන්නට තව පාසල් 68 ක් දැන් ලකුණු කර ගෙන තියෙනවලු. හෙට අනිද්දම එය කරන්න යනවාලු. අපි බලාපොරොත්තු වෙනවා. නීත්‍යානුකූලව පමණක් නෙවෙයි මේ සභාවේ සහයෝගය ලබා ගෙන, තමුන්නාන්සේලා දෙපැත්තෙන්ම ඉදිරිපත් කරපු අදහස් අනුව සභාවේ යෝජනාවක් සම්මත කරගෙන, මහ ආණ්ඩුවත් සමඟ සාකච්ඡා කරලා එය විසඳෙන්නේ නැත්නම් අනිකුත් සියලු නීතිමය කටයුතු කරන්නට. එය කරන්න අපි බලාපොරොත්තු වෙනවා. අපි බර උස්සන්නත් මහ ආණ්ඩුවෙන් ඒ අයට අවශ්‍ය අවශ්‍ය දේ කරන එකත් ඇත්ත වශයෙන්ම මා හිතන හැටියට බලය විමධ්‍යගත කිරීමේ ක්‍රමයත්, මේ මුළු පළාත් සභා පනතේ සහ නීතියේ ගැබ්වෙලා තියෙන හරයත්, සම්පූර්ණයෙන් උල්ලංඝණය කිරීමක් හැටියට මා විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම සංස්කෘතිය ගැන එදා මට කථා කරන්න වෙලාවක් තිබුණේ නැහැ. අද වචන දෙකක් පමණක් කථා

කරන්න බලාපොරොත්තු වෙනවා. එය මට භාර තවත් විෂයක්. අපි මෙතෙක් කථා කරපු තරුණ පරපුරේ අසහනය සම්බන්ධයෙන්, යම් වැඩ පිළිවෙළක් දියත් කරන්න බලාපොරොත්තු වෙනවා. මේ වර්ෂයේදී පුළුවන් තරම් ඉක්මණට අපේ දිස්ත්‍රික් තුනේම තරුණ සංස්කෘතික මධ්‍යස්ථාන ආරම්භ කරලා, ඒ තුළින් කලා කටයුතු සහ ක්‍රීඩා කටයුතු, තරුණයන් අතර ව්‍යාප්ත කරමින් ඔවුන්ගේ සිත් වැරදි පැති වලට යොමු වීම - කුඩු, කයිප්පු අනෙකුත් දේවල්වලට යොමු වීම හැකි තරම් දුරට වෙනස් කරන්නට උත්සාහයක් දරන්නට අපි අදහස් කරනවා. ඒ සඳහා අපි මුදල් ප්‍රමාණයකුත් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම ජනවර්ග ප්‍රශ්නයට අඩු තරමින් සුළු ආරම්භයක් හැටියට, අපේ පාසල්වල විෂය පාඨමාලාවල් වෙනස් කරන්න අපට අයිතියක් නෑ. මහ ආණ්ඩුවෙන් තීන්දු කරන්නේ. මහ ආණ්ඩුව සමඟ සාකච්ඡා කරලා එකඟ වෙනවා නම්, බොහොම හොඳයි. නැති වුවත් අපි බලාපොරොත්තු වෙනවා අඩු තරමින් පාසල් වෙලාවෙන් පසුව සිංහල පාසල්වල දරුවන්ට කැමති අයට දෙමළ භාෂාව උගන්වන්නත්, දෙමළ දරුවන්ට සිංහල උගන්වන්නත් ආරම්භ කරන්න. ඒ වාගේම සිංහල දෙමළ අන්‍යෝන්‍ය සහයෝගීතාව වර්ධනය කිරීම සඳහා විශේෂ සංස්කෘතික වැඩ පිළිවෙළවල් පාසල් මාර්ගයෙන් ක්‍රියාත්මක කරවන්නට බලාපොරොත්තු වෙනවා. ගරු සභාපතිතුමනි, මේ සභාවේ හුඟ දෙනෙකුගේ අදහස් තිබුණා මුදල් ප්‍රශ්නය ගැන අපි ගැන අවිශ්වාසයක් තියෙනවා මෙතෙක් කල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට ලබා දුන්න ලක්ෂ 60 මේ වර්ෂයේදී පළාත් සභාව විසින් කප්පාදු කරලා කියලා. ඇත්ත තත්ත්වය මා පැහැදිළිව මතක් කළ යුතුයි. අපේ දෙපක්ෂයේම මන්ත්‍රීවරු සමඟ සාකච්ඡා පවත්වපු වෙලාවල්වලදී මා කිව්වා. නමුත් නැවත වතාවක් මේ සභාවේදී කිව යුතුයි. 1992 වර්ෂයේදීත් ලක්ෂ 60 ක් දීලා තියෙනවා. ඉස්සෙල්ලා ලක්ෂ 30 කුත් ඊළඟට තව ලක්ෂ 30 කුත් දීලා තියෙනවා. 1993 වර්ෂය සඳහා මීට පෙර තිබුණ පළාත් සභාවේ ඇමති මණ්ඩල වාර්තාවකුත් තියෙනවා මාර්තු මාසේ. එම පළාත් සභාව විසුරුවා හරින්න පෙර ලක්ෂ 40 ක් මේ වර්ෂය සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට ලබා දෙන්නට තීන්දු කරලා තිබෙනවා කියලා. ඒ තීන්දුව වෙනස් කළේ නැහැ. අපි වර්ෂය භාගයක් ගත වුණාට පසුව වැඩ භාරගත්ත නිසා මුදල්මය අතින් එවැනි ප්‍රධාන එක තීන්දුවක්වත් වෙනස් කළේ නැහැ. ඒ ප්‍රමාණයම ලබා දෙමුය කියලා අපි තීන්දු කළා. ඒ සම්බන්ධයෙන් තවත් කිව යුතු දෙයක් තියෙනවා. ඇත්ත වශයෙන්ම 1992 වර්ෂයට ලක්ෂ 60 ක් දුන්නාට අදියර දෙකට

දුන්නේ. ඉස්සෙල්ල ලක්ෂ 30 යි. ඊළඟට තව ලක්ෂ 30 කුයි. දෙවනුව දුන්න ලක්ෂ 30 සම්පූර්ණයෙන් වැඩ අවිච්ඡේද වෙලා ඊළඟ වර්ෂයට ආවා. ඒ ලක්ෂ 30 හේම වැඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලින් කෙරිල නෑ. ඔක්කොම බලන කොට මිලියන 160 ක මුදලක් 1992 වර්ෂයේ අවිච්ඡේද වෙලා 1993 ට ඇවිල්ලා තියෙනව. ඒ නිසා ඇත්ත වශයෙන්ම කොපමණ මුදල් දුන්නත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල තිබෙන තත්ත්වයක් මත ඒවා වියදම් වෙන්නේ නැති නිසා නිකම් අපරාදේ ඒව නියම කරලා වෙන් කරලා ආපහු ලබා ගෙන ඊළඟ වර්ෂයෙත් වියදම් කරන්න බැරි තත්ත්වයක් ඇතිවීම නැවැත්වීමට සහ පසුගිය පළාත් සභාවෙන් පැහැදිලිව ලක්ෂ 40 ක් පමණක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට දෙනවා කිව්ව තීන්දුව, අපි හිතුවා ඇත්ත වශයෙන් සාධාරණ තීන්දුවක් කියලා ඒ අවිච්ඡේද වන තත්ත්වය මතයි අපි එසේ තීන්දු කළේ. එතනදී තවත් සඳහන් කළ යුතු දෙයක් තියෙනවා. ගරු මන්ත්‍රීවරු කීප වතාවක් මගෙන් අහලා තියෙනවා. එක් මන්ත්‍රීවරයෙකුට ලක්ෂ 10 ක් ලබා දෙනවා වෙනුවට ඒ ප්‍රමාණය වැඩි කරන්න බැරිද කියල. ඒ වාගේම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට දෙන ලක්ෂ 40 වැඩි කිරිම සම්බන්ධයෙන් මා පළමුවෙන්ම කියන්න කැමතියි අපේ පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 33 ක් තිබෙනවා. ඒ 33 ට ලක්ෂ 40 බැගින් දුන්නාම එකතුව මිලියට 132 යි. අමාත්‍යාංශවලට මිලියන 15 බැගින් තමයි පෙර පරිදිම දෙන්නේ. සතයක්වත් වැඩි කළේ නෑ. ඒ මිලියන 15 අමාත්‍යාංශ පහට මිලියන 75 යි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 33 ට ලක්ෂ 40 බැගින් මිලියන 132 යි. අමාත්‍යාංශ පහට මිලියන 75 යි. එකතුව මිලියන 207 යි. මහ ආණ්ඩුවෙන් අපට දෙන්නේ ප්‍රාග්ධන වියදම් සඳහා මිලියන 211 යි. තව ඉතුරු වෙන්නේ හතරයි. එතකොට මන්ත්‍රීවරුන්ට තව කොහෙන්ද වැඩි කරන්නේ කියලා මට ඇත්ත වශයෙන්ම හිතා ගන්නට බැහැ. තියෙන තත්ත්වය මේකයි. ගිය වර්ෂයෙත් 211 යි. මේ වර්ෂයෙත් 211 යි. ගරු විපක්ෂ නායකතුමා යෝජනා කළා වාගේ, අපේ පුනරාවර්තන වියදම් මහ ආණ්ඩුවෙන් භාරගන්නවා නම් අපි ආදායම් ලබන සියලුම මුදල් මීට වැඩිය මහ විශාල ප්‍රමාණයක් මන්ත්‍රීවරුන්ට දෙන්න පුලුවන්. අපට වැඩ රාශියක් කරන්න පුලුවන්. ඒ අදහස මා එකහෙලාම ඉතා ඕනෑකමින් අනුමත කරනවා. ඇත්ත වශයෙන්ම එතුමා කීවා වාගේ ඒ ගැන තව වචනයක් කිව යුතුයි. පළාත් සභා පිහිටුවන්නට පෙර තිබුණ දෙපාර්තමේන්තුවෙන් මහ ආණ්ඩුවෙන් අපට භාර දී තියෙන්නෙ. ඇත්ත වශයෙන්ම අපි කරන්නේ මධ්‍යම ආණ්ඩුවකින් කළයුතු අති ප්‍රධාන

වැඩ වලින් කොටසක්. අධ්‍යාපනය, සෞඛ්‍ය, පළාත් පාලනය කියන්නේ රටක පාලනයේ ඇති ප්‍රධානම වැඩ කොටසක්. ඒවා අපිට භාරදීලා ඒවායේ පඩි ගෙවන්නවත් මුදල් ලබා දෙන්නේ නැතුව අපිට කියනව බස්නාහිර පළාතේ සංවර්ධනය කරන්න කියලා. සංවර්ධනය කරන්නෙත් නෑ. පාසල්වල ගොඩනැගිලි අපි හදන්න ඕන. රෝහල් ගොඩනැගිලි හදන්න ඕන. සී. ඩී. ඊ. පාරවල් ඔක්කොම හදන්න ඕන. මේ සියල්ලටම දෙන්නේ ලක්ෂ 211 යි. ඇත්ත වශයෙන්ම මේක පොඩි විහිලුවක්. පළාත් සභාව සමග විහිළු කරනවද ? හිතා මතා කරනවද ? නොදැනුවත්ම කරනවද ? කියන්න මම දන්නේ නැහැ. මේක ඉතාමත්ම අසාධාරණ තත්ත්වයක්. උදාහරණයක් වශයෙන් තමුන්නාන්සේලා දැනගත යුතු දෙයක් තිබෙනවා. මෙම පළාත් සභාවෙන් දළ වශයෙන් දීමනා ලබන සේවකයින්, 55000 ක් පමණ ඉන්නවා. මෙයින් වැඩි හරියක් ඉන්නේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ. මොවුන්ට පඩි නොවෙයි ණය සාමාන්‍යයෙන් ක්‍රමානුකූලව ඉල්ලන ණය මුදල් සහ යම් යම් අත්තිකාරම් මුදල් ගෙවීම සඳහා මේ වර්ෂයට අවශ්‍ය වෙනවා අපට මිලියට 300 ක්. ඒවා ආපහු ලැබෙන දේවල්. ඒ මිලියන 300 න් මේ දක්වා මහ ආණ්ඩුවෙන් අපට ලබා දීලා තියෙන්නේ මිලියන 57 යි. විශේෂයෙන් ගුරුවරුන්ගේ ණය ගෙවීම විශාල වශයෙන් ප්‍රමාද වෙලා තිබෙනවා. අපට තව තවත් ප්‍රමාද කරන්න බැරි නිසා පළාත් සභාවේ වෙනත් දේ වලට තියෙන මුදල් වලින් අපි මේ වර්ෂය සඳහා පමණක් අපේ මුදල්වලින් මිලියන 117 ක් වැනි මුදලක් අපි වියදම් කරලා තියෙනව ඒ වගේම මුද්දර ගාස්තු පසුගිය කාලයේදී අපි අයකර ගන්නා, පළාත් පාලන ආයතනවලින් අයකර ගන්නා මුද්දර ගාස්තු අඩු කරලා තමයි මහ ආණ්ඩුව අයවැය ඇස්තමේන්තුව හදන වෙලාවේදී අපට ගණන් හිලව් හදලා ඉතුරු මුදල අපට දුන්නේ. ඒක අඩු කරලා එය අපේ ආදායමක් හැටියට සලකලා අපට දුන්නේ. නමුත් ඒ මුද්දර ගාස්තු සියල්ල ආපහු අදාළ පළාත් පාලන ආයතනයකට ප්‍රාදේශීය සභාවට හෝ නගර සභාවට ආපසු භාර දෙන්න ඕනෑ. එතකොට අපේ අත් හිස්. නමුත් මෙය අපි ළඟ තියෙනවා කියලා හිතාගෙන තමයි අපට මුදල් දෙන්නේ. 1992 දී මෙතුමා හිටපු කාලයේදී මුදල් කොමිසම සමඟ සාකච්ඡා කරලා 1993 වර්ෂයේ සිට මුද්දර ගාස්තු ප්‍රමාණය ආපසු ආයතනවලට ගෙවීමට ලබාදිය යුතු මුදලින් අපට දීලා නැහැ. මම හිතන විධියට මුදල් ලැබිලම නැහැ. නමුත් අපි අපේ මුදල්වලින් මිලියන 113 ක් ප්‍රාදේශීය සභා, නගර සභාවලට ගෙවලා තියෙනවා. අන්තිමට අපි හිර වෙන්නේ සංවර්ධන වැඩ කටයුතු කරන්න යන කොටයි. මුදල්

අතින් විශාල හිරවීමක් ගරු සභාපතිතුමනි, මේ පළාත් සභා සියල්ලටම තියෙනවා. අපේ ගරු මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම් තියෙනවා. වාහන සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා, නගර සභා, පැත්තකට යන්න බෑ සාකච්ඡා කරන්න. ප්‍රාදේශීය සභිකයෝ කියනවා අපි ගම්වලට ගිහිල්ලා වැඩ කරන්න ඕනෑ. පළාත් සභාවෙන් එවන සංවර්ධන කටයුතු අපි අධීක්ෂණය කරන්න ඕනෑ. අපට යන්න බයිසිකල් කට්ටක්වත් නැහැයි කියලා. කතන්දරය ඇත්ත. මේ වාගේ ප්‍රාදේශීය සභා, නගර සභාවල මන්ත්‍රීවරුන්ට කිසිම දෙයක් නෑ. ග්‍රාම සේවකවරුන්ගේ ප්‍රශ්නය ඉදිරිපත් වුණා. ඒකත් ඇත්ත. අපි ඒ අයගෙන් ගමට ගිහිල්ලා ෆීල්ඩ් එකට ගිහිල්ල සෑහෙන වැඩ කොටසක් අවංකව කරන්න ඕනෑ කියලා බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා මූලික අවශ්‍යතාවයන්වත් සපයන්න අපට මුදල් නැහැ. මා හිතන හැටියට මෙය මධ්‍යම ආණ්ඩුවේ ප්‍රධාන වගකීමක්. මේ තරම් විශාල වගකීම් කොටසක් අපට භාර දෙනවා නම්, ඒවා ඉටු කිරීමට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන අඩු තරමින් අපට ලබා දෙන්න ඕනෑ. ඉතුරු හරිය අපි බලා ගන්නම්. ඒ අතරෙදි මන්ත්‍රීවරුන්ගේ වාහන ප්‍රශ්නය ගැන විපක්ෂ නායකතුමා සඳහන් කරන්න කියලා මගෙන් ඉල්ලීමක් කරනවා, අපි දීර්ඝ කාලයක් තිස්සේ සාකච්ඡා කරමින් හිටියා. අන්තිමට මාවත් ඇදගෙන අපේ සභා නායකතුමා සාකච්ඡාවකට ගියා. මේ සියලුම පක්ෂවල නියෝජිතයින් සමග. අපි අමරතුංග ඇමතිතුමා සමග සාකච්ඡා කළා. මුදල් නෑ කියන එක තමයි කිව්වේ. නමුත් උත්සාහ කරන්නම් කියලා කිව්වා. අපි ඉල්ලුව පසුගිය පළාත් සභාවට දුන් ක්‍රමයටම අපට වාහන දෙන්න කියලා. නමුත් දැන් විපක්ෂ නායකතුමා මට දැනුම් දුන්නා එතුමා රජය සමග සාකච්ඡා කරලා එතුමාගේ ඉල්ලීම් සමහර විට රජය අපේ ඉල්ලීම්වලට වැඩිය ටිකක් වුවමනාවෙන් බලනවා ඇති. අපට බොහොම සංතෝෂයි, එතුමාගේ සහයෝගයට. රජය එකඟවෙලා තියෙනවලු කස්ටම්ස් ඩියුටි නැතුව පරණ ක්‍රමයටම වාහන ලබාදීමට අපි ඉල්ලා සිටිනවා ඒ සාකච්ඡා කරපුවා. විපක්ෂ නායකතුමාටම විස්තර ඉදිරිපත් කරන්න කියලා. ඒ අතරතුරේදී ප්‍රවාහන ඇමතිතුමා ඉල්ලීමක් කරනවා ඉතා කෙටියෙන් ප්‍රවාහනය පිළිබඳවත් විස්තර ඉදිරිපත් කරන්න කියලා. විපක්ෂ නායකතුමාත් ඒ සම්බන්ධව අදහස් ඉදිරිපත් කළා. වහළ පහත බස් මේ අවුරුද්දේ අන්තිම වනකල් පමණයි අපි දුවන්නට ඉඩ දෙන්නේ. ජනවාරි පළමුවැනිදා සිට ඒ අයගේ රූට් ලයිෂන්ස් කැන්සල් කරනවා. ඒ අතරතුරේදී බස් කොන්දොස්තරවරුන්ගේ ප්‍රශ්නය විශාල වශයෙන් තියෙනවා. විපක්ෂ නායකතුමා ඔවුන්ගේ ක්‍රියාදාමය පිළිබඳව විස්තර සහිතව අපට අදහස් ඉදිරිපත් කළා. අලුත් වර්ගයේ බස්

කොන්දොස්තරවරු නිර්මාණය කිරීමේ ප්‍රාර්ථනාවෙන් අපේ පවුසි ඇමතිතුමා 1994 වර්ෂයේදී බස් කොන්දොස්තරවරු 1000 කට ඉතා ඉක්මණට විශේෂ පුහුණුවක් ලබාදීමට අලුතෙන් බඳවා ගන්නා බවට අපට පොරොන්දු වෙනවා. ඊට වැඩිය මේ අවස්ථාවේදී මා කාලය ගන්නට බලාපොරොත්තු වෙන්නේ නෑ. අපි කවුරු කෙරුවාද, කොහොම වුණාද කියලා මේ අවස්ථාවේදී නැවත වතාවක් කෑ කෝ ගහගෙන හූ කියා ගන්නට මම කැමති නැති නිසා විස්තර කරන්න අවශ්‍යත් නැහැ. බලාපොරොත්තු වෙන්නෙත් නැහැ. කෙසේ වුවත් අද අපේ රටේ ඇති වී තිබෙන යම් භයානක තත්ත්වයන් විශේෂයෙන් ප්‍රජාතන්ත්‍රවාදය, මිනිස් නිදහස නැතිවීම නිසා මුළු මහත් සමාජය තුළම දේශපාලන තන්ත්‍රය තුළම ඇති වී තියෙන ඒ විපර්යාසයන්, වැරදි අතට සිදු වී තියෙන ඒ විපර්යාසයන් රාජ්‍ය තන්ත්‍රයට පරිපාලන සේවයට බලපාන ඒ විපර්යාසයන්, තරුණ පරපුරට බලපාන ඒ විපර්යාසයන් වෙනස් කිරීමේ ආරම්භය මේ ආකාරයට ප්‍රශ්න දිහා බලලා මේ බස්නාහිර පළාත් සභාවෙන්වත් තමුන්නාස්සේලා අපි සියලු දෙනාම දෙපැත්තේම පක්ෂ භේදයෙන් තොරව අනිකුත් සියලු භේදවලින් තොරව පාට, ලකුණ පක්ෂවල නම මොකක්ද කියල බලන්නේ නැතුව අපේ සමාජය මේ මහා භයානක ඉරණමෙන් ගොඩ ගැනීම සඳහා අපි එකට එකතුව ඉදිරි වර්ෂයේදී කටයුතු කරමු කියා තමුන්නාන්සේලාට යෝජනා කරමින් මා අවසන් කරන්නට පෙර එක අදහසක් මට මතක් වුණා. සුරනිමල රාජපක්ෂ මන්ත්‍රීතුමා සභාවට බාධා කරමින් යටත් කොටම. එතුමා කිව්වා ප්‍රධාන දෙයක්. මම අධ්‍යාපන අමාත්‍යාංශය තුළින් මගේ දේශපාලන බලය, මගේ වචනවලින් මම කියන්නේ, එවැනි අදහසක් කිව්වේ. තහවුරු කරගන්නව බලනවා කියලා. ගරු සභාපතිතුමනි, මේ අධ්‍යාපන ඇමති පට්ටමවත් මහ ඇමති පට්ටමවත් ලැබෙන්න පෙර නිකම්ම නිකම් චන්ද්‍රිකා කුමාරතුංග හැටියට මම මගේ දිස්ත්‍රික්කයෙන් ඡන්ද ලක්ෂ තුනක් ගත්තා.

**ගරු මන්ත්‍රීතුමා**

නැහැ, නැහැ, බණ්ඩාරනායක ශ්‍රීමතානන්ගේ නාමයට.

**ගරු ප්‍රධාන අමාත්‍ය චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය.**

ගරු සභාපතිතුමනි, මම ස්තුතිවන්ත වෙනවා විපක්ෂයට මගේ මුල් නම මතක් කිරීම ගැන. ඒක කවදාක්වත් මට අමතක වෙන්නේ නෑ. මම

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග හැටියට මගේ නම තියෙන්නේ. බණ්ඩාරනායක කියන නම මම අතඇරලත් නෑ. බණ්ඩාරනායකකම අතහැරලත් නෑ. ගරු මන්ත්‍රීතුමනි, මතක් කරනවා. තමුන්නාන්සේලා එය මතක් කිරීම ගැන මම බොහොම සංතෝෂ වෙනවා. ඒ නිසා මම කවදාකවත් මට ලැබී තිබෙන රාජකාරිය, මට ලැබී තිබෙන නිලය මා හැමදාම කියන පරිදි ඉතා අවංකව කිසිසේත්ම දේශපාලන වශයෙන් දූෂණය කිරීමට යෙදෙන්නෙත් නැහැ. ඒ වාගේ යෙදිලත් නැති බව මතක් කරමින් තමුන්නාස්සේට ස්තුතිවන්ත වෙමින් මා මින් නවතිනවා.

## බස්නාහිර පාළතේ පළාත් සභාවේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු මහින්ද සමරසිංහ මැතිතුමා නගන ලද "93/94 සංවර්ධන සැලැස්ම", පිළිබඳ ප්‍රශ්නයකට අදාළව 1993.11.25 වන දින පළාත් සභා රැස්වීමේදී පිළිතුරු දෙමින්

ගරු සභාපතිතුමනි, පළමුවෙන්ම කියන්න කැමතියි, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කියන්නේ මොකක්ද කියලා නම්, මට තේරෙනවා. කියන හේතුව නම් මට තේරෙන්නේ නැහ. එතුමා එක්කෝ අපේ චක්‍රලේඛය හරියට කියවල තේරුම් අරගෙන නැහැ. එහෙම නැත්නම් මොකක්ද කියන එක මට තේරෙන්නේ නැහැ. පළමුවෙන්ම එතුමා ඉල්ලා සිටිනවා ප්‍රධාන වශයෙන් පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වය ඇතිව සැළැස්ම සකස් කරන්නය කියලා. පළාත් සභාවේ වැඩ භාර ගත්ත දවසේ සිටම අපේ සංවර්ධන සැලසුම් කරන හැම අවස්ථාවකම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමට අදාළ සියලුම මන්ත්‍රීවරුන්ව කැඳෙව්වා. එතුමාම මට ස්තුති කළා මෙතෙක් කල් තිබුණාටත් වඩා අපේ සහභාගිකත්වය ලබා ගැනීම ගැන. මට බොහොම සන්තෝෂයි කියලා මහින්ද සමරසිංහ මන්ත්‍රීතුමා මට කිහිප වතාවක්ම කිව්වා. මට ඒ ගැන තේරෙන්නේ නෑ. ඒ නිසා තමුන්නාන්සේලා සහභාගී කර ගන්නේ නැති වෙයි කියලා එතුමාට තියෙන සැකය හා බිය මොකක්ද? අපි මේ දක්වා සැලසුම් තීන්දු කරන සාකච්ඡාවලට ඩී. ඩී. සී. සාකච්ඡාවලට ගරු මන්ත්‍රීතුමන්ලාව කැඳෙව්වා. මට ඒක වෙනස් කරන්න බෑ. වෙනස් කරන්න කිසිම අදහසකුත් නෑ. මීට වැඩිය ගරු මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වය ලබා ගන්න පුළුවන් නම් අපි තවත් අලුත් ආයතනයක් හදනවා. දිස්ත්‍රික් සංවර්ධන සභාව මහ ඇමතිවරයාගේ නායකත්වයෙන් තියෙන පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ සංවිධානයක්. එතනට කැමති වුවත් නැතත් කොහොමත් මන්ත්‍රීවරු සහභාගී කර ගන්න ඕනෑ. අපි ඉතා කැමැත්තෙන් එය කරනවා. මෙම චක්‍රලේඛයේ එක කොටසක් පමණක් කියවලා අනවශ්‍ය භයක් ඇති කර ගැනීම සුදුසු නැහැ කියලා මම එතුමාට මතක් කරනවා. අපි කියන්නේ, මෙතෙක් කල් මන්ත්‍රීවරුන්ගේ මුදල් යෙදෙව්වට පස්සේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට යොදවන ලක්ෂ 40 න් එක්තරා ප්‍රමාණයක් ඉතිරිව තිබෙනවා නම් - අපි දන්නා තරමින් මෙතෙක් තීන්දු කළේ ප්‍රාදේශීය ලේකම්වරු තමන් කැමති

මන්ත්‍රීවරු කිහිප දෙනෙකු සමග පමණක් සාකච්ඡා කරලා, මහ ආණ්ඩුවේ ඇමතිවරුන් සමගත් සාකච්ඡා කරලා අපේ අනිකුත් සියලුම මන්ත්‍රීවරු පැත්තකට දාලා, යෝජනා තීන්දු කරපු තත්ත්වයක් පසුගිය අවුරුදු ගානෙම සිදු වෙලා තිබුණා. බොරුවක් නොවෙයි. කළුතර දිස්ත්‍රික්කයේ පැවති සාකච්ඡාවලදී එය එළි වුණා. මෙතුමාත් හිටියා. [සභාවේ ඝෝෂා] කරුණාකරලා මට කථා කරන්න ඉඩ දෙන්න. ගරු සභාපතිතුමනි, අපේ පැත්තේ කවුරුත් මහින්ද සමරසිංහ මන්ත්‍රීතුමා කථා කරන කොට කටවත් ඇරියෙ නෑ. කරුණාකරලා හරියට හැසිරෙන්න කියන්න. මගේ කථාව ඉවර නැහැ. එතුමාට අවශ්‍ය නම් කථා කරන්න අවශ්‍ය වෙලාවට. කළුතර දිස්ත්‍රික්කයේ ඩී. ඩී. සී. සාකච්ඡාව අපි පැවැත්වුවා, 93 වර්ෂයේ ඇස්තමේන්තු සඳහා, අපි සියලුම මන්ත්‍රීවරුන්ට ආරාධනා කළා. මන්ත්‍රීවරු කිහිපදෙනයි ඇවිල්ලා හිටියේ. විපක්ෂ සංවිධායකතුමත් ඇවිල්ල හිටියා. එදා සාකච්ඡා කරන කොට ඉතාමත් පැහැදිළිව අපට පෙනී ගියා අපේ වික්‍රමනායක ඇමතිතුමා හිටියා. මහින්ද සමරසිංහ මන්ත්‍රීතුමා හිටියා. තව මන්ත්‍රීවරු කිහිප දෙනෙක් විතරයි දෙපැත්තෙන්ම හිටියේ. ප්‍රාදේශීය ලේකම්වරු ඉතිරි සල්ලිවලට තමන්ට අවශ්‍ය විධියට යෝජනා කරපු බව සාකච්ඡා කරන කොට පැහැදිළි වුණා. මම පැහැදිළිව ඇහෙව්වා එක එක ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් මේ යෝජනා කොහොමද තමුන්නාන්සේ ගත්තේ කියලා. මට සමහර අය කිව්ව දේවල් අනුව මම තීන්දු කළා කියලා කිව්වා. එවෙලෙම අපි ප්‍රාදේශීය ලේකම්වරුන්ට දැනුම් දුන්නා. මෙතුමාත් එදා හිටියා. මේ ආකාරයට සමහර අයගේ අදහස් පමණක් මත කටයුතු කිරීම ප්‍රජාතන්ත්‍රවාදී නැති නිසා අපි නැවත වතාවක් අදාළ සියලුම පළාත් සභා මන්ත්‍රීවරුන් කැඳවලා, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් කොට්ඨාශයට ගිහිල්ලා සියලුම පළාත් සභා මන්ත්‍රීවරුන් කැඳවලා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් කොට්ඨාශයට ගිහිල්ල සියලුම මන්ත්‍රීවරුන්ගේ අදහස් අරගෙන තීන්දු කරමුයි කියලා. 1993 සැලැස්ම තීන්දු කලේ එහෙමයි. කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් කොට්ඨාශයට ගියා. මහින්ද සමරසිංහ මංත්‍රීතුමාගේ ඉල්ලීමක් තිබුණා, මතුගම සහ අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම්තුමා සමග සාකච්ඡා කරලා හොඳයි කියලා හිතෙන ඒවා යෝජනා කරන්න. සාකච්ඡා අවශ්‍යය නැහැයි කියලා එතුමාගේ ඉල්ලීම මත ඒ කොට්ඨාශ දෙකේ සාකච්ඡා තිබ්බෙත් නැහැ. ඒ නිසා අපේ මන්ත්‍රීවරු මට දොස් පැවරුවා ඇයි මේවායේ තිබ්බේ නැත්තේ කියලා. ඒ නිසා මම කියන්නේ, මොකක්ද කියන එක මට තේරෙන්නේ නැහැ. මෙය අපභ්‍රංශයක්. කොළඹ

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

දිස්ත්‍රික්කයේ එවැනි සාකච්ඡා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් කොට්ඨාශයට අවශ්‍ය වුණේ නැහැ. මොකද, කොළඹ දිස්ත්‍රික්කයේ ලක්ෂ 40 යේ සීමාව ඉක්මවා ගිය මන්ත්‍රීවරුන්ගේ යෝජනා තිබුණා. ඇත්ත වශයෙන්ම මන්ත්‍රීවරුන්ගේ යෝජනා කපා හරින්න සිදු වෙලා තිබුණා. එම නිසා කොළඹ දිස්ත්‍රික්කයේ වැඩිපුර යෝජනා ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් යොදවන්නට අවස්ථාවක් තිබුණේ නෑ. එතැනදීත් මෙතෙක් කල් සිදු නොවුණ දෙයක් වුණා. මගේ යෝජනාවක් මත මන්ත්‍රීවරුන්ගෙන් කපා හැරපු සියලුම යෝජනා අපි භාර ගත්තා. අමාත්‍ය මණ්ඩලයේ තීන්දුවක් අරගෙන ඒ මගින් ක්‍රියාත්මක කරවන්න මන්ත්‍රීවරයාගේ නමින් කපා හරින ලද සියලුම යෝජනා නැවත වතාවක් ඇතුළත් කළා. අපි අලුත් ක්‍රමයක් යෝජනා කරලා. 1994 වර්ෂය සම්බන්ධයෙන් අපි ගරු මන්ත්‍රීවරුන්ට මොනතරම් පැහැදිළි චක්‍රලේඛයක් ද එව්වේ. පසුගිය අවුරුදු පහ තුළ ඔය වාගේ චක්‍රලේඛ ආපු ඒවා මට පෙන්වුවොත් මම ඉතාමත්ම සන්තෝෂ වෙනවා. ඒ වාගේම මටත් ඒවායින් තවත් දෙයක් ඉගෙන ගන්න පුළුවන්. මම දන්නේ නැති දේවල් එහෙම ඇති. මේ වාගේ මම හිතන්නේ විස්තර සහිතව චක්‍රලේඛයක් එවලා තියෙන්නේ, පළමුවැනි වතාවට මේ පළාත් සභාවෙන් විතරයි. මෙතුමා ඒ චක්‍රලේඛයේ එක ඡේදයක් අල්ලගෙන ප්‍රාදේශීය සභා, නගර සභාවලින්, පළාත් සභා ආයතනවලින් යෝජනා ගන්න එක සම්බන්ධයෙන් කථා කරනවා. ඔව්. අපි ඒ වාගේ යෝජනා ගන්නවා. නමුත් මෙතුමන්ලාගේ සහභාගිත්වය ලබා ගන්නේ නැහැයි කියලා අපි කිසිසේත් කිව්වේ නැහැ. ඩී. ඩී. සී. සාකච්ඡා මට්ටමේදී අපි කිව්වේ මූලිකව ප්‍රාදේශීය ලේකම්වරුන්ට යම් අයගේ අදහස් පමණක් අරගෙන යෝජනා ඉදිරිපත් කරනවා වෙනුවට ජනතාවත් සමග කිට්ටුවෙන් සිටින පල්ලෙහා මට්ටමේ තිබෙන ජනතා ආයතනය හැටියට ප්‍රාදේශීය සභා, නගර සභාවලින් අපි යෝජනා අර ගත් නමුත්, ඒ සියල්ලම අපි පිළිගන්නවා කියලා කියන්නේ නැහැ. ඊළඟට ඩී. ඩී. සී. සාකච්ඡාවේදී, ප්‍රාදේශීය මට්ටමේ සාකච්ඡාවලට මන්ත්‍රීවරුන්ට අපි අනිවාර්යයෙන්ම ආරාධනා කරනවා. මන්ත්‍රීවරුන් සමග ප්‍රාදේශීය ලේකම්වරුන් සමග සාකච්ඡා කරලා තමයි අන්තිමට තීන්දු ගන්නේ. ඒ වාගේම මීට පෙර එවූ චක්‍රලේඛයක් තිබෙනවා. මෙතුමන්ලාගේ යෝජනා අපට එවන්නය කියලා ඒ චක්‍රලේඛය අද මෙතැන නැහැ. පළාත් සභා මන්ත්‍රීවරුන්ට මීට පෙර චක්‍රලේඛයක් එව්වා. ඔක්තෝබර් 30 වැනිදාට පෙර ලක්ෂ 10 ට සරිලන පරිදි තමුන්නාන්සේලාගේ යෝජනා එවන්න කියලා. මට මතක හැටියට එහි තිබෙනවා, අපේ ක්‍රමය ගැන.

**ගරු මහින්ද සමරසිංහ මන්ත්‍රීතුමා**

ගරු සභාපතිතුමනි, මම කියන්නේ, අපිටත් ඒ අවස්ථාව දෙනවා කියලා එහි ඇතුළත් කරන්න කියලයි.

**ගරු ප්‍රධාන ඇමතිතුමිය,**

ඒ අවස්ථාව ස්ථිරවම ලබා දෙනවා.

**ගරු මහින්ද සමරසිංහ මන්ත්‍රීතුමා**

මෙයින් ප්‍රාදේශීය ලේකම්වරු හිතන්නේ වෙනින් දෙයක් ගරු සභාපතිතුමනි,

**ගරු ප්‍රධාන අමාත්‍යතුමිය**

ඇත්තවශයෙන්ම ගරු සභාපතිතුමනි, මෙතුමා කියවන ඡේදයේ අපි එය දැම්මේ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ප්‍රශ්නයට විසඳුමක් හැටියට. ඒ නිසා මන්ත්‍රීවරු ගැන එතැන කථා කරන්න අවශ්‍යතාවයක් තිබුණේ නැහැ. නමුත් ඩී.ඩී සී එක කියන්නේ ඇත්ත වශයෙන් දිස්ත්‍රික් මට්ටමේ තිබෙන සාකච්ඡාවක් . ඩී. ඩී. සී. ආයතනය අපි පළමුවැනි වතාවට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් කොට්ඨායට අරගෙන ගිහිල්ලා සාකච්ඡා පවත්වනවා. මේ වතාවේ මම මීට පෙර කිව්වා වාගේ මන්ත්‍රීවරු සියලු දෙනාටම ආරාධනා කරලා අපි ඒ සාකච්ඡාව කළා. කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රශ්නයක් තිබුණා. කොළඹ දිස්ත්‍රික්කයේ කරන්න අවශ්‍යතාවයක් තිබුණේ නැහැ.

ඩී. ඩී. සී. සාකච්ඡාව විතරයි අපි කළේ. මොකද, වැඩිපුර මුදලක් ඉතුරු වුණේ නැති නිසා. අපි පළමුවැනි වතාවට කළ ඒ කටයුත්ත නැවත වතාවක් නොකරන්න කිසිම හේතුවක් නෑ. ඉතා සාර්ථකව මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වයෙන් එය කෙරුණා. ඒ ඡේදයේ තිබෙන්නේ, මන්ත්‍රීවරුන්ට කරුණු පැහැදිලි කිරීමක් වශයෙන් ඔවුන්ට අවශ්‍ය පරිදි විතරක් යෝජනා ඉදිරිපත් කරන්න නොහැකි වන බව දැනුම් දීම පමණයි. මන්ත්‍රීවරු සහභාගී කර ගන්නවා. එහෙම නැතිව මේ සැළසුම් සකස් කිරීමට අපේ අදහසක් නැහැ. ස්තූතියි.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# පළාත් සභා මන්ත්‍රී ගරු ලක්ෂ්මන් අබේගුණරත්න මැතිතුමා පළාත් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාවක් සම්බන්ධව 1993.11.25 දින සිය අදහස් දක්වමින්

ගරු සභාපතිතුමනි, ලක්ෂ්මන් අබේගුණරත්න මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද යෝජනාව අනුමත කරන අතර , ඒ යෝජනාව ඉතාමත් කාලෝචිත බව මා ප්‍රකාශ කරන්න කැමතියි. අවුරුදු දහයක් තිස්සේ උතුරු නැගෙනහිර යුද්ධය මේ රටේ වටිනා තරුණ ජීවිත, ජාති භේදයකින් තොරව සියලුම ජාතීන්ට අයත් තරුණ ජීවිත, විනාශ කරමින් උග්‍ර වෙමින් පවතිනවා. එක්සත් ජාතික පක්ෂය ආණ්ඩුව විසින් හැමදාම කියනවා මේ යුද්ධය තව මාස දෙකෙන් ඉවරයි. තව මාස තුනෙන් ඉවරයි. විශේෂ ඔපරේෂන් කරනවා කියලා. එත් එය ඉවර වෙන පාටක් නැහැ. ගරු සභාපතිතුමනි, අපට ලාංකිකයන් වශයෙන් ඔය ප්‍රශ්නයට විසඳුමක් අවශ්‍යයි. මට නම් පේන විධියට පවතින රජය මේ යුද්ධය හිඟන්නනාගේ තුවාලයක් බවට පත්කර ගෙන තුවාලය අවුස්ස අවුස්ස සිටිනවා මිස, යුද්ධයට විසඳුමක් දෙන්න සූදානමක් නැති බව හෝ ශක්තියක් නැතිබව අපට පැහැදිළිව පේනවා.

ගරු සභාපතිතුමනි, අර පාරවල් අද්දර හිඟන්නො ඉන්නවා. තුවාල තියාගෙන ඒකෙන් නොයෙක් දේවල් ගලනවා. කවුරු හරි ගිහිල්ලා කිව්වොත් එහෙම රෝහලකට ගිහිල්ලා තමුන්නාන්සේගේ තුවාලයට බේත් අරන් දෙන්නද කියලා, අනේ මහත්තයෝ වදින්නම් තුවාලය නම් සනීප කර දෙන්න එපාය කියනවා. මොකද, ඒ හිඟන්නගේ ජීවිත වෘත්තිය එතනින් ඉවර වෙන නිසා. ඒ වගේම මේ රජයත් , උතුරු නැගෙනහිර යුද්ධය තුවාලයක් බවට පත්කර ගෙන,තුවාලය අවුස්ස අවුස්ස තියාගෙන ඉන්ව කියලා අපට හිතෙනවා. ගරු සභාපතිතුමනි, මේ යුද්ධයට හේතුවෙන්නේ, අපේ රටේ තියෙන නොයෙක් ආකාරයට පැතිරී තිබෙන ජනවාර්ගික ප්‍රශ්නයක් නිසයි. ජනවාර්ගික ප්‍රශ්නයක් නැහැ, මේක ත්‍රස්තවාදී ප්‍රශ්නයක් විතරයි කියල රටේ නායකයා කියමින් මේ යුද්ධයට තවම එකම විසඳුමක් වත් නිසියාකාරව ඉදිරිපත් නොකරමින් ගෙන යන මේ දේශපාලනයට අපි සම්පූර්ණයෙන්ම විරුද්ධයි. අපට කියනවා දේශපාලනයට මෙය සම්බන්ධ කරන්න එපාය

කියලා. ඒ මුළු යුද්ධයම දේශපාලනයයි.මේ පවතින ආණ්ඩුවෙන් අපි ඉල්ලා සිටිනවා, උතුරු නැගෙනහිර යුද්ධය පමණක් නෙවෙයි උතුරු නැගෙනහිර යුද්ධයට මුල් වුණු යුද්ධය ඇත්ත වශයෙන්ම උතුරු නැගෙනහිර ඇතිකරපු ජනවර්ග ප්‍රශ්නයට, එක්සත් ජාතික පක්ෂය දෙන විසඳුම් මොනවාද කියල කරුණාකර අපට කියාසිටින්න, ජනතාවට ඉදිරිපත් කරන්නය කියලා. මේ රටේ ජීවත් වන ද්‍රවිඩ ජනතාවට ඔවුන්ගේ සාධාරන ප්‍රශ්න වලට අපි කියන්නේ ත්‍රස්තවාදී ප්‍රභාකරන් ගැන නොවෙයි. ද්‍රවිඩ ජනතාවගේ ඉල්ලීම් වලට ද්‍රවිඩ ජනතාවගේ තියෙන යම් සාධාරණ ප්‍රශ්නවලට පැහැදිළි විසඳුම් මාලාවක් ඉදිරිපත් කිරීම, පවතින රජයේ වගකීමක්. අපට ඉදිරිපත්කරන්න. අපි ඒවා සාකච්ඡා කරලා එකඟ වෙනවාද නැද්ද කියල අපේ සංශෝධන සහිතව මෙතුමන්ලාට කියන්නම්. එය මෙතුමන්ලාගේ වගකීම. අවුරුදු 16ක් මේ රටේ බලයේ සිටියත් හයෙන් පහක බලයකින් පාර්ලිමේන්තුවට ආවත්, ඊට විසඳුම් ඉදිරිපත් කළේ නෑ. ඒ නිසා අපි එක්සත් ජාතික පක්ෂ රජයට කියා සිටිනවා විසඳුම් ඉදිරිපත් කරන්නේ නැතුව බොරු කර කර හිඟන්නාගේ තුවාලය වාගේ අවුස්ස අවුස්ස තියාගෙන ඉන්නේ නැතුව ඊට පැහැදිලි විසඳුමක් ලබා දෙන්නය කියලා. ජනවර්ග ප්‍රශ්නයක් මේ රටේ තියෙන්නේ ත්‍රස්තවාදී ප්‍රශ්නයක් පමණක් නොවෙයි. ත්‍රස්තවාදී ප්‍රශ්නය ඇති වුණේ, ජනවර්ග ප්‍රශ්නය නිසා පමණයි. ජනවර්ග ප්‍රශ්නයට ආණ්ඩුව විසඳුම' ඉදිරිපත් කරන්න. ජනතාවට ඉදිරිපත් කරන්න. අපිත් සාකච්ඡා කරන්නම්. එහෙම බැරි නම් අපි කියා සිටිනවා, යුද්ධය ඉවර කර ගන්නත් බැරි නම්, ප්‍රශ්නයට විසඳුම් පවා නැතිනම්, මේ ත්‍රස්තවාදය ඉවර කරන්න නම් උතුරු නැගෙනහිර ද්‍රවිඩ ජනතාවගේ සාධාරණ ඉල්ලීම්වලට විසඳුම් දෙන්න. එතකොට ත්‍රස්තවාදය ඉවර වෙයි. ද්‍රවිඩ ජනතාව ප්‍රභාකරන්ට සහයෝගය දෙන්නේ, පොදුවේ ප්‍රභාකරන්ගේ සිටින හමුදාවල් හැර අනෙකුත් සියලු දෙනාම සහයෝගය දෙන්නේ වෙන කිසිම විසඳුමක් නැති නිසා විතරයි.

ද්‍රවිඩ ජනතාව යුද්ධයට එකඟ වෙන්නේ නෑ. ද්‍රවිඩ ජනතාව ප්‍රභාකරන්ගේ මිනිමරු හමුදාවලට විරුද්ධයි. මේ රටේ ජීවත් වන ද්‍රවිඩ ජනතාව සාධාරණව හිතන්න පුළුවන් බහුතරයක්. ද්‍රවිඩ ජනතාවට සාධාරණ විසඳුම් දීලා ඔවුන්ව ත්‍රස්තවාදයෙන් ඉවත් කර ගන්න කියලා අපි රජයෙන් ඉල්ලා සිටිනවා. ත්‍රස්තවාදී කොටි සංවිධානයට ද්‍රවිඩ ජනතාව සහයෝගය දෙන එක වහාම නවත්වන්න නම්, මේ රජය කොන්ද පණ ඇතුව හිඟන තුවාලය සනීප කරන්න සූදානම් වෙන්න

කියලා අපි කියනවා. ඒ වාගේම අපි ඉල්ලා සිටිනවා මේ රජයෙන් එක්කෝ මේවාට විසඳුම් දෙන්න බැරිනම් ආත්මගරුත්වයක් ඇතිව කරුණාකරලා ඉල්ලා අස්වෙලා ගෙදර යන්න කියලා. ලක්ෂ්මන් අබේගුණරත්න මන්ත්‍රීතුමා අද මේ ගනෙන ලද යෝජනාවට පෞද්ගලිකව මගෙත් අපේ පක්ෂයේත් සම්පූර්ණ සහයෝගය ලබා දෙන බව ප්‍රකාශකරමින් එවැනි කාලෝචිත යෝජනාවක් ගෙන ඒම පිළිබඳව එතුමාට ස්තූතිය ප්‍රකාශකරමින් මම නිහඬ වෙනවා.

## 1994 ජනවාරි 06 වන දින බස්නාහිර පළාත් සභාවට නව යෝජනාවක් ඉදිරිපත් කරමින් ගරු ප්‍රධාන අමාත්‍ය චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය

පොලිස් බලතල පළාත් සභාවට පවරා දෙන ලෙස මධ්‍යම රජයට බල කර සිටීම.

ගරු සභාපතිතුමනි, පළමුවෙන්ම මා විසින් ඉදිරිපත් කරන්නට යෙදෙන යෝජනාව සඳහා විවාදයේ කාල වේලාව වැඩි කිරීමට තීන්දු කිරීම පිළිබඳව ඔබතුමාටත් මේ සභාවටත් මගේ ස්තූතිය පළ කරමින්, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා.

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 "අ" විධිවිධාන යටතේ මෙම බස්නාහිර පළාත් සභාව පිහිටුවා ඇති ප්‍රදේශයට අදාළ වනයේ පළාත් සභා ලැයිස්තුව නම් වූ 9 වන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ ඇති යම් යම් කාරණා සම්බන්ධයෙන් ප්‍රඥප්ති සෑදීමේ බලය මෙම සභාව සතු වන අතර, එකී 9 වන උපලේඛනයේ 1 වන ලැයිස්තුව නම් වූ පළාත් සභා ලැයිස්තුවේ පොලීසිය හා මහජන සාමය අදාළව 1 වන පරිශිෂ්ඨය යටතේ වූ නීතිය හා යථා පැවැත්ම පිළිබඳව අදාළ වන්නා වූ කටයුතු කිරීම සඳහාත් , අවශ්‍ය වන්නාවූ නීති ප්‍රඥප්ති මගින් සෑදීම සඳහාත් , ජාතික මෙන්ම පළාත් බද පොලිස් කොමිෂන් සභාවක් පත් කළ යුතුය. ඒ අනුව, එකී කාර්යය සඳහා ශ්‍රී ලංකා ජනරජයේ පාර්ලිමේන්තුව විසින් 1990 අංක 91 දරන පොලිස් කොමිෂන් පනත සම්මත කරන ලදී.

1990 අංක 1 දරන පොලිස් කොමිෂන් පනතේ 1 වන වගන්තිය ප්‍රකාර ගරු ජනාධිපතිතුමා විසින් ගැසට් නිවේදනයකින් එකී පනත ක්‍රියාත්මක කළ යුතු දිනය නියම කළ යුතු වන්නේය. එහෙත් ගරු ජනාධිපතිතුමා විසින් මෙම පනත ක්‍රියාත්මක කරන දිනය නියම කිරීමට මෙතෙක් පියවර ගෙන නොමැත. එසේ හෙයින් එකී පොලිස් කොමිෂන් පනතේ 1 වන වගන්තිය ප්‍රකාර මෙම පනත ක්‍රියාත්මක කරන දිනයක් නියම කර එය ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කරන ලෙසත්,

මෙම පොලිස් කොමිෂන් පනත ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන්නාවූ සියලු පියවර ගන්නා ලෙසත්, විශේෂයෙන් බස්නාහිර පළාත් සභාව තුළ මෙම පනත ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන්නා වූ සියලු විධිවිධාන සලසා ඒ මගින් බස්නාහිර පළාත තුළ නීතිය හා සාමය රැකීම සඳහා වූ බලතල සහ වගකීම පවරා දෙන ලෙසත් මෙම සභාව ගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටින්නීය."

ගරු සභාපතිතුමනි, මෙහි මූලික පරමාර්ථය මා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවෙන්ම පැහැදිලි වෙයි කියා මා හිතනවා. නීතිය හා සාමය රැකීම පිළිබඳව පළාත් සභා පිහිටුවන අවස්ථාවේ ඇති වූ සාකච්ඡා වලින් ඒ ඒ පළාත් වලට එක්තරා මට්ටමක සිට පහළට පොලිස් බලතල, පරිපාලන බලය බෙදා හැරීමේ ප්‍රතිපත්තිය මත පොලිස් බලතල ලබා දීමට තීන්දු කරලා ඒ තීන්දුව අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයෙන් අවශ්‍ය විධිවිධාන සකසලා තිබෙනවා. නමුත් මේ රටේ පළාත් සභා ක්‍රමය දැනට අවුරුදු හයක් පමණ තිස්සේ ක්‍රියාත්මක වුවත් එම විධිවිධාන ගැසට් නිවේදනයකින් යොදවලා නැති බව අපි දන්නා කරුණක්. ඒ නිසා අපි විශ්වාස කරනවා, අනිකුත් බලතල බෙදා හැරීමෙන් විමධ්‍යගත කිරීමෙන් වඩාත් ප්‍රජාතාන්ත්‍රවාදී පාලනයකට රුකුලක් වනවා වාගේම පොලීසියේ බලතල බෙදා හැරීමෙන් විමධ්‍යගත කිරීමෙන් පළාත් සභා නවයට විමධ්‍යගත කිරීමෙන් ඇත්ත වශයෙන්ම සාමය රැකීමේ කටයුතු ප්‍රජාතාන්ත්‍රවාදී ලෙස ජනතාවගේ නියෝජිතයන් සහ ජනතාව නියෝජනය කරන පළාත් සභාව වැනි ආයතනවලට බෙදා දීමෙන් දැනට වැඩිය ප්‍රජාතාන්ත්‍රිය ක්‍රමයක් නීතිය හා සාමය පාලනය කිරීමේදී ඇති වෙයි කියලා අපි තරයේ විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, පසුගිය දශකය තුළ මේ රටේ අපි දන්න කරුණක් පමණක් නොවෙයි උසාවියෙන් පවා ඔප්පු වෙලා තිබෙනවා, මීට දවස් තුනකට පෙරත් අපි විසින් තවත් ඔප්පු කිරීමට අවශ්‍ය කරුණු වගයක් එළි කරලා තිබෙනවා. ප්‍රධාන ආණ්ඩුව විසින් බලතල ඉතාමත් අසීමිත විධියට පාවිච්චි කරමින් මේ රටේ ජනතාවගේ සාමය රකිනවා වෙනුවට සාමය කඩ කරමින්, පොලිස් බලතල අයථා විධියට පාවිච්චි කරමින් ජනතාව තුළ මහත් භීෂණයක් ඇති කරමින් භීෂණකාරී යුගයක් ගොඩනගමින් ඉන්නවා. ගරු සභාපතිතුමනි, අපි විශ්වාස කරනවා, සාමය ගරු කරන, ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන රජයක් බලයට

පත් වන තෙක් අඩු තරමින් ජනතාවගේ නියෝජිතයින් හැටියට ප්‍රජාතන්ත්‍රවාදීව පත් වී සිටින මේ පළාත් සභාවලට හරියාකාරව මේ රජය විසින්ම සම්පාදන කරන ලද නීතිය අනුව ඒ බලය බෙදා හැරියොත් මීට වඩා ප්‍රජාතන්ත්‍රවාදීව ජනතාවට අවශ්‍ය විධියට, නීතිය හා සාමය රකින්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. ගරු සභාපතිතුමනි, අප රටේ කේන්ද්‍රීය බලය, පරිපාලන බලය පළාත් නවයට විමධ්‍යගත කරලා තිබෙනවා. අපි දන්න තරමින් පසුගිය අවුරුදු පහ හය ඇතුළත ඒ පරිපාලන බලය පොදුවේ යම් පළාත් සභාවල මුදල් අක්‍රමිකතාවයන් වැනි දේ සිදු වී තිබුණත් බස්නාහිර පළාතේ පමණයි එහෙම සිදු වෙලා නැත්තේ කියලා පාර්ලිමේන්තුවේම මුදල් කමිටුව විසින් සඳහන් කරලා තිබෙන කරුණුවලින් පෙනී යනවා. පොදුවේ පරිපාලනමය කටයුතුවලදී සෑහෙන ප්‍රජාතන්ත්‍රීය ක්‍රමයක් පළාත් සභා ක්‍රමය තුළින් ඇති වී තිබෙන බව අපි පිළිගත යුතු කරුණක්. අපට විශ්වාස කරන්නට පුළුවන් පොලිස් බලතල ඉඳලා මුල් වන සියලුම තීන්දු ප්‍රධාන ආණ්ඩුව අතේ තියාගෙන තිබෙන්නේ. ඒක ඒ ආකාරයට සිදු විය යුතුයි. හරියාකාරව රටක් පාලනය කරන්න නම් එය කළ යුතුයි. නමුත් එක්තරා මට්ටමක සිය සාමය හා නීතිය රැකීමේ කටයුතු මේ ආකාරයට විමධ්‍යගත කරමින් බලය බෙදා හරිමින් ජනතාවට අවශ්‍ය වන පරිදි සෑහෙන දුරට අඩු කරන්න හැකි වෙයි කියලා අපි විශ්වාස කරනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, පසුගිය කාලයේ පමණක් නොවෙයි දැනුත් මගේ ගම් ප්‍රදේශයේ තවමත් සිදු වෙන දේවල් ගැන එකින් එක කථා කරන්න මෙතැන වෙලාව නැති නිසා අපි සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, ප්‍රජාතන්ත්‍රවාදීව පවත්වන ඡන්ද අයථා විධියට වෙනස් කරන්නට පොලිස් බලතල තවමත් ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල ප්‍රදේශයේ ලොකු ලොකු ඇමතිවරුන්ගේ නියෝග මත තවමත් ක්‍රියාත්මක වෙනවා. ඒ විස්තර අද මේ සභාවට ඉදිරිපත් කරන්නට මට වෙලාවක් නැහැ, අපේ මන්ත්‍රීවරු කථා කරන්න බලපොරොත්තු වන නිසා. තවත් අවස්ථාවකදී ඒ කරුණු මේ සභාවේදී ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීම පිළිබඳ සාකච්ඡා කිරීමේදී අප ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ නිසා මේ ආකාරයට අපි විශ්වාස කරනවා, මෙම යෝජනවා ඉදිරිපත් කරමින් මෙම රජය විසින්ම සම්පාදනය කරන ලද ............ දවසින් දෙකෙන් හැදුවා නොවෙයි. දීර්ඝ වශයෙන් සාකච්ඡා කරලා, සම්පාදනය කරලා කියලා අපි විශ්වාස කරනවා. ඒ හේතු මත වගකිව යුතු රජයක් හැටියට සම්පාදනය කරන ලද මෙම නීතිය දැන්වත් ක්‍රියාත්මක කළ

යුතුයි කියලා යෝජනා කරන අතර, ඉතිරි කරුණු මේ විවාදය අවසානයේදී අවස්ථාවක් ලැබුණොත් පිළිතුරු වශයෙන් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වන අතර, ඔබතුමාට මාගේ ස්තූතිය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

# ඓතිහාසික අත්තනගල්ල පූජා භූමිය සංවර්ධනය කිරීමට අදාළ යෝජනාවක් ඉදිරිපත් කරමින් 1994.01.20 දින බස්නාහිර පළාත් සභා රැස්වීමට ඉදිරිපත් කරමින්

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මතු ප්‍රකාශ වන යෝජනාව මම සභාවට ඉදිරිපත් කරනවා.

"දිනපතා බැතිමතුන් දහස් ගණනක් වන්දනා මාන කිරීම සඳහා පැමිණෙන ඓතිහාසික අත්තනගල්ල පුදබිම කාලීන අවශ්‍යතාවයන් අනුව සංවර්ධනය වී නොමැති බැවින් ද එය ක්‍රමානුකූල සැලැස්මක් මත පූජනීයත්වය ආරක්ෂා කර ගත යුතු හෙයින් ද, අත්තනගල්ල ඓතිහාසික නගරය පූජා භූමියක් ලෙස ප්‍රකාශයට පත් කර පුරා විද්‍යා දෙපාර්තමේන්තුව සහ නාගරික සංවර්ධන අධිකාරිය ඒකාබද්ධව කරනු ලබන සැලැස්මක් මඟින් සංවර්ධනය කළ යුතු යැයි මෙම පළාත් සභාව මධ්‍යම රජයෙන් ඉල්ලා සිටින්නීය."

ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම අත්තනගල්ල ප්‍රදේශයේ ඓතිහාසික අත්තනගල්ලේ රජමහාවිහාරය අවුරුදු දෙදහස් ගණනක් තිස්සේ පවතින ප්‍රදේශයක් බව රහසක් නොවේ. මීට අවුරුදු 2,000කට පමණ පෙර ශ්‍රී සඟබෝ රජතුමාණන් තම සහෝදරයා වෙනුවෙන් රජකම අතහැර ගිහිල්ලා සියලු බලය අතහැරලා අත්තනගල්ලට පැමිණ භාවනා කරමින් සිටින වෙලාවකදී, එතුමාගේ හිසත් ඉල්ලන්නට පැමිණි බමුණාට හිසත් ගලවලා දුන්නයි කියන ඓතිහාසික පදනමකින් යුක්ත පුද බිමකි. ඒ කථාව ඇත්ත වුණත් නැතත්, අද අපේ ගැමි කථාවලට බෞද්ධ කථාවලට එය එකතු වෙලා තිබෙනවා. එය කෙසේ වෙතත්, අපේ රටේ පවතින පැරණි රජමහා විහාර අතරින් එකක් හැටියට අත්තනගල්ලේ තිබෙන රජමහා විහාරය අපි හඳුන්වනවා. අත්තනගල්ලට වසරකට දස දහස් ගණනින් ජනතාව පූජනීය කටයුතුවලට සහභාගී වෙන්නට පැමිණෙනවා. නමුත් එම නගරය පූජනීය නගරයක් හැටියට හරියාකාරව තවමත් සංවර්ධනය වෙලා නැති නිසා පූජනීය නගරයක් හැටියට නම් කොට එහි නගර නිර්මාණ ඇති කරලා සිද්ධස්ථානය සංවර්ධනය කිරීමට අපි යෝජනා කරනවා.

ඒ වාගේම අත්තනගල්ල ප්‍රදේශය අද අතිවිශාල ජනගහනයක් ජීවත් වන ගැමි පරිසරයක් තිබෙන ප්‍රදේශයක්. එවැනි සංවර්ධනයක් තුළින් එම ප්‍රදේශයේ ජනතාවගෙන් සෑහෙන පිරිසකට ස්වයං රැකියා වැනි දේවල්වලින් සෑහෙන ආදායම් මාර්ගයක් ලබා ගන්නට පුළුවන් වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. මෙම යෝජනාව අපට ඉදිරිපත් කිරීම ගැන, යෝජනා කිරීම ගැන නිර්මාණය කිරීම ගැන මා විශේෂයෙන්ම අත්තනගල්ලේ පළාත් සභා මන්ත්‍රී ගරු සංජය සිරිවර්ධන මැතිතුමාට අපගේ ස්තුතිය මේ අවස්ථාවේදී පුද කළ යුතුව තිබෙනවා. එතුමාගේ ගමත් අත්තනගල්ල රජමහා විහාරයට ඉතාමත් නුදුරින් පවතින්නේ. මා හිතන හැටියට ඒනිසා එතුමාට ඒ ගැන විශේෂ වුවමනාවකුත් ඇති. ඊට වැඩිය මා මේ අවස්ථාවේදී කථා කරන්නට බලාපොරොත්තු වෙන්නේ නැහැ. කතා කරන්න කරුණු රාශියක් තිබෙනවා. ඒ අවස්ථාව ගරු සිරිවර්ධන මන්ත්‍රීතුමාට මා ඉතිරි කරමින්, ඔබතුමාට මගේ ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා.

## 1994.06.09 දින පළාත් සභා රැස්වීමේදී

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රේමරත්න ගුණසේකර ඇමතිතුමා තමන්ගේ කරුණු පැහැදිලි කිරීම කරමින් කතාවක් කළා. ඒ කථාව කිරීමේදී එතුමා ඉදිරිපත් කරපු කරුණු පිළිබඳව මට ප්‍රශ්නයක් නැහැ. එතුමාටත් කථා කරන්න අයිතියක් තියනවා. නමුත් කරුණු ඉදිරිපත් කිරීමේ මුවාවෙන් එතුමා මා පිළිබඳ බරපතල චෝදනා කීපයක් ඉදිරිපත් කළා. ඒ සම්බන්ධයෙන් පිළිතුරු දීමට මම ඔබතුමාගෙන් විනාඩි කීපයක් ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමනි, එතුමා මට තේරුණ විධියට බාධා කිරීම් මැද්දේ මට චෝදනා තුනක් කළා. පළමුවෙන්ම චෝදනා කළේ, මගේ ස්වාමිපුරුෂයා වන විජය කුමාරතුංගත් මමත් ජේ. ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමාව මුණ ගැහෙන්න ගිහිල්ලා එහිදී එතුමාට කිව්වාලු අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉල්ලා අස්වෙමින් අලුත් පක්ෂයක් හදනවා. ඉන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ප්‍රශ්න ඇති කරමින් එක්සත් ජාතික පක්ෂයට උදව් කරන්න පුළුවන් කියලා. ගරු සභාපතිතුමනි, මේ චෝදනාව සම්පූර්ණ අසත්‍යයක්. විජය කුමාරතුංග මැතිතුමා හෝ වෙන කිසි කෙනෙක් සමඟ හෝ මම ජේ. ආර්. ජයවර්ධන මහත්මයාව මේ දක්වා කවදාවත් මගේ ජීවිතයේ මුණගැහිලා නැහැ, එකම එක අවස්ථාවක හැර, ඒ ජනාධිපති මන්දිරයේදී විජයව අසාධාරණ ලෙස බොරු චෝදනා මත හිර ගත කරලා හිටපු වෙලාවේදී මම අධිකරණය ඉදිරියේදී නඩු තුනක් එතුමාට විරුද්ධව ඒ සම්බන්ධව ඉදිරිපත් කරලා තිබුණ වෙලාවේ, හිටපු ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මහතා මට පණිවුඩ ගණනාවක් එව්වා. එතුමාව මුණ ගැහෙන්න කියලා. ඒ අවස්ථාවේදී එතුමගේ ඉල්ලීම පිට මම සාක්ෂි සහිතව රජ ගෙදරට ගියා. ප්‍රසිද්ධ නිල රැස්වීම්වල සහ මඟුල් ගෙවල් වැනි ඒවායේ හැරෙන්න, එදා පමණයි මම එතුමාව මුණ ගැහිලා තියෙන්නේ.

ද්විතීයක පාසල්වලට නව ගොඩනැගිලි ඉදිකිරීම් ලක්ෂ 60යි. තරුණ කමිටු වාර්තා නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අදාළ කණිෂ්ඨ ද්විතීයක පාසල්වලට නව ගොඩනැගිලි ඉදිකිරීම් 23,00,000යි. ප්‍රාථමික පාසල් සංවර්ධන ව්‍යාපෘතිය - සීඩා පාසල් ගොඩනැගිලි ඉදිකිරීම ලක්ෂ 10යි.

එකතුව දශ ලක්ෂ 30 ය. මේ සියළුම ශීර්ෂයන් යටතේ මුළු එකතුව දශ ලක්ෂ 31යි.

**ගරු විපක්ෂ නායක සුසිල් මුණසිංහ මැතිතුමා**

ශීර්ෂයන් ගැන අපි තර්ක කරන්නේ නැහැ. අපි දැන ගන්න ඕනෑ කොහොමද මේ සල්ලි බෙදන්න යන්නේ කියලා. යම්කිසි යෝජනා තියෙනවාද ? යම්කිසි සැලැස්මවල් තියෙනවාද ? අන්න ඒකයි අපිට දැන ගන්න ඕනෑ. දැන් නොවෙයි. අපි කියන්නේ එය සභාවට ඉදිරිපත් කරන්න කියලා.

**ගරු ප්‍රධාන අමාත්‍ය චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය**

ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම ඒ පිළිබඳ විස්තර මේ දක්වා මෙම සභාවට මම දන්න තරමින් ඉදිරිපත් කරලා නැහැ. නමුත් මම ඉදිරිපත් කරන්න සූදානම්. දැනටමත් සැලැස්මවල් නැතුව සාමාන්‍යයෙන් මගේ මුදල් අමාත්‍යාංශයේ කිසිම වැඩක් කරලා නැහැ. සත 05ක් වත් වියදම් කරලා නැහැ. විපක්ෂ නායකතුමාට මම ඉතාම සන්තෝසයෙන් එය ප්‍රකාශ කළ යුතුයි. මේ සියළුම මුදල්වලට සැළසුම් කරලා දැන් මාස ගණනාවක් වෙනවා. අපේ අමාත්‍යාංශයෙන් රේඛීය අමාත්‍යාංශයට ඉදිරිපත් කරපු, ක්‍රමය ඒකයි. මින් වැඩි හරියක් මධ්‍ය කාලීන ආයෝජන මුදල්. රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගෙන දැන් ඒවා ක්‍රියාත්මක කරවන්න ආරම්භ කරලා ඉවරයි. මේ වර්ෂය අවසන් වෙන්නට ඉස්සෙල්ලා සම්පූර්ණ වැඩ අපි නිම කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ එක්කම මා සඳහන් කළ යුතුයි මෙතෙක් අධ්‍යාපන අමාත්‍යාංශයේ මධ්‍යකාලීන ආයෝජන මුදල්වලින් ලැබුණ මුදල්වලින් හැම වර්ෂයකම අඩු තරමින් 30%ක් වියදම් නොකර ආපසු දීලා තියෙනවා. මේ වර්ෂයේ එක සත 05ක්වත් ආපසු යවන්නේ නැතුව බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපනය නංවාලීමට පාවිච්චි කරන්න බලාපොරොත්තු වෙන බව කියමින් මම නිහඬ වෙනවා.